# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# 2017

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## දැක්ම

උසස් අධ්‍යාපන, අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන්හි ජාත්‍යන්තර පිළිගැනීමකින් යුත් මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

තිරසාර සංවර්ධනය සඳහා දායක විය හැකි දැනුම, කුසලතා හා ආකල්පවලින් පිරිපුන් ශක්නුවත් මානව සම්පත් බිහිකිරීම පිණිස ඉගෙනුම්, පර්යේෂණ හා පුහුණු කාර්යයන් ප්‍රවර්ධනය කරමින්, දැනුම උත්පාදන කිරීමේ, වර්ධනය කිරීමේ හා බෙදාහැරීමේ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් බවට පත් වීම

## අරමුණු

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත් වීම

රටේ සංවර්ධන අවශ්‍යතාවයන්ට සරිලන උපාධිධාරින් බිහි කිරීම

කාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂ සංවර්ධනය

ජාත්‍යන්තර කීර්තිය ලත් කලාපීය පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් බවට පත් වීම

ජාතික අදාළත්වයකින් යුත් ක්ෂේත්‍රවලට අදාළව අඛණ්ඩ වෘත්තීය වැඩසටහන් වැඩිදියුණු කිරීම

කලාපය තුළ ජන ජීවිතවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## උපකුලපතිතුමාගේ සමාලෝචනය – 2017



කොළඹ සිට කි.මී. 162 ක් දුරින්, කොළඹ බදුල්ල A4 මහා මාර්ගයේ බෙලිහුල්ඔය නගරයට ආසන්නව පඹහින්න මංසන්ධියෙන් හැරී යන විට පිහිටා ඇති ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දළ වශයෙන් අක්කර 199ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්තය.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස සිය 21 වන වර්ෂ පූර්ණය සමරනු ලැබුවේ 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේදී ය. මේ වන විට විශ්වවිද්‍යාලය පීඨ හයකින් (06) සමන්විත වේ. ඒවා නම්; පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කෘෂි විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, භූ විඥාපන පීඨය, කළමනාකරණ අධ්‍යයන පීඨය සහ සමාජීය විද්‍යා හා භාෂා පීඨය යි. මීට අමතරව 2017 වර්ෂයේ දී තාක්ෂණ පීඨය පිහිටුවන ලද අතර, වෛද්‍ය පීඨය 2019 වර්ෂයේදී පිහිටවනු ලැබීය. වෛද්‍ය පීඨය රත්නපුර කුරුවිට ප්‍රදේශයේ පිහිටුවන ලද අතර තාක්ෂණ පීඨය බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රයේ පිහිටුවනු ලැබීය.

2017 වර්ෂයේදී භූ විඥාපන පීඨයේ II වන අදියර නිම කරන ලද අතර, සිංහරාජ VI ශිෂ්‍ය නේවාසිකාගාරයේ (පිරිමි) හා වලව C නේවාසිකාගාරයේ (කාන්තා) ඉදිකිරීම් කටයුතු ද නිම කරන ලදී. ප්‍රධාන පුස්තකාල පරිශ්‍රයේ හා කාර්යමණ්ඩල නිල නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු ඇරඹීමට හැකිවීම ද පසුගිය වසරේ විශ්වවිද්‍යාලය අත් කර ගත් ජයග්‍රහණයන් ලෙස සැලකිය හැක. තවද, අපජලය හා මළද්‍රව්‍ය පිරිපහදු ඒකකය සැකසීමට, ව්‍යවහාරික විද්‍යා පීඨයේ II වන අදියර- I කොටස සඳහා යෝජිත පීඨ ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට හා වලව නේවාසිකාගාර සංකීර්ණය සඳහා ආපනශාලාවක් ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා අමාත්‍ය මණ්ඩලය මගින් අනුමත කර එමෙන්ම, කළමනාකරණ අධ්‍යයන පීඨයේ III වන අදියර- II කොටස, කෘෂි විද්‍යා පීඨය - I කොටස හා සමාජීය විද්‍යා හා භාෂා පීඨය-III කොටස ඉදිකිරීම්වලට අදාළ සංකල්ප පත්‍රිකා ද යොමු කර ඇත.

2017 වර්ෂයේදී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව දළ වශයෙන් 5250ක් පමණ විය. එම වර්ෂයේදී විශ්වවිද්‍යාලයට බඳවාගත් අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව 1304ක් වූ අතර, පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන් 154 දෙනෙකු බඳවාගනු ලැබිණි. ඊට අමතරව, විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මගින් පවත්වනු ලබන පාඨමාලා සඳහා සිසුන් 1156 දෙනෙකු ලියාපදිංචි වී තිබේ. 2016 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය 2018.01.25 දින පවත්වන ලද අතර, එහිදී සිසුන් 831 දෙනෙකු වෙත ප්‍රථම උපාධි ද සිසුන් 11 දෙනෙකු වෙත පශ්චාද් උපාධි ද ප්‍රදානය කරන ලදී. 2019 උපාධි ප්‍රදානෝත්සවය 2019.01.10 දින පවත්වනු ලැබියග

ශිෂ්‍ය ප්‍රජාව මෙන්ම කාර්ය මණ්ඩලය සඳහා ද සුභසාධන හා විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලය අවධානය යොමු කර තිබේ. ඒ අනුව, අභ්‍යන්තර සිසුන්ගෙන් 93.3%ක් සඳහා විශ්වවිද්‍යාලය මගින් නේවාසික පහසුකම් සපයා දී ඇත. අධ්‍යයන කටයුතු සඳහා අන්තර්ජාල (wifi) පහසුකම් ලබා දීම මගින් ශිෂ්‍ය සුභසාධන පහසුකම් වැඩිදියුණු කිරීමට ද කටයුතු යොදා ඇත. විශ්වවිද්‍යාලයේ දැනට පවතින සම්පත් උපයෝගී කර ගනිමින් අධ්‍යයන, පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ද හැකි පමණින් නේවාසික පහසුකම් සලසා දී තිබේ. නේවාසික පහසුකම් ලබා දීමේ හැකියාව වර්ධනය කරලනු පිණිස නව නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබේ.

විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා සිසුන්ට හා අධ්‍යයන කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීමට ද විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. 2017 වර්ෂයේදී කෘෂි විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා කළමනාකරණ අධ්‍යයන පීඨය මගින් ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ හයක් සංවිධානය කරන ලදී. ඊට අමතරව, අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකුට විදේශීය පර්යේෂණ සමුළුවලදී සිය පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය විශ්වවිද්‍යාලය මගින් සපයා දී තිබේ.

දැඩි අභිප්‍රේරණයකින් යුතුව සේවය කරන කුසලතා පූර්ණ මානව සම්පත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ශක්තියක් ලෙස හඳුන්වා දිය හැක. විශ්වවිද්‍යාලයේ සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 250ක් පමණ වන අතර, පරිපාලන හා විධායක කාර්ය මණ්ඩලය 21 දෙනෙකුගෙන් ද, අධ්‍යයන සහායක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 21 දෙනෙකු හා 376 දෙනෙකුගෙන් ද සමන්විත වේ. කාර්ය මණ්ඩලයේ කුසලතා සංවර්ධනය සඳහා 2017 වසරේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මගින් විවිධ මාතෘකා යටතේ පුහුණු පාඨමාලා 11ක් සංවිධානය කරන ලද අතර කාර්ය මණ්ඩල සාමාජිකයන් 272 දෙනෙකු ඒවාට සහභාගී වූහ. ඊට අමතරව, විවිධ වැඩ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලබා දීමේ අරමුණින්, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත විදේශ පුහුණු අවස්ථා සැලසීමට ද 2017 වසරේදී විශ්වවිද්‍යාලය පියවර ගෙන තිබේ.

2017 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික හා ප්‍රතීතන කවුන්සලය මගින් සිදු කරන ලද පාඨමාලා සමාලෝචනයේදී, ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සියලුම පාඨමාලා සඳහා විශිෂ්ඨ සාමාර්ථ (A) ලබා ගත් එකම කලා පීඨය බවට පත් වෙමින්, සමාජීය විද්‍යා හා භාෂා පීඨය විසින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය උපාධි හා ගෞරව උපාධි වැඩසටහන් සඳහා විශිෂ්ඨ සාමාර්ථ (A) හිමි කර ගත් බව ද මෙහිදී ඉතා සතුටින් සිහිපත් කරමි.

**මහාචාර්ය එම්. සුනිල් ශාන්ත**
**උපකුලපති**

# පටුන


01. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය 7
1.1 විශ්වවිද්‍යාලයේ ඉතිහාසය 7
1.2 හැඳින්වීම 7
1.3 කුලපති 8
1.4 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් 8
1.5 පාලක සභාව 9
1.6 සනාතන සභාව 10
02. විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන පීඨයන් 12
2.1 පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 12
2.2 කෘෂි විද්‍යා පීඨය 13
2.3 ව්‍යවහාරික විද්‍යා පීඨය 15
2.4 භූ විඥාපන පීඨය 20
2.5. කළමනාකරණ අධ්‍යයන පීඨය 21
2.6 සමාජීය විද්‍යා හා භාෂා පීඨය 24
03. අධ්‍යයන සම්පත් 26
3.1 පුස්තකාලය 26
3.2 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය 27
3.3 ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය 33
04. අධ්‍යයන මධ්‍යස්ථාන 36
4.1 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 36
4.2 විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය 38
4.3 ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය 40
4.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 41
05. ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව -දේශීය සිසුන් 44
5.1 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් 44
5.2 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 46
06. ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - විදේශීය සිසුන් 49
6.1 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් - විදේශීය සිසුන් 49
6.2 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි මුළු විදේශීය සිසුන් සංඛ්‍යාව 49
07. පශ්චාද් උපාධි සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 50
7.1 පශ්චාද් උපාධි සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - දේශීය සිසුන් 50
08. විභාග පිළිබඳ විස්තර 51
8.1 ප්‍රථම උපාධි පිළිබඳ විස්තර - අභ්‍යන්තර සිසුන් 51
8.2 පශ්චාද් උපාධි පිළිබඳ විස්තර 51
8.3 වෙනත් පාඨමාලා පිළිබඳ විස්තර 52
09. මානව සම්පත් පිළිබඳ විස්තර 53
9.1 අනුමත සේවක සංඛ්‍යාව හා දැනට සිටින කාර්ය මණ්ඩලය 53
9.2 අනුමත සේවක සංඛ්‍යාව හා දැනට සිටින කාර්ය මණ්ඩලය- අධ්‍යයන කාර්ය මණ්ඩලය 55
9.3 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළම සුදුසුකම් 59
9.4 ප්‍රථම උපාධි/ පශ්චාද් උපාධි ඉගැන්වීම් කටයුතු/ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ/වැඩමුළු සඳහා 2017 වර්ෂයේදී විශ්වවිද්‍යාලයට පැමිණි අන්තර්ජාතික කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු 60
9.5 විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළ ලබා ගත් විදේශ ශිෂ්‍යත්ව, සහෘදත්ව හා පුහුණු වැඩසටහන් 61
9.6 2017 වර්ෂය තුළ පශ්චාද් උපාධි පාඨමාලා (දේශීය හා විදේශීය) සඳහා ලියාපදිංචි වූ අධ්‍යයන, පරිපාලන හා අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු 62
10. පර්යේෂණ පිළිබඳ විස්තර 64
10.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් 2017 වර්ෂය තුළ සිදු කළ ප්‍රකාශන සංඛ්‍යාව 64
10.2 නිර්දේශිත සුවිගත වාර සඟරාවල පළ කළ ප්‍රකාශන ලැයිස්තුව 67

10.3 2017 වර්ෂය තුළ පොදුවේ මහ ජනතාව වෙත දැනුම බෙදාහැරීම පිළිබඳ තොරතුරු 71
10.4 2017 වර්ෂයේ දී ලද ජාතික හා අන්තර්ජාතික සම්මාන 74
11. නේවාසිකාගාර පිළිබඳ විස්තර - 2017 වර්ෂය 77
11.1 2017 වර්ෂය තුළ නේවාසිකාගාර පහසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව - පීඨ පදනමින් 77
11.2 ස්ථිර නේවාසිකාගාර 78
11.3 කුලී පදනමින් ලබා ගත් නේවාසිකාගාර 79
12. මහපොල ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර 81
12.1 2017 වර්ෂයේදී මහපොල ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 81
13. වාර්ෂික ගිණුම් -2017 වර්ෂය 84
14. විගණකාධිපති වාර්තාව - 2017 123
15. විගණකාධිපති වාර්තාවට පිළිතුරු - 2017 140

# 01. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## 1.1 විශ්වවිද්‍යාලයේ ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉතිහාසය 1991 වර්ෂය තෙක් දිව යන්නකි. 1991 දී අනුබද්ධ විශ්වවිද්‍යාලයක් ලෙස බෙලිහුල්ඔය ප්‍රදේශයේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාවේ අනුබද්ධ විශ්වවිද්‍යාල ප්‍රතිව්‍යුහගත කිරීමේ හැකියාව විමසා බැලීම පිණිස 1995 වර්ෂයේදී ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ මත ජාතික විශ්වවිද්‍යාලයක් බවට පත් කරන ලද්දේ එවකට රහංගල හා බුත්තල ප්‍රදේශයන්හි පැවති අනුබද්ධ විශ්වවිද්‍යාල ද සබරගමුව විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධ කරමිනි. ඒ අනුව, රහංගල හා බුත්තල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල සබරගමුව විශ්වවිද්‍යාලයේ ඌව මණ්ඩපය ලෙස නම් කරන ලදී. මෙසේ ඒකාබද්ධ කිරීමට පෙර, බෙලිහුල්ඔය හා බුත්තල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ ද, රහංගල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාලය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ ද අනුබද්ධ ව පැවතිණි. මෙසේ අනුබද්ධ විශ්වවිද්‍යාල තුනක් ඒකාබද්ධ කොට පිහිටුවනු ලැබූ සබරගමුව විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස 1996 පෙබරවාරි 2 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

රහංගල හා බුත්තල පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාල පසුව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය හා ව්‍යවහාරික විද්‍යා පීඨය බවට පත් වූ අතර, ඒවා පිළිවෙලින් 2001 වර්ෂයේ දී හා 2008 වර්ෂයේ දී බෙලිහුල්ඔය පිහිටි විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පරිශ්‍රය වෙත ගෙන එන ලදී.

## 1.2 හැඳින්වීම

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, කොළඹ සිට කි.මී. 160 ක් පමණ දුරින් කොළඹ - බදුල්ල මහා මාර්ගයේ සිට සමනළවැව ජලාශය හරහා දිවෙන මාර්ගයේ වම් පස පිහිටා ඇත. විශ්වවිද්‍යාලය අධ්‍යයන පීඨ හයකින් (06) සමන්විත ය. ඒවා නම්:



- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
- කෘෂි විද්‍යා පීඨය
- ව්‍යවහාරික විද්‍යා පීඨය
- භූ විඥාපන පීඨය
- කළමනාකරණ අධ්‍යයන පීඨය සහ
- සමාජීය විද්‍යා හා භාෂා පීඨය යි.

මෙම පීඨවලට අමතරව විශ්වවිද්‍යාලය යටතේ පහත අධ්‍යයන මධ්‍යස්ථාන දහය ද ක්‍රියාත්මක වේ.

- පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය
- කෘෂි ව්‍යාපාර සමීක්ෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (ABRDS)
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
- විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
- ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය
- පර්යේෂණ හා දැනුම ව්‍යාප්ත කිරීමේ මධ්‍යස්ථානය
- සබරගමුව විශ්වවිද්‍යාලීය කාර්මික-ප්‍රජා අන්තර් ක්‍රියාකාරී කමිටුව
- ජෛව විවිධත්ව හා පාරිසරික අධ්‍යයන කේන්ද්‍රය
- විශ්වවිද්‍යාලයීය කෞතුකාගාරය

2017 වර්ෂයේදී අධ්‍යයන පීඨ පහ මගින් උපාධි අපේක්ෂකයින් 5250ක පමණ සංඛ්‍යාවක් සඳහා සමාසික/ පාඨමාලා ඒකක අධ්‍යයන ක්‍රමය මත පදනම් වූ ශාස්ත්‍රවේදී/විද්‍යාවේදී උපාධි පාඨමාලා තිස් තුනක් පවත්වනු ලැබිය. විශ්වවිද්‍යාලය සඳහා වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 1304ක් පමණ වේ. ව්‍යවහාරික විද්‍යා පීඨය සහ සමාජීය විද්‍යා හා භාෂා පීඨය මගින් පවත්වනු ලබන ඇතැම් තුන් අවුරුදු පාඨමාලා හැරුණු විට අන් සියල්ල සිව් අවුරුදු පාඨමාලා වේ. සියලු විද්‍යාවේදී පාඨමාලා සඳහා ඉගැන්වීමේ මාධ්‍යය ඉංග්‍රීසි භාෂාවයි. කෙසේවුවද අවස්ථානුකූලව, සිංහල හා දෙමළ මාධ්‍යවලින්ද පාඨමාලා උපදෙස් ලබා දෙමින් උපාධි අපේක්ෂකයන්ට සහාය වීමට කථිකාචාර්යවරු උත්සාහ ගනිති. සබරගමුව විශ්වවිද්‍යාලයෙහි උපාධි පාඨමාලා හදාරනු ලබන සිසු සිසුවියන්ට සිය උපාධි පාඨමාලාවට අදාළ ප්‍රධාන හා අනු විෂයයන් හදාරන අතරතුර, තම පීඨය තුළ ඇති වෙනත් අධ්‍යයනාංශයකින් පවා වෛකල්පිත පාඨමාලාවන් ද (අන්තර් අධ්‍යයනාංශ පාඨමාලා) තෝරා ගැනීමේ හැකියාව පවතී.

## 1.3 කුලපති

මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර ස්වාමීන්වහන්සේ

## 1.4 විශ්වවිද්‍යාලයේ නිලධාරීන්

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 33 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි විශ්වවිද්‍යාලයෙහි නිලධාරීන් පහත පරිදි වේ.

**උපකුලපති**

මහාචාර්ය එම්. සුනිල් ශාන්ත, BA Hons (USJP), MA in Economics (USJP)], PhD (Colombo) *(2017.05.19 සිට)*

මහාචාර්ය චන්දන පී. උඩවත්ත, BSc (PDN), MPhil (PDN), PhD (PDN)
රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය *(2017.05.18 දක්වා)*

**පීඨාධිපතිවරු**

**පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**
ආචාර්ය කේ.එම්.එම්.අයි. රත්නායක, BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (UUM Malaysia), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය

**පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය**
ආචාර්ය එච්.එස්.ආර්. රොසයිරෝ, MBA (Uni of Colombo), Ph.D (Lincon Uni., New Zealand)

**පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය**
මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක, B.Sc. (Sp.) Hons. in Agriculture (URUH) M.Sc. in Biotechnology (UPDN) Ph.D. (AIT) Thailand

**පීඨාධිපති, භූ විඥාපන පීඨය**
ආචාර්ය එච්.එම්.අයි. ප්‍රසන්න, BSc (Hons.) Surveying Sciences, SUSL, MPhil (Geodesy), SJP, PhD (Geodesy), The Polytechnic University, Hong Kong

**පීඨාධිපති, කළමණාකරන අධ්‍යයන පීඨය**
මහාචාර්ය ඩබ්.කේ.ඒ.සී. ඥානපාල, BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen-P R China), සංචාරක කළමනාකරණය පිළිබඳ මහාචාර්ය *(2017.09.12 සිට)*

මහාචාර්ය ආර්.එම්.ඩබ්. රත්නායක, BSc (Sp) Botany (KLN), MSc (SJP), PhD (SJP) PG Dip Wildlife Management (India), Diploma in Mass Media (Sri Lanka Media Foundation),
පාරිසරික කළමනාකරණය පිළිබඳ මහාචාර්ය *(2017.09.11 දක්වා)*

**පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය**
ආචාර්ය ඩබ්. මනෝජ් ආරියරත්න, BA Hons (USJP), MA (USJP), PhD (Pune)

## 1.5 පාලක සභාව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 44 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි විශ්වවිද්‍යාලයෙහි පාලන අධිකාරිය වන විශ්වවිද්‍යාල පාලක සභාව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය.

**නිල බලයෙන් පත්වූ සාමාජිකයින්**

| | |
|---|---|
| මහාචාර්ය එම්. සුනිල් ශාන්ත | උපකුලපති - සභාපති (2017.05.19 සිට) |
| මහාචාර්ය චන්දන පී. උඩවත්ත | උපකුලපති - සභාපති (2017.05.18 දක්වා) |
| ආචාර්ය කේ.එම්.එම්.අයි. රත්නායක | පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය |
| ආචාර්ය එච්.එස්.ආර්. රොසයිරෝ | පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය |
| ආචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක | පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය එච්.එම්.අයි. ප්‍රසන්න | පීඨාධිපති, භූ විඥාපන පීඨය |
| මහාචාර්ය ඩබ්.කේ.ඒ.සී. ඥානපාල | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය (2017.09.12 සිට) |
| මහාචාර්ය ආර්.එම්.ඩබ්. රත්නායක | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය (2017.09.11 දක්වා) |
| ආචාර්ය ඩබ්. මනෝජ් ආරියරත්න | පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය |

**සනාතන සභා නියෝජිතයින්**

| | |
|---|---|
| ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය ජී.එස්.එන්. පෙරේරා | භූ විඥාපන පීඨය |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කළ නියෝජිතයින්**

| | |
|---|---|
| පූජ්‍ය කරන්ගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති මහා නායක ස්වාමීන් වහන්සේ | හිටපු අධ්‍යාපන අධ්‍යක්ෂ |
| මහාචාර්ය එම්.යූ. ජයසේකර | හිටපු පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| පියතිස්ස රණසිංහ මයා | හිටපු ලේකම්, තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශය, කොළඹ 01 |
| එච්.ඩබ්. ගුණදාස මයා | අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ ජනාධිපති කොමසාරිස් |
| වෛද්‍ය රවින්ද්‍ර ජයසේකර | හිටපු අධ්‍යක්ෂ, වැලිසර ලය රෝහල |
| එන්.එස්.පී.එම්. රංජිත් මයා | අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| මහාචාර්ය කේ.බී. පලිපාන මයා | හිටපු පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ඩැනී අතපත්තු | |
| ඊ.ඒ. වජිර දිසානායක මයා | එල්.එල්.බී. (කොළඹ), නීතිඥ, නොතාරිස් හා සමාගම් ලේකම් |
| ආචාර්ය එච්.එම්.එල්.එම්. හේරත් මෙය | |

**පාලක සභා ලේකම්**

| | |
|---|---|
| එම්.එෆ්. හිබතුල් කරීම් මයා | ලේඛකාධිකාරි (2017.11.14 දක්වා) |
| කමල් ගුණවර්ධන මයා | වැ.බ. ලේඛකාධිකාරි (2017.11.15 සිට) |

2017 වර්ෂය තුළ පාලක සභා රැස්වීම් 12 ක් පවත්වා ඇත.

## 1.6 සනාතන සභාව

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතෙහි (සංශෝධිත) 46 වගන්තිය මගින් නියම කර ඇති පරිදි, විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන බල මණ්ඩලය වන විශ්වවිද්‍යාල සනාතන සභාව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය.

**සභාපති**

| | |
|---|---|
| මහාචාර්ය එම්. සුනිල් ශාන්ත | උපකුලපති<br>(2017.05.19 සිට) |
| මහාචාර්ය චන්දන පී. උඩවත්ත | උපකුලපති<br>(2017.05.18 දක්වා) |

**සනාතන සභා සාමාජිකයින්**

| | |
|---|---|
| ආචාර්ය කේ.එම්.එම්.අයි. රත්නායක | පීඨාධිපති, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය |
| ආචාර්ය එච්.එස්.ආර්. රොසයිරෝ | පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය |
| ආචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක | පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය එච්.එම්.අයි. ප්‍රසන්න | පීඨාධිපති, භූ විඥාපන පීඨය |
| මහාචාර්ය ඩබ්.කේ.ඒ.සී. ඥානපාල | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය (2017.09.12 සිට) |
| මහාචාර්ය ආර්.එම්.ඩබ්. රත්නායක | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය (2017.09.11 දක්වා) |
| ආචාර්ය ඩබ්. මනෝජ් ආරියරත්න | පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය |
| මහාචාර්ය සී.පී. උඩවත්ත | මහාචාර්ය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය ඒ.ඒ.වයි. අමරසිංහ | මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය |
| මහාචාර්ය ආර්.එම්.ඩබ්. රත්නායක | මහාචාර්ය, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය ලාල් පී. විදාන ආරච්චි | මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය |
| මහාචාර්ය ඩී.එම්.ඒ. ගුණරත්න | මහාචාර්ය,සත්ව නිෂ්පාදන අධ්‍යයනාංශය |
| මහාචාර්ය පී.එම්.ඒ.එස්. කරුණාරත්න | මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය |
| මහාචාර්ය ඩී.ඒ.එම්. ද සිල්වා | මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය පී.අයි. යාපා | මහාචාර්ය, කෘෂි අපනයන අධ්‍යයනාංශය |
| මහාචාර්ය එම්. ඒෂාම් | මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය එස්.කේ. ගුණතිලක මිය | මහාචාර්ය, ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය |
| මහාචාර්ය ජේ.එම්.සී.කේ. ජයවර්ධන මිය | මහාචාර්ය, ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය |
| මහාචාර්ය එම්.එන්. වික්‍රමරත්න මිය | මහාචාර්ය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය |
| ටී.එන්. නෙයිසූරි මිය | පුස්තකාලයාධිපතිනිය |
| ආචාර්ය එස්.ටී.සී. අමරසිංහ මිය | අංශ ප්‍රධාන, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ආචාර්ය පී.කේ. දිසානායක | අංශ ප්‍රධාන, කෘෂි අපනයන අධ්‍යයනාංශය |
| ආචාර්ය එම්.ඒ.ජේ.පී. මුණසිංහ | අංශ ප්‍රධාන, සත්ව නිෂ්පාදන අධ්‍යයනාංශය |
| ඒ.එල්.සී.ජේ. ලියනගේ මයා | අංශ ප්‍රධාන, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය |
| ආචාර්ය බී.ටී.ජී.එස්. කුමාර | අංශ ප්‍රධාන, ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය |
| ආචාර්ය ටී.එස්.එච්. පෙරේරා මිය | අංශ ප්‍රධාන, ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය |
| ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර | අංශ ප්‍රධාන, ස්වභාවික සම්පත් අධ්‍යනාංශය |
| මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු | අංශ ප්‍රධාන, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය |

| | |
|---|---|
| ආචාර්ය ජී.එස්.එන්.පෙරේරා | අංශ ප්‍රධාන, දුරස්ථග්‍රහණ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය |
| ආචාර්ය ඩී.ආර්. වැලිකන්න | අංශ ප්‍රධාන, මැනුම් හා භූ මිතික අධ්‍යයනාංශය |
| පී.ජේ. ජයතිලක මයා | අංශ ප්‍රධාන, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය |
| ඩී. ජාසිංහ මයා | අංශ ප්‍රධාන, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න | අංශ ප්‍රධාන, ගණකාධිකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය |
| ආචාර්ය ආර්.එස්.එස්.ඩබ්. ආරච්චි | අංශ ප්‍රධාන, සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය |
| මහාචාර්ය එච්.එම්.එස්. ප්‍රියනාත් | |
| ආචාර්ය කේ පී එල් නිශාන්ත | අංශ ප්‍රධාන, භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය |
| ආචාර්ය ඒ.එස්. ආනන්ද | අංශ ප්‍රධාන, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය |
| ආර්.ජී.එස්. රත්නායක | 2018.01.18 සිට වැ.බ. අංශ ප්‍රධානී |
| ආර් ඩබ්.එම්.පී.ජී.අයි. වීරකෝන් මිය | අංශ ප්‍රධාන, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශය |

**පීඨ නියෝජිතයින්**

| | |
|---|---|
| ආචාර්ය ආර්.කේ. මුතුකුමාරණ | කෘෂි විද්‍යා පීඨය |
| ආචාර්ය එම්.එල්.එම්.සී. දිසානායක | කෘෂි විද්‍යා පීඨය |
| ආචාර්ය එස්. වසන්තප්‍රියන් | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය සී.එච්. බදුරලිය | ව්‍යවහාරික විද්‍යා පීඨය |
| ආචාර්ය එච්.ඒ. නාලිනී | භූ විඥාපන පීඨය |
| ආචාර්ය එච්.ආර්.එස්. බණ්ඩාර | භූ විඥාපන පීඨය |
| ඩී.ජී. ධර්මරත්න මයා | කළමනාකරණ අධ්‍යයන පීඨය |
| ආචාර්ය එම්.එස්.එම්. අස්ලාම් | කළමනාකරණ අධ්‍යයන පීඨය |
| ආචාර්ය එස්.එස්.ඒ. සෙනෙවිරත්න | සමාජීය විද්‍යා හා භාෂා පීඨය |
| එස්. කේ. හඳරාගම මයා | සමාජීය විද්‍යා හා භාෂා පීඨය |

**ආරාධිත සාමාජිකයින්**

| | |
|---|---|
| ආර්.වී.එස්.පී.කේ. රණතුංග මයා | අධ්‍යක්ෂ/පරිසනක අධ්‍යයන මධ්‍යස්ථානය |
| ඩී. ජාසිංහ මයා | අධ්‍යක්ෂ/විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය |
| ආචාර්ය ඒ.ඩී. අම්පිටියාවත්ත | සම්බන්ධීකාරක/ තාක්ෂණ පීඨය |

**සනාතන සභා ලේකම්**

| | |
|---|---|
| එම්.එෆ්. හිබතුල් කරීම් මයා | ලේඛකාධිකාරි සහ සනාතන සභා ලේකම් (2017.11.14 දක්වා) |
| කමල් ගුණවර්ධන මයා | වැ.බ. ලේඛකාධිකාරි සහ සනාතන සභා ලේකම් (2017.11.15 සිට) |

2017 වර්ෂය තුළ සනාතන සභා රැස්වීම් 12 ක් පවත්වා ඇත.

# 02. විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන පීඨයන්

## 2.1 පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

### 2.1.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය මගින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හරහා පශ්චාද් උපාධි පිරිනැමීම සිදු කරනු ලබයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 09 වන දින පවත්වන ලද 928 වන රැස්වීමේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය පිහිටුවීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් කෘෂි විද්‍යා, පරිගණක හා තොරතුරු පද්ධති, භූ විඥාපන, මානව ශාස්ත්‍ර, කළමනාකරණ, භෞතීය විද්‍යා හා ස්වභාවික විද්‍යා, සමාජීය විද්‍යා, ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපනය යනාදී ක්ෂේත්‍ර ගණනාවකට අදාළව පශ්චාද් උපාධි පිරිනමනු ලබයි. ශිෂ්‍යයන්ගේ වෘත්තීය සංවර්ධනය පමණක් නොව නව දැක්මකින් යුතුව ගෝලීය අභියෝගයන්ට විසඳුම් සෙවීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය ද ඉලක්ක කර ගත්, පර්යේෂණ පදනම් කරගත් පුළුල් දැනුම් සම්භාරයක් ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයන් වෙත ප්‍රදානය කෙරේ.

වර්තමානය වන විට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පශ්චාද් උපාධි පාඨමාලා තුනක් සහ පර්යේෂණ උපාධි පාඨමාලා (දර්ශනශූරි හා දර්ශනපති උපාධි) පිරිනමනු ලබයි. මේ වන විට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 154ක් වන අතර, සිසුන් 100-120 අතර ප්‍රමාණයක් 2018 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට අයදුම් කර ඇත.

දේශීය හා ජාත්‍යන්තර සංවර්ධන අභියෝගවලට මුහුණ දීමට සමත් පශ්චාද් උපාධි සුදුසුකම් සහිත උපාධිධරයන් බිහි කිරීම පිණිස, ගුණාත්මක ඉගැන්වීම් හා පර්යේෂණ පුහුණු කටයුතු හරහා අධ්‍යයන පාඨමාලා සඵලදායීවත් කාර්යක්ෂමවත් පැවැත්වීමට පහසුකම් හා අවස්ථාව සැලසීම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අරමුණ යි.

### 2.1.2 පීඨ කළමනාකරණය

| | |
|---|---|
| පීඨාධිපති | ආචාර්ය ඉරාජ් රත්නායක, BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (UUM Malaysia), Senior Lecturer Grade I |

### 2.1.3 පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා

1 ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව
2 ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
3 ව්‍යාපාර පරිපාලනපති උපාධිය
4 මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය
5 පර්යේෂණ උපාධි වැඩසටහන්

## 2.2 කෘෂි විද්‍යා පීඨය

### 2.2.1 ඉතිහාසය

1995 වර්ෂයේදී පළමුවෙන්ම රහංගල පිහිටවනු ලැබූ සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පීඨය 2001 වර්ෂයේ දී බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රය වෙත ගෙන එන ලදී. 2001 වර්ෂයේ සිට පීඨයේ අධ්‍යයන කටයුතු ඉතා සීමිත පහසුකම් යටතේ බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ලදී. 2005 වර්ෂයේ දී යටිතල පහසුකම් හා අධ්‍යයන කටයුතු දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 82.5 ක ප්‍රදානයක් ලෝක බැංකුව වෙතින් ලබා ගැනීමට පීඨය සමත් වූ අතර එමගින් අවශ්‍යතා බොහොමයක් සපුරා ගැනීමට හැකි විය. පරිපූර්ණ විෂයමාලා සංශෝධනයක් ද සිදු කරන ලද අතර, කෘෂි විද්‍යා හා කළමනාකරණ උපාධිය ලෙස උපාධි පාඨමාලා නාමය ද වෙනස් කරන ලදී.

### 2.2.2 පීඨ කළමනාකරණය

| | | |
|---|---|---|
| **පීඨාධිපති** | - | ආචාර්ය එච්.එස්.ආර්. රොසයිරෝ |
| **අධ්‍යනාංශ ප්‍රධානීන්** | | |
| කෘෂි ව්‍යාපාර කළමණාකරන අධ්‍යයනාංශය | - | ආචාර්ය එස්.ටී.සී අමරසිංහ මිය |
| කෘෂි අපනයන අධ්‍යයනාංශය | - | ආචාර්ය පී.කේ. දිසානායක |
| සත්ව නිෂ්පාදන අධ්‍යයනාංශය | - | ආචාර්ය එම්.ඒ.ජේ.පී. මුණසිංහ |

### 2.2.3 පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා

කෘෂි ව්‍යාපාර කළමනාකරණ, කෘෂි අපනයන සහ පශු සම්පත් නිෂ්පාදන යන අධ්‍යයනාංශ තුනෙන් කෘෂි විද්‍යා පීඨය සමන්විත වේ. කෘෂි අපනයන අධ්‍යයනාංශය මගින් වැවිලි කර්මාන්තය සහ උද්‍යාන අලංකරණය ලෙස අධ්‍යයන මොඩියුල දෙකක් පිරිනමනු ලබයි. ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයන් අතුරින් පළමුවරට කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන විෂයයට අදාළ උපාධියක් ලබා දීම ආරම්භ කරන ලද්දේ සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය යි.

පළමු සමාසික 4 තුළ (එනම් පළමු වසර දෙක තුළ) සිසුන් විසින් කෘෂිකර්මය පිළිබඳ සාමාන්‍ය අධ්‍යයන කටයුතු සඳහා අදාළ හර විෂයයන් හැදෑරිය යුතු අතර තුන්වන වර්ෂයේ සමාසික දෙක තුළ වැවිලි කර්මාන්තය/උද්‍යාන අලංකරණය/ පශු සම්පත් නිෂ්පාදන/ කෘෂි ව්‍යාපාර කළමනාකරණය යන විශේෂීකරණ විෂයයන්ගෙන් එක් විෂයයක් හැදෑරිය යුතුය. දෙවන අධ්‍යයන වර්ෂය අවසානයේ දී සිසුන් විසින් තමාගේ රුචිකත්වය අනුව තමන්ගේ විශේෂවේදී අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගත යුතුය. ගොවිපල ප්‍රායෝගික පුහුණු වීම්, පරිඝනක විද්‍යාව සහ ඉංග්‍රීසි යන පාඨමාලා පළමු වර්ෂ තුන තුළ පිරිනමනු ලබන අතර උපාධිය සම්පූර්ණ කිරීම සඳහා සිසුන් විසින් ඒ ඒ විෂයයන් පිළිබඳව ඒ ඒ සමාසික තුළ සතුටුදායක ශ්‍රේණි ලබාගත යුතුය. ඊට අමතරව අවසාන වසරේ දී වෛකල්පිත පාඨමාලා පිරිනමනු ලබන අතර සිසුන්ට තමාගේ මනාපය පරිදි ඉන් පාඨමාලා හතරක් අවසන් වසරේ (සිව්වන වසරේ) පළමු සමාසිකය තුළ තෝරා ගත හැක. උපාධි පාඨමාලාවේ අත්‍යාවශ්‍ය හා විශේෂිත අංගයක් වන ආයතනික/ කර්මාන්ත පුහුණුව සඳහා අවසාන වසරේ අවසාන සමාසිකය වෙන් කොට ඇති අතර සිසුන් එම කාලය තුළ තමා විශේෂීකරණය වූ විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණයක් කළයුතුය. උපාධි පාඨමාලාවට අදාළ ඉගැන්වීම් මාධ්‍යය වනුයේ ඉංග්‍රීසි මාධ්‍යය යි.

උපාධි පාඨමාලාවේ ප්‍රායෝගික අංගයක් ලෙස, සිසුන් සහ ගොවීන් අතර අන්‍යෝන්‍ය කුසලතා හා දැනුම හුවමාරු කර ගැනීමට හැකිවන පරිදි ප්‍රදේශයේ ගොවීන් සම්බන්ධ කරගත් වැඩසටහන් කෘෂි විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂි විද්‍යා පීඨය හා ගම්වාසීන් අතර සමීප සම්බන්ධතාවක් ගොඩ නැගී ඇත. තවද, සිසුන්ට කර්මාන්තයේ හා පර්යේෂණ ආයතනවල ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳව අවබෝධය ලබා දීම අරමුණු කර ගත් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා ද පීඨය විසින් සංවිධානය කරනු ලබයි.

කෘෂි විද්‍යා පීඨය විසින් පහත සඳහන් සිව් අවුරුදු (ගෞරව) උපාධි පාඨමාලා පිරිනමනු ලබයි.

- කෘෂි විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සිසුන්ට කෘෂි ව්‍යාපාර කළමනාකරණය, වාණිජමය උද්‍යාන අලංකරණය,වැවිලි කර්මාන්තය හා පශු සම්පත් නිෂ්පාදන යන ක්ෂේත්‍ර හතරට අදාළව විශේෂවේදී උපාධිය හැදෑරිය හැක.)
- ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

## 2.3 ව්‍යවහාරික විද්‍යා පීඨය

### 2.3.1 ඉතිහාසය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ව්‍යවහාරික විද්‍යා පීඨය, 1993 ජූනි මස 21 වන දින බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය ලෙස ආරම්භ විය. මෙම ආයතනය විසින් ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව ප්‍රදානය කරන ලදී. 1996 වර්ෂයේ මුල් භාගයේ දී අනුබද්ධ විශ්වවිද්‍යාල ජාතික විශ්වවිද්‍යාල බවට උසස් කිරීමේදී, සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලය, ඌව අනුබද්ධ විශ්වවිද්‍යාලය සහ බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය එක් කොට සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී. එහිදී බුත්තල අනුබද්ධ විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලයෙහි ව්‍යවහාරික විද්‍යා පීඨය බවට පත් විය.

2008 මාර්තු මස මෙම පීඨය බෙලිහුල්ඔය ප්‍රධාන පරිශ්‍රයේ ස්ථාපිත කරන ලදී.

### 2.3.2 පීඨ කළමනාකරණය

| | |
|---|---|
| **පීඨාධිපති** | මහාචාර්ය ආර්.එම්.යූ.එස්.කේ. රත්නායක<br>B.Sc. (Sp.) Hons. in Agriculture (URUH)<br>M.Sc. in Biotechnology (UPDN)<br>Ph.D. (AIT) Thailand |
| **අංශ ප්‍රධානීන්** | |
| ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය | ආචාර්ය ඊ.පී.එන්. උදයකුමාර<br>B.Sc.(Special)(Hons)(URUH),M.Sc. (USJP)<br>PhD (AIT, Thailand) |
| ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය | ඒ.එල්.සී. ජනිත ලියනගේ මයා<br>B.Sc. (Special) (Hons) in Food Science and Technology (SUSL), M.Sc. (Lund, Sweden) |
| භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය | මහාචාර්ය ජී.එම්.එල්.පී. අපොන්සු<br>B.Sc.(sp) (Hons) (UCBO), M.Phil.(UCBO)<br>Ph.D. (USJP)<br>(2017.10.04 සිට)<br><br>ආචාර්ය ඊ.එම්.යූ.ඩබ්. ජයලත් බී. ඒකනායක<br>B.Sc. (Hons) (UPDN), M.Sc. (UPDN)<br>Ph.D. (Uni. Of Zurich, Switzerland)<br>(2017.10.03 දක්වා) |
| ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය | ආචාර්ය බී.ටී.ජී.එස්. කුමාර<br>B.Sc. (Sp) (Hons) (USJP), M.Sc. (UPDN)<br>Ph.D. (Japan)<br>(2017.05.02 සිට)<br><br>ආචාර්ය එච්.කේ. සේනක අමරකීර්ති<br>B.Sc. (SUSL), M.Sc. (UPDN)<br>Ph.D. (Aizu, Japan)<br>(2017.05.01 දක්වා) |

ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය (වැ.බ. අංශ ප්‍රධානී)

ටී.එස්.එච්. පෙරේරා මිය
B.Sc. (Special) (Hons) (SUSL), M.Sc. (China)
(2017.12.01 සිට)

එච්.ඒ.සී.එස්. හපුආරච්චි මයා
B.Sc. (Hons) (USJP), M.Sc. (UPDN)
(2017.11.30 දක්වා)

### 2.3.3 පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා

ස්වභාවික සම්පත් අධ්‍යයනාංශය, භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය, ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය සහ ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය යනුවෙන් අධ්‍යයනාංශ පහකින් ව්‍යවහාරික විද්‍යා පීඨය සමන්විත වේ.

අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵල මත සෘජුවම පීඨයට ඇතුළත් වන සිසුන් සඳහා ආහාර විද්‍යාව හා තාක්ෂණය, පරිසර විද්‍යා හා ස්වාභාවික සම්පත් කළමනාකරණය, රසායනික තාක්ෂණය, පරිගණක විද්‍යාව හා තාක්ෂණය, ව්‍යවහාරික භෞතීය විද්‍යාව, ආගණනය හා තොරතුරු පද්ධති, ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය, සහ ශාරීරික අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල විද්‍යාවේදී උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

භෞතීය විද්‍යාව හා තාක්ෂණය සහ පරිසර විද්‍යාව හා කළමනාකරණය යන පාඨමාලා සිව් අවුරුදු උපාධි පාඨමාලා ලෙස සකසා තිබුණ ද එම විෂයයන් හදාරන සිසුන්ට අවුරුදු තුනකට පසු විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය ලබා ගෙන වුව ද විශ්වවිද්‍යාලයෙන් පිටව යා හැකිය. සෙසු උපාධි පාඨමාලා ඉඳුරාම සිවු අවුරුදු පාඨමාලා වේ.

ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගනු ලබන්නේ අ.පො.ස. (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵල මෙන්ම තෝරා ගැනීමේ පරීක්ෂණයක දී (ලිඛිත විභාගයකදී) දක්වනු ලබන කුසලතාව ද පදනම් කර ගනිමිනි. එසේම ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය සහ ශාරීරික අධ්‍යාපනය යන විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා ඉල්ලුම් කරන සිසුන් ඉහත පරීක්ෂණයට අමතරව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් ද සමත් විය යුතු වේ. කෙසේ නමුත් මෙම තෝරා ගැනීමේ පිළිවෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද චක්‍රලේඛයක් මගින් වෙනස් වී ඇති බැවින් ඉදිරියේදී මෙම පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමේ දී අභියෝගතා පරීක්ෂණ නොපැවැත්වෙනු ඇත.

ජාත්‍යන්තර හා දේශීය රැකියා ප්‍රවණතාවන්ට හා ඉල්ලුමට සරිලන ලෙස උපාධි පාඨමාලා නිර්මාණය කර ඇති අතර පාඨමාලා පැවැත්වෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි. විශේෂිත ක්ෂේත්‍රයකට පමණක් සීමා නොවී උපාධියෙන් පසු පුළුල් ක්ෂේත්‍රයක සේවය කළ හැකි වන ආකාරයට පරිඝනක විද්‍යාව, ආර්ථික විද්‍යාව, කළමනාකරණය ආදී විෂයයන් ඇතුළත් වන පරිදි අන්තර්ක්ෂේත්‍ර පාඨමාලා ලෙස සියළු පාඨමාලා නිර්මාණය කර ඇත.
අධ්‍යයන කටයුතුවලට අමතරව ව්‍යාප්ති සේවා හා දැනුම බෙදාහැරීමට අදාළ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීම මගින් ප්‍රජා සංවර්ධනයට ද, ව්‍යවහාරික විද්‍යා පීඨය දායකත්වය සපයයි. කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ප්‍රජාව වාර්ෂිකව එවැනි කටයුතු සඳහා සහභාගි වෙති.

පීඨය මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පිරිනමනු ලබයි.

- තොරතුරු පද්ධති විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ආහාර විද්‍යා හා තාක්‍ෂණය විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- පාරිසරික විද්‍යා හා ස්වාභාවික සම්පත් කළමනාකරණය විද්‍යාවේදී උපාධිය
- පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධිය

- රසායනික විද්‍යා තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- පරිගණක විද්‍යා හා තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී (ගෞරව) උපාධිය
- ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී (ගෞරව) උපාධිය

<u>ආගණන හා තොරතුරු පද්ධති අධ්‍යයනාංශය</u>

මෙම උපාධි පාඨමාලාව 2008 වසරේ දී ඇරඹී තිබුණ ද තොරතුරු පද්ධති විද්‍යාවේදී (ගෞරව) උපාධිය පිරිනමන ඉහත අධ්‍යයනාංශය පිහිටවනු ලැබුයේ 2011 මාර්තු පළමුවෙනි දා ය. විෂයමාලාව විශේෂයෙන්ම නිර්මාණය වී ඇත්තේ ආගණනය හා තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍ර දෙකෙහි ම දක්ෂතාව සහිත උපාධිධරයින් බිහි කිරීම සඳහා ය. මේ වන විට අධ්‍යයනාංශය සතුව මනාව ස්ථාපනය කරන ලද පරිඝනක විද්‍යාගාර තුනක් තිබෙන අතර අධ්‍යයනාංශයේ සිසුන් සංඛ්‍යාව 397 කි.

වසරින් වසර මෙම උපාධි පාඨමාලාවට ඇති ඉල්ලුම වැඩි වී ඇති අතර, මේ වන විට පාඨමාලාවට වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 80 තෙක් ඉහළ ගොස් ඇත. අධ්‍යයනාංශයට දැනට බඳවා ගත හැකි උපරිම සංඛ්‍යාව වනුයේ එයයි. මෙම අධ්‍යයනාංශය පෞද්ගලික පරිගණක කර්මාන්ත සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යන අතර, දේශන හා ප්‍රායෝගික සැසි පැවැත්වීමේ දී තාක්ෂණික සහාය ලබා ගැනීමට මෙන්ම සිසුන්ට සුළු පරිමාණ ව්‍යාපෘති හා අවසන් වසර ව්‍යාපෘති සිදු කිරීමේ අවස්ථාව ලබා ගැනීමට ද එමගින් හැකි වී ඇත. සිසුන්ට උපාධිය සම්පූර්ණ කළ වහාම රැකියා අවස්ථා උදා කර ගැනීමේ හැකියාව ද එමගින් ලැබී තිබේ. අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනෙකු, කථිකාචාර්යවරුන් දෙදෙනෙකු හා ආධුනික කථිකාචාර්යවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ.

<u>ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය</u>

1996 වර්ෂයේ දී පීඨය ඇරඹී දා සිට ස්වභාවික විද්‍යා අධ්‍යයනාංශය යටතේ ආහාර විද්‍යා හා තාක්‍ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය පිරිනමනු ලැබූ මුත්, ආහාර විද්‍යා හා තාක්‍ෂණ අධ්‍යයනාංශය පිහිටුවනු ලැබුයේ 2003 වසරේ දී ය. ආහාර විද්‍යා තාක්ෂණය, ප්‍රායෝගික ආහාර තාක්ෂණයන්, සාමාන්‍ය විද්‍යා, සංඛ්‍යානය, පරිඝනක විද්‍යාව හා තාක්ෂණය, ආහාර අලෙවිකරණය, කර්මාන්ත ආර්ථික විද්‍යාව සහ විද්‍යාත්මක සන්නිවේදන හා වෘත්තීය සංවර්ධන පාඨමාලා මෙම උපාධි පාඨමාලාවේ විෂය පථයට ඇතුළත් වේ. ආහාර විද්‍යා හා තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළ වෘත්තීන්හි නියැලීමට අපේක්ෂා කරන සිසුන් අරභයා මෙම පාඨමාලාව සකස් කර ඇත. දේශීය හා විදේශීය වශයෙන් මෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සීඝ්‍ර ඉල්ලුමක් නිර්මාණය වෙමින් පවතින ආහාර විද්‍යාඥයින්ගේ හා තාක්ෂණවේදීන්ගේ අවශ්‍යතාව සපුරාලිය හැකි ආකාරයේ විද්‍යාර්ථීන් මෙම පාඨමාලාව මගින් බිහි කෙරේ. එසේ ම ආහාර විද්‍යා හා තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි හැදෑරීමට අපේක්‍ෂා කරන්නන් සඳහා ද මෙම පාඨමාලාව කදිම මාර්ගයකි. මේ වන විට අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය ලෙස එක් මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හය දෙනෙක්, එක් කථිකාචාර්යවරයෙක්, එක් ආධුනික කථිකාචාර්යවරයෙක් හා එක් තාවකාලික කථිකාචාර්යවරයෙක් සේවයේ යෙදී සිටිති. එසේ ම බාහිර වෘත්තිකයන් ලෙස ක්‍ෂේත්‍රයේ ප්‍රවීණත්වයක් සහිත විද්වතුන් හා කර්මාන්ත විශේෂඥයින් කිහිපදෙනෙකුගේ ම දායකත්වය අධ්‍යයනාංශය වෙත ලැබේ. අධ්‍යයන කටයුතුවලට අදාළ විද්‍යාගාර සැසි හා පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර පහක් තිබේ. ඒ, ආහාර විශ්ලේෂණ විද්‍යාගාරය, ආහාර ක්‍ෂුද්‍රජීව විද්‍යාගාරය, ආහාර සැකසුම් විද්‍යාගාරය, මාංශ සැකසුම් විද්‍යාගාරය හා කිරි ආහාර සැකසුම් විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 143 කි.

<u>ස්වාභාවික සම්පත් අධ්‍යයනාංශය</u>

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙහි ස්වාභාවික සම්පත් අධ්‍යයනාංශය, ස්වාභාවික සම්පත් පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පිරිනැමීම සඳහා 1996 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන් ද රැකියා වෙළඳපොළෙහි පවත්නා පරිසර ආරක්ෂණ, ස්වභාවික සම්පත් කළමනාකරණ හා

සංරක්ෂණ, ජෛව විවිධත්ව සංරක්ෂණ හා කළමනාකරණ හා පරිසර විද්‍යා යනාදී ක්ෂේත්‍රයන්හි පවතින වෘත්තීමය අවස්ථාවන්ට සරිලන ලෙස මෙම උපාධි පාඨමාලාව නිර්මාණය කර තිබේ.

ආරම්භයේ දී පාඨමාලා කාලය වසර තුනකින් යුත් සාමාන්‍ය උපාධියක් ලෙස පිරිනමන ලද පරිසර විද්‍යා හා ස්වභාවික සම්පත් පිළිබඳ විද්‍යාවේදී උපාධිය 2006 වසරේදී ප්‍රතිව්‍යුහගත කර, උපාධිධාරීන්ගේ වෘත්තීය අවස්ථා වර්ධනය වන පරිදි  පරිසර විද්‍යාව හා ස්වභාවික සම්පත් කළමනාකරණය නමින් උපාධි පාඨමාලාවක් පිරිනැමීමට කටයුතු කරන ලදී. වර්තමානයේදී පාරිසරික විද්‍යාව, ජෛව විවිධත්ව සංරක්ෂණය හා මිහිතල විද්‍යාව යන ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර තුන යටතේ මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය ලෙස සිව් අවුරුදු උපාධි පාඨමාලාවක් ද පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය ලෙස තුන් අවුරුදු උපාධි පාඨමාලාවක් ද පිරිනමනු ලැබේ. මෙම උපාධි පාඨමාලා මගින් අදාළ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා ද මනා පදනමක් සැපයෙයි. අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය මහාචාර්යවරුන් දෙදෙනෙකු ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත වේ.

<u>භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය</u>

භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය මගින් රසායනික විද්‍යා තාක්ෂණය, ව්‍යවහාරික භෞතීය විද්‍යාව සහ පරිගණක විද්‍යාව හා තාක්ෂණය යන ප්‍රධාන විෂයය ක්ෂේත්‍ර තුනක් යටතේ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. සහායක විෂයයන් ලෙස ගණිතය, සංඛ්‍යානය, කළමනාකරණ අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන්  ද පාඨමාලාවලට ඇතුළත් කර ඇත.

මෙම අධ්‍යයනාංශය මගින් පහත සඳහන් උපාධි ප්‍රදානය කරනු ලැබේ:

- රසායනික විද්‍යා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව) විශේෂ උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- පරිගණක විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව) විශේෂ උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව) විශේෂ උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 4)
- භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ව්‍යවහාරික විද්‍යාව) උපාධිය (උපාධි කාල සීමාව අවුරුදු 3)

සිසුන්ට මනා ආත්ම විශ්වාසයකින් යුතුව රැකියා වෙළඳපොළට මුහුණ දීම සඳහා මූලික අත්දැකීමක් ලබා දෙනු පිණිස සියළුම සෛද්ධාන්තික පාඨමාලා ඒකකවලට ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබේ. තවද, සිසුන්ගේ නිර්මාණාත්මක හා නව චින්තනය උද්දීපනය කිරීමේ අරමුණින් තුන්වන හා හතරවන අධ්‍යයන වර්ෂවල පාඨමාලා ඒකකවලට සුළු පරිමාණ ව්‍යාපෘති ඇතුළත් කර ඇත. අවසන් වසරේ සම්පූර්ණ සමාසිකයක් ආවරණය වන සේ සිදු කළ යුතු ව්‍යාපෘතිය (පර්යේෂණයක් ලෙස හෝ කාර්මික පුහුණුවට අදාළව) මගින් උපාධි අපේක්ෂකයන්ට වැඩ පරිසරය පිළිබඳව අවබෝධයක් ලබා දෙන අතර,  උපාධිය ලබා ගැනීමට පෙර ස්වකීය වෘත්තීය ක්ෂේත්‍රයට අදාළ ප්‍රායෝගික රැකියා අත්දැකීමක් ද ලබා දේ. විශ්වවිද්‍යාලයීය පරිසරය මෙන්ම අධ්‍යයන වැඩසටහන් ද නිර්මාණය කර ඇත්තේ මෙම අරමුණු ඉටු කර ගැනීමට හැකිවන පරිදි සහ ස්වකීය විෂය ක්ෂේත්‍රයන්හි නිපුණ වෘත්තිකයන් බිහි කළ හැකි වන පරිද්දෙනි. එමෙන්ම, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ව්‍යවහාරික භෞතීය විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය පිරිනමනු ලබන එකම ආයතනය වන්නේ ද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ භෞතීය විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය යි. අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර හතරක් තිබේ. ඒ, භෞතික විද්‍යාගාරය, රසායන විද්‍යාගාරය I, රසායන විද්‍යාගාරය II හා රසායන පර්යේෂණ විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 162 ක් වන අතර, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් තිදෙනෙකුගෙන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හත් දෙනෙකුගෙන්, ආධුනික කථිකාචාර්යවරු පස් දෙනෙකුගෙන්, එක් උපදේශකවරයෙකුගෙන් හා තාවකාලික කථිකාචාර්යවරු තිදෙනෙකුගෙන් කාර්යය මණ්ඩලය සමන්විත වේ.

**ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය**

ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය යන උපාධි පාඨමාලා දෙක 2008 වර්ෂයේ සිට ව්‍යවහාරික විද්‍යා පීඨය මගින් ප්‍රදානය කෙරේ. ක්‍රීඩා විද්‍යාව හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය පිහිටවනු ලැබුයේ 2011 මාර්තු පළමුවෙනි දා ය. මූලික, ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රීඩා කටයුතු ඉගැන්වීම සඳහා අවශ්‍ය කෙරෙන මූලික විද්‍යාත්මක ක්‍රීඩා කුසලතාවයෙන් හා කළමනාකරණ කුසලතාවයෙන් යුත් උපාධිධාරීන් බිහි කිරීමේ අරමුණින් ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණ පිළිබඳ පාඨමාලා නිර්මාණය කොට ඇත. ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධි පාඨමාලාව විශේෂයෙන් නිර්මාණය කොට ඇත්තේ ශාරීරික අධ්‍යයන කටයුතු සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් පිළිබඳව විද්‍යාත්මක පදනමකින් යුත් ප්‍රවීණත්වයක් ලබා ගත් උපාධිධාරීන් බිහි කිරීමට ය. පාඨමාලා දෙකෙහි ම පාඨමාලා කාලසීමාව වසර 4 කි. පාඨමාලාව සඳහා අවුරුදු පතා ප්‍රවේශ වන ශිෂ්‍ය සංඛ්‍යාවේ සීඝ්‍ර වර්ධනයක් දැකිය හැකි වන අතර, පාඨමාලාව සඳහා පවතින ඉල්ලුම එමගින් පැහැදිලි වේ. මේ වන විට පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම මට්ටමට ළඟා වී ඇත. වසර 4 ක් තුල කුසලතාපූර්ණ හා මනා ප්‍රවීණත්වයකින් යුත් උපාධිධාරීන් බිහි කිරීමට හැකි වන පිරිදි මෙම පාඨමාලා දෙක තුළට ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති රැසක් එක් කර තිබේ.

සිසුන්ට ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලට සහභාගී වීමට අවස්ථාව සලසනු පිණිස අධ්‍යයනාංශය විවිධ ක්‍රීඩා සංගම්/ආයතන සමග විවිධ සහයෝගිතාවන්ට එළඹී ඇත. අධ්‍යනාංශය සතුව සියලු පහසුකම් සහිත විද්‍යාගාර දෙකක් තිබේ. ඒ, ජෛව රසායන විද්‍යාගාරය හා පර්යේෂණ විද්‍යාගාරය වශයෙනි. අධ්‍යයනාංශයේ වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව 463ක් වන අතර, එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගෙන්, කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගෙන් හා ආධුනික කථිකාචාර්යවරුන් අට දෙනෙකුගෙන් හා එක් උපදේශකවරයෙකුගෙන් අධ්‍යයනාංශය සමන්විත වේ. මීට අමතරව, න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලා පවත්වාගෙන යාම සඳහා රටේ ප්‍රමුඛ පෙළේ ක්‍රීඩා විශේෂඥයින්ගේ සහයෝගය ද ලබා ගැනේ.

## 2.4 භූ විද්‍යාපන පීඨය

### 2.4.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ඇති අධ්‍යයන පීඨ පහ අතුරෙන් එක් පීඨයක් වන භූ විද්‍යාපන පීඨය 2004 වසරේදී ස්ථාපනය කරන ලදී. 1997 වර්ෂයේ දී විද්‍යාවේදී (මැනුම් විද්‍යා) උපාධි පාඨමාලාව හඳුන්වා දුන් මැනුම් විද්‍යා අධ්‍යයනාංශය මෙසේ 2004 වර්ෂය වන විට පීඨයක් බවට පත් විය. රටේ ඉතා වැදගත් අවශ්‍යතාවයක් පිරිමසමින් සබරගමුව විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කළ මෙම උපාධිය ශ්‍රී ලාංකීය විශ්ව විද්‍යාල පද්ධතියට අයත් විශ්වවිද්‍යාලයක් විසින් හඳුන්වා දුන් එවැනි ගණයේ පළමු උපාධි පාඨමාලාව විය. සිව් වසරක අධ්‍යයන කාලයකින් යුත් මෙම විද්‍යාවේදී (මැනුම් විද්‍යා) උපාධිය විශේෂ උපාධියක් ලෙස පිරිනමනු ලැබේ. මෙම පාඨමාලාව සඳහා පළමු ශිෂ්‍ය කණ්ඩායම 1997 වසරේ දී බඳවා ගත් අතර ඔවුහු 2002 වසරේදී දී උපාධිය ලබා පිට වූහ.

### 2.4.2 පීඨ කළමනාකරණය

**පීඨාධිපති** — ආචාර්ය එච්.එම්. ඉන්දික ප්‍රසන්න
BSc (Hons.) Surveying Sciences, SUSL, MPhil (Geodesy), SJP, PhD (Geodesy), The Polytechnic University, Hong Kong

**අංශ ප්‍රධානීන්**

මැනුම් හා භූ මිතික අධ්‍යයනාංශය - ආචාර්ය දුමින්ද ආර්. වැලිකන්න
BSc (Hons.) Surveying Sciences, SUSL, MSc (Geo-informatics), ITC - The Netherlands, PhD (Microwave Remote Sensing), Kyoto, Japan

දූරස්ථ ග්‍රහණ ගෝචර හා භූගෝලීය තොරතුරු පද්ධති අධ්‍යයනාංශය - ආචාර්ය ජී. සංඛ එන්. පෙරේරා
BSc (Hons) Surveying Sciences, SUSL, MSc (Geo-informatics), ITC - The Netherlands, PhD (Photogrammetry & Remote Sensing), TUD, Germany

### 2.4.3 පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා

පීඨය මගින් විශේෂ විෂය ක්ෂේත්‍ර පහක් යටතේ මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධි පිරිනමනු ලබයි. ඒවා නම්:

1 බිම් මැනීම හා භූ මිතික මැනීම පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය
2 ඉඩම් කළමනාකරණය පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය
3 ජලමාන මැනුම් පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය
4 දූරස්ථ ගෝචරය පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය
5 භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ මැනුම් විද්‍යා විද්‍යාවේදී (ගෞරව) උපාධිය

## 2.5 කළමනාකරණ අධ්‍යයන පීඨය

### 2.5.1 ඉතිහාසය

ගිණුම්කරණ හා මූල්‍ය අධ්‍යයනාංශය හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය යටතේ තුන් අවුරුදු උපාධි පාඨමාලා පිරිනමනු වස් ව්‍යාපාර අධ්‍යයන පීඨය 1996 සැප්තැම්බර් මාසයේ දී පිහිටුවනු ලැබිණි. පදනම් වසර හා තවත් විශේෂිකරණ වසර දෙකක අධ්‍යයන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශිෂ්‍යයන් වෙත මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, අලෙවි කළමනාකරණය, සංචාරක කළමනාකරණය, පරිසර හිතකාමී කළමනාකරණය හා ආගන්තුක සත්කාර කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාවේදී උපාධි පිරිනමන ලදී. මේ අනුව, 1997, 1998, 1999, 2000, 2001 හා 2002 වර්ෂවලදී ශිෂ්‍ය කණ්ඩායම් 06ක් මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය, අලෙවි කළමනාකරණය හා සංචාරක කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව විද්‍යාවේදී (විශේෂ) උපාධි ලැබූහ.

2003 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සහිතව, ව්‍යාපාර අධ්‍යයන පීඨය කළමනාකරණ අධ්‍යයන පීඨය ලෙස නම් කරන ලදී. එම වර්ෂයේදී ම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය මත තුන් අවුරුදු උපාධි පාඨමාලාවල කාල සීමාව වෙනස් කර ඒවා සිව් අවුරුදු පාඨමාලා බවට පත් කරන ලදී.

වර්තමානය වන විට කළමනාකරණ අධ්‍යයන පීඨය අධ්‍යයනාංශ හතරකින් සමන්විත වේ. ඒවා නම්; ගණකාධිකාරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය හා සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය යි.

### 2.5.2 පීඨ කළමනාකරණය

| | |
|---|---|
| **පීඨාධිපති** | මහාචාර්ය ඩබ්.කේ.ඒ.සී. ඥානපාල<br>BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen-P R China), සංචාරක කළමනාකරණය පිළිබඳ මහාචාර්ය<br>(2017.09.12 සිට) |
| | මහාචාර්ය ආර්.එම්.ඩබ්. රත්නායක<br>BSc (Sp) Botany (KLN), MSc (SJP), PhD (SJP) PG Dip Wildlife Management (India), Diploma in Mass Media (Sri Lanka Media Foundation), පාරිසරික කළමනාකරණය පිළිබඳ මහාචාර්ය<br>(2017.09.11 දක්වා) |
| **අංශ ප්‍රධානීන්** | |
| ගණකාධිකාරණ හා මූල්‍ය අධ්‍යයනාංශය | ඩී.ජී. ධර්මරත්න මයා<br>BSc (Financial Management) (SUSL) MBA (PDN), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය<br>(2017.02.28 දක්වා) |
| | මහාචාර්ය ඩී.ඒ.අයි. දයාරත්න<br>BSc (Financial Management) (SUSL), MSc (SJP), PhD (CMB), මූල්‍යය පිළිබඳ මහාචාර්ය<br>(2017.03.01 සිට) |

| | |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය | කේ.එල්.බී.ජී. ධර්මරත්න මිය<br>BBA (Bus admin) (RUH) MSc (SJP), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය<br>(2017.03.31 දක්වා)<br><br>පී.ජේ. ජයතිලක මයා, MSc (Econ) Bulgaria, MSc (Mgt) (SJP), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය<br>(2017.04.01 සිට) |
| අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | කේ.ඩී.එල්.ආර්. කපුගේ මිය<br>BBA (Accountancy) (CMB), MBA (Banking and Finance) (SJP), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය |
| සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය | මහාචාර්ය ඩබ්.කේ.ඒ.සී. ඥානපාල<br>BSc (Tourism Management) (SUSL), MSc (SJP), PhD (Xiamen-P R China), සංචාරක කළමනාකරණය පිළිබඳ මහාචාර්ය<br>(2017.09.11 දක්වා)<br><br>සී.එන්.ආර්. විජේසුන්දර මයා<br>B.Sc. Tourism Management (SUSL),<br>MA (Colombo), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය<br>(2017.09.12 සිට 2017.09.24 දක්වා වැ.බ. අංශ ප්‍රධාන)<br><br>ආචාර්ය ආර්.එස්.එස්.ඩබ්. ආරච්චි<br>BSc (Tourism Management) (SUSL), MBA in Marketing (CMB), PhD (MSU Malaysia), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය<br>(2017.09.25 සිට) |

**2.5.3 පීඨය මඟින් පිරිනමන උපාධි පාඨමාලා**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන පීඨය වෙත සෘජුවම තේරී පත් වන ශිෂ්‍යයන් වෙත පීඨයේ ඇති අධ්‍යයනාංශ හතර මඟින් උපාධි පාඨමාලා හතක් පිරිනමනු ලබයි. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

| **අධ්‍යයනාංශය** | **උපාධි පාඨමාලාව** |
|---|---|
| ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය | ◦ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය | • අලෙවි කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය |
| ගණකාධිකාරණ හා මූල්‍ය අධ්‍යයනාංශය | • මූල්‍ය කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>• බැංකු හා රක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය |

සංචාරක කළමනාකරණ අධ්‍යයනාංශය

- සංචාරක කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය
- පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
- සත්කාරක කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

පාඨමාලා ආරම්භයේදී, සිසුන් ගේ වරණය හා ඔවුන්ගේ අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල (ඉසෙඩ් අගය) පදනම් කරගනිමින් පීඨය විසින් ඒ ඒ උපාධි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගනු ලබයි.

නව විෂය නිර්දේශය යටතේ පළමු අධ්‍යයන වර්ෂයේදී ම විශේෂවේදී උපාධි පාඨමාලාවට අදාළ විෂයයන් ඉගැන්වෙන අතර ඒ සමගම පොදු විෂයයන් ද උගන්වනු ලැබේ. උපාධි පාඨමාලාවල කාලය වසර හතරකින්, එනම් සමාසික අටකින් යුක්ත ය. සම්භාර හයක් වෙන් කර ඇති සිව්මස් කර්මාන්ත පුහුණුවක් හා ව්‍යාපෘති වාර්තාවක් හෝ නිබන්ධනයක් සිව්වැනි වසරේ දෙවන සමාසිකය තුළ සිසුන් විසින් සම්පූර්ණ කළ යුතුය. එක් එක් උපාධි පාඨමාලාව සම්භාර 120 කින් සමන්විත වේ.

## 2.6 සමාජීය විද්‍යා හා භාෂා පීඨය

### 2.6.1 ඉතිහාසය

වර්ෂ 1996 දී විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන කටයුතු ආරම්භ කළ කාලයේදීම සමාජීය විද්‍යා හා භාෂා පීඨය ආරම්භ කෙරිණි. මුල් කාලයේ දී, භාෂා අධ්‍යනාංශය හා සමාජීය විද්‍යා අධ්‍යනාංශය යන අධ්‍යයනාංශ දෙකෙන් පීඨය සමන්විත විය. තුන්වැනි අධ්‍යයනාංශය වූ ඉංග්‍රීසි භාෂා අධ්‍යයනාංශය 2004 වසරේදී ආරම්භ කරන ලද අතර, සිව් වැන්න වූ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය පිහිටුවන ලද්දේ 2009 වසරේදී ය. පස්වන අධ්‍යයනාංශය ලෙස භූගෝල විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය 2015 වසරේ දී ආරම්භ කරන ලදී. 1996 නොවැම්බර් මාසයේදී පීඨය විසින් සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද්දේ, එවකට අනුබද්ධ විශ්විද්‍යාලය විසින් ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව හදාරා වසර දෙකකින් පසු උපාධිය සම්පූර්ණ කර ගැනීම සඳහා බඳවා ගන්නා ලද සිසු පිරිස සමාජීය විද්‍යා හා භාෂා පීඨය වෙත අනුයුක්ත කර ගනිමිනි. 1998 වසරේ සිට අ.පො.ස. (උ/පෙළ) සුදුසුකම් මත පමණක් සිසුන් බඳවා ගැනීම ආරම්භ කරන ලදී.

සමාජීය විද්‍යා හා භාෂා පීඨය පීඨය විසින් සිය දැක්ම හා මෙහෙවරට අනුකූලව, සිය අධ්‍යයනාංශ හරහා ගෞරව උපාධි ප්‍රදානය කරනු ලැබේ. 2007 වසරේදී තුන් අවුරුදු ගෞරව උපාධි පමණක් පිරිනැමීමේ සිය මූලික සංකල්පයෙන් බැහැර වූ පීඨය, තුන් අවුරුදු සමාජ විද්‍යා ගෞරව උපාධි පාඨමාලාවට අමතරව ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, භූගෝල විද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා මානව විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි සිව් අවුරුදු උපාධි පාඨමාලාවන් පිරිනැමීම ද ආරම්භ කළේය. 2013 වසරේ සිට බල පැවැත්වෙන පරිදි සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන්, චීන හා හින්දි භාෂා පිළිබඳ ගෞරව උපාධි පාඨමාලා ද හඳුන්වා දුන් අතර, 2015 වසරේ දී භාෂා පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි පාඨමාලාව ආරම්භ කරනු ලැබිණි. වර්තමානය වනවිට පීඨය මගින් ප්‍රදානය කරනු ලබන්නේ සිව් අවුරුදු ගෞරව උපාධි හා තුන් අවුරුදු සාමාන්‍ය උපාධි පමණි.

ක්ෂේත්‍ර ගණනාවකට අයත් විෂයයන් පිළිබඳව මනා දැනුමකින් හා මානව සම්ප්‍රදායයන් පිළිබඳව පුළුල් අවබෝධයකින් යුත් වෘත්තිකයන් බවට පත් වීමේ හැකියාව සිසුන් වෙත ලබා දෙමින්, සිය වෘත්තීය අභියෝග ජය ගැනීමට හැකි වන පරිදි ඔවුන් සූදානම් කිරීමට පීඨය කැපවී කටයුතු කරයි. වර්තමාන වැඩ ලෝකයේ අභියෝගවලට හා කටයුතුවලට සාර්ථක ලෙස මුහුණ දීම සඳහා එම දැනුම අදාළ කර ගත හැකි ආකාරය පිළිබඳව උපාධි පාඨමාලාවලදී අවධාරණය කෙරේ. උපාධි අපේක්ෂකයින්ගේ ස්වාධීන හා විචාරශීලී චින්තන හැකියාව, තාර්කික හා විශ්ලේෂණ හැකියාවන්, ඵලදායී සන්නිවේදන හැකියාවන් සහ සාමූහික ක්‍රියාකාරකම්වලදී වැදගත් වන සන්නිවේදනාත්මක සහභාගිත්ව හැකියාවන් සංවර්ධනය කිරීම පීඨයේ අරමුණයි. එනිසා ම, මෙම කලා උපාධි පාඨමාලා තුළ පන්ති කාමරය තුළ සිදු කෙරෙන ක්‍රියාකාරකම්වලට අමතරව ඉන් පරිබාහිරව කෙරෙන ස්වාධීන කියවීම්, ලිවීම්, ප්‍රායෝගික පර්යේෂණ සහ ව්‍යාපෘති ආදිය ද ඇතුළත් කර ඇත.

### 2.6.2 පීඨ කළමනාකරණය

| | |
|---|---|
| **පීඨාධිපති** | ආචාර්ය ඩබ්. මනෝජ් ආරියරත්න<br>BA Hons (USJP), MA (USJP), PhD (Pune)] |
| **අංශ ප්‍රධානීන්** | |
| ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය | ආචාර්ය ඒ. අරුණ ශාන්ත |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය | ආර් ඩබ්.එම්.පී.ජී.අයි. වීරකෝන් මිය |
| භූගෝල විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය | ආචාර්ය කේ.පී.එල්. නිශාන්ත පටබැඳි |
| භාෂා අධ්‍යයනාංශය | ආචාර්ය ආර්.ඒ.ඩී.පී. වීරසේකර |
| සමාජීය විද්‍යා අධ්‍යයනාංශය | ආචාර්ය ඒ. සරත් ආනන්ද |

### 2.6.3 පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා

සමාජීය විද්‍යා හා භාෂා පීඨය අධ්‍යයනාංශ පහකින් සමන්විත වේ. ඒවා නම්; ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය, භූගෝල විද්‍යා හා පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය හා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය යි.

පීඨය මගින් පහත සඳහන් උපාධි පාඨමාලා පිරිනමනු ලැබේ.

1. ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය (සිව් අවුරුදු)
ුද ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය (තුන් අවුරුදු)

පීඨයේ සියලුම අධ්‍යයනාංශවල සහායයෙන් ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලබන අතර, එක් එක් විෂයයන්ට අදාළ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලා පහත පරිදි එක් එක් අධ්‍යයනාංශ මගින් පවත්වාගෙන යනු ලැබේ.

<u>ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යයනාංශය</u>
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
සංඛ්‍යානය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
(ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.)

<u>භූගෝල විද්‍යා හා පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය</u>
භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

<u>භාෂා අධ්‍යයනාංශය</u>
සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ජර්මන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
චීන භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
හින්දි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

<u>සමාජීය විද්‍යා අධ්‍යයනාංශය</u>
දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය
සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය

<u>ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය (DELT)</u>
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය විසින් ''දෙවන භාෂාව ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම (ESL)'' ප්‍රධාන/අනු විෂයයක් ලෙස උගන්වන අතර, ශිෂ්‍යයන්ගේ විශ්වවිද්‍යාලයීය ජීවිතය පුරාවට ඉංග්‍රීසි භාෂා පාඨමාලා පිරිනැමීමට ද එමගින් කටයුතු යොදා ඇත.

# 03. අධ්‍යයන සම්පත්

## 3.1 පුස්තකාලය

### 3.1.1 හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්වල අපේක්ෂිත විශිෂ්ඨත්වය හා ගුණාත්මකභාවය ළඟා කර ගැනීම පිණිස විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය සමස්ත විශ්වවිද්‍යාලයට ම සිය සේවා සපයන අතර, ඊට අමතරව කළමනාකාරණ අධ්‍යයන පීඨ පුස්තකාලය හා කෘෂි විද්‍යා පීඨ පුස්තකාලය මගින් එම එක් එක් පීඨයේ පුස්තකාල අවශ්‍යතා සපුරාලනු ලැබේ. විෂයමාලා අධ්‍යයනය සඳහා ලබා දෙන මූලික සහයෝගයට පමණක් සීමා නොවී පරිශීලකයන්ගේ උසස් පර්යේෂණ අවශ්‍යතා ද සපුරාලිය හැකි ආකාරයට පුස්තකාල සම්පත් සම්භාරය හා සේවාවන් සැලසුම් කර තිබේ.

වෙනස්වන තොරතුරු අවශ්‍යතා සපුරාලනු පිණිස නිර්මාණශීලී ලෙස හැඩගැසෙමින් හා ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද මුහුණ දීමට සිදුවන නව අභියෝගයන්ට නව්‍ය ලෙස ප්‍රතිචාර දක්වමින් සිය පරිශීලකයන් වෙත ගුණාත්මක තොරතුරු, සේවා හා වැඩසටහන් සැපයීමට සබරගමුව විශ්වවිද්‍යාලයීය පුස්තකාල කැප වී කටයුතු කරයි.

2017 වසර අග භාගය වන විට විශ්වවිද්‍යාලයේ සියලුම පුස්තකාලවල තිබූ පොත් සම්භාරය 125,000ත් පමණ වූ අතර, විශ්වවිද්‍යාලය විසින් මිල දී ගත් පොත්, පරිත්‍යාග ලෙස ලද පොත් හා පත්‍රිකා ඊට ඇතුළත් විය.

සබරගමුව විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පුස්තකාල ස්වයංක්‍රීයකරණය සඳහා KOHA open source මෘදුකාංගය භාවිතා කරයි. ඒ අනුව, බැහැර දීමේ අංශය, විමර්ශන අංශය, නිත්‍ය විමර්ශන අංශය, සඟරා අංශය ලෙසත් පසුගිය ප්‍රශ්න පත්‍ර එකතුව හා වෙනත් එකතුන් ලෙසත් පුස්තකාල සම්පත් සම්භාරය සංවිධිත ලෙස වර්ගීකරණය කර ඇත.

## 3.2 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය

### 3.2.1 හැඳින්වීම

පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය තොරතුරු තාක්ෂණ සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ පවතින වෙනමම අධ්‍යයන ඒකකයකි. සමාජීය විද්‍යා හා භාෂා පීඨය, කළමනාකරණ පීඨය හා කෘෂි විද්‍යා පීඨය යන පීඨයන් හි අධ්‍යයන කටයුතු සඳහා සම්පත් දායකයන් සැපයීම මෙන්ම WIFI සහ අන්තර්ජාල සේවා, විද්‍යුත් තැපැල් සේවා, පරිගණක ජාලකරණ සේවාවන්, විද්‍යුත් ඉගෙනුම් පහසුකම්, නඩත්තු සේවාවන් (දෘඩාංග හා මෘදුකාංග) සැපයීම සහ විශ්වවිද්‍යාලය සඳහා මෘදුකාංග නිර්මාණය කිරීම ආදී ලෙස වූ ප්‍රධාන සේවාවන් මෙමගින් සැපයේ.

### 3.2.2 ඉතිහාසය

සබරගමුව විශ්වවිද්‍යාලයේ පරිසනක අධ්‍යයන මධ්‍යස්ථානයේ ඉතිහාසය, 1991 වර්ෂයේ දී සබරගමුව පළාතේ අනුබද්ධ විශ්වවිද්‍යාලය පිහිටුවීමේ කාලය දක්වා විහිදේ. එය සමනළවැව ජල විදුලි බල ව්‍යාපෘතියට අයත් ගොඩනැගිල්ලක ආරම්භ කරන ලද අතර වර්තමානයේ එය D1-4 නිල නිවසේ ස්ථානගතව ඇත. ආරම්භයේදී මෙම අංශය 1Mb RAM හා 40 Mb Hard disks සහිත Tatung 286 පරිසනක 10 කින්ද OKI 9 – pin ඩොට් මෙට්‍රික්ස් මුද්‍රණ යන්ත්‍රයකින් ද සමන්විත විය. අනුබද්ධ විශ්වවිද්‍යාලයේ සමාරම්භක උත්සවයට පැමිණි හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා විසින් එම අවස්ථාවේ දී මෙම පරිගණක මධ්‍යස්ථානයේ ද එලකය නිරාවරණය කරන ලදී.

මුල් කාලීනව ගණකාධිකරණය හා මූල්‍යය පිළිබඳ ඩිප්ලෝමාව, සංචාරක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාව යන ඩිප්ලෝමා තුන සඳහා අනුබද්ධ විශ්වවිද්‍යාලය විසින් සිසුන් බඳවා ගනු ලැබූ අතර, හර පාඨමාලාවක් ලෙස පරිසනක මධ්‍යස්ථානය විසින් පිරිනැමූ පරිසනක පාඨමාලාව හැදෑරීම, එකී සියළු ඩිප්ලෝමා ලබා ගැනීම සඳහා අනිවාර්ය විය.

එවකට සිටි බලංගොඩ දිසා විනිසුරු විසින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගෙන් අය කෙරෙන දඩ මුදල් සමාජ සත්කාර සඳහා යොදා ගැනීමේ වැඩසටහනක් දියත් කරන ලද අතර, එමගින් පරිත්‍යාග කරනු ලැබූ රු. 15000.00 ක මුදලින්, එවකට සිටි සේවකයින්, ශිෂ්‍යයින්, ගම්වාසීන් ඇතුළු සියළු දෙනාගේ සහයෝගයෙන් ශ්‍රමදාන ව්‍යාපාරයක් ලෙස දැනට පවතින පරිසනක මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. පසුව රජයෙන් ලැබුණු අරමුදල් මත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරනු ලැබීය. සමනළවැව ව්‍යාපෘතියෙන් අත්පත් කර ගත් ගොඩනැගිලි වලට අමතරව, අනුබද්ධ විශ්වවිද්‍යාලය සඳහා ඉදි කළ පැරණි ශ්‍රවණාගාරය හා සමගාමීව ඉදිවුණු පළමු ගොඩනැගිල්ල වන්නේ දැනට පරිසනක මධ්‍යස්ථානය පවත්වාගෙන යන ගොඩනැගිල්ලයි.

පළමුව එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු පරිසනක තාක්ෂණ උපදේශකවරයෙකු වශයෙන් බඳවා ගන්නා ලද අතර ඔහු විසින් පරිසනක හර පාඨමාලාවේ දේශන සහ ප්‍රායෝගික වැඩසටහන් මෙහෙයවන ලදී. ඉන් අනතුරුව පරිසනක මධ්‍යස්ථානයේ සේවා තවත් පුළුල් කිරීම අරභයා තවත් උපදේශකවරුන් දෙදෙනෙකු මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය වෙත බඳවා ගත් අතර, එය අනුබද්ධ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පැවති අනුමත සේවක සංඛ්‍යාවකින් සමන්විත එකම පරිසනක මධ්‍යස්ථානය විය.

1996 සබරගමුව අනුබද්ධ විශ්වවිද්‍යාලය ජාතික විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කිරීමෙන් අනතුරුව පරිසනක මධ්‍යස්ථානය විසින් විවිධ උපාධි වැඩසටහන් සඳහා සේවා සැපයීම ආරම්භ කරන ලදී. විශේෂයෙන් ම, තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා අවශ්‍ය අධ්‍යයන සටහන් නිර්මාණය කිරීම සහ එම පාඨමාලා සඳහා දේශන හා ප්‍රායෝගික පුහුණු කටයුතු පැවැත්වීම, විශ්වවිද්‍යාලයට පරිසනක හා වෙනත් අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය ටෙන්ඩර් සැකසීම හා ඒවා ඇගයීම් කිරීම, දිනපතා රාජකාරී කටයුතු පහසු කිරීම සඳහා ලිපිකරුවන්ට පරිසනක දැනුම ලබා දීම, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට ඔවුන්ගේ පශ්චාත් උපාධි නිබන්ධන සකස් කර ගැනීමට සහාය වීම හා ඉගැන්වීමේ පත්‍රිකා/සටහන් සූදානම් කර ගැනීමට සහාය වීම ආදී කටයුතු මගින් පරිගණක මධ්‍යස්ථානය අනෙකුත් පීඨ සඳහා සිය සේවා සැපයීය.

විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ ම පරිගණක මධ්‍යස්ථානය පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය ලෙස නව්‍යකරණය කොට, වෙනම අධ්‍යක්ෂකවරයෙකු යටතේ ප්‍රතිව්‍යුහගත කරන ලදී. එමෙන්ම කළමනාකරණ අධ්‍යයන හා සමාජීය විද්‍යා හා භාෂා පීඨයන් හි තොරතුරු තාක්ෂණයට අදාළ උපාධි වැඩසටහන් සඳහා සහයෝගය ලබා දීම ද සිදු කෙරිණි. මධ්‍යස්ථානයේ සේවා කටයුතු පුළුල් කිරීමේ අරමුණෙන්, පෙර පැවති ගොඩනැගිල්ලට යාබදව තවත් ගොඩනැගිල්ලක් ද ඉදිකරන ලදී. එම කාලයේදීම විශ්වවිද්‍යාලයීය ප්‍රාදේශීය ජාලය (Local Area network) ආරම්භ කර LEARN හරහා අන්තර්ජාල පහසුකම්වලට සම්බන්ධ කරමින් විශ්වවිද්‍යාල ප්‍රජාවට අන්තර්ජාල පහසුකම් හා ජාලගත සේවා ලබාදීම හා එම කටයුතු නඩත්තු කිරීම ආරම්භ කෙරිණි. සබරගමුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය නිර්මාණය කිරීම හා විද්‍යුත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය මගින් සිදු කළ තවත් වැදගත් සේවාවන් ලෙස දැක්විය හැක.

### 3.2.3 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | අනුයුක්ත කර ඇති ස්ථානය |
|---|---|---|---|
| 1 | ආර්.වී.එස්.පී.කේ. රණතුංග මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 2 | ආර්.එම්. නෙවිල් බී. රත්නායක මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 3 | එච්.කේ. සාලින්ද ප්‍රේමදාස මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 4 | එන්.ජේ. මල්රාජ් සිල්වා මයා | කථිකාචාර්ය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 5 | ආර්.ඒ.එච්.එම්. රූපසිංහ මෙය | ආධුනික කථිකාචාර්ය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |

### 3.2.4 පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | අනුයුක්ත කර ඇති ස්ථානය |
|---|---|---|---|
| 1. | ඩබ්.එච්.ඩී. පේමවර්ධන මයා | පරිගණක තාක්ෂණ උපදේශක- I ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ කෘෂි විද්‍යා පීඨය |
| 2. | එච්.එම්.එම්.ඒ. හේරත් මයා | පරිගණක තාක්ෂණ උපදේශක- II ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/කළමනාකරණ අධ්‍යයන පීඨය |
| 3. | ඩබ්.එම්.සී.කේ.බී. වනිගසේකර මයා | පරිගණක තාක්ෂණ උපදේශක- II ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ කළමනාකරණ අධ්‍යයන පීඨය |
| 4. | ඊ.එස්.ඒ. ගුණසිංහ මයා | සහකාර ජාල කළමනාකරු- I ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 5. | කේ.සී.එස්. රණසිංහ මයා | සහකාර ජාල කළමනාකරු- II ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය |
| 6. | ඒ.සී. නානායක්කාර මෙය | පරිගණක තාක්ෂණ උපදේශක- II ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය |
| 7. | ඩබ්.ආර්.වයි.එස්. සමරසේකර මයා | පරිගණක තාක්ෂණ උපදේශක- II ශ්‍රේණිය | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය |
| 8. | බී.එච්. මදාරා මිය | තාවකාලික පරිගණක තාක්ෂණ උපදේශක | පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය |

ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශකවරුන් සිවුදෙනා අතුරින් තිදෙනෙකු කෘෂි විද්‍යා පීඨය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය සහ කළමනාකරණ අධ්‍යයන පීඨය යන පීඨ තුනට අයත් පරිගණක මධ්‍යස්ථානවල තොරතුරු තාක්ෂණ විෂයට අදාළ දේශන/ප්‍රායෝගික පන්ති පැවැත්වීම සඳහාත් ඊට අදාළ උපදෙස් ලබාදීම සඳහාත් ඒ ඒ පීඨවලට අනුයුක්ත කොට ඇත.

ඩබ්.එම්.සී.කේ.බී. වනිගසේකර මහතා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පරිගණක මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන අතර සිය උපදේශක තනතුරේ කාර්යභාරයට අමතරව ඔහු විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවි සංවර්ධනය කිරීමේ හා පවත්වාගෙන යාමේ කටයුතුවල ද නියැලෙයි. එච්.එම්.එම්.ජී. හේරත් මහතා ද තොරතුරු තාක්ෂණ විෂයට අදාළ ප්‍රායෝගික පන්ති පැවැත්වීම සඳහා කළමනාකරණ අධ්‍යයන පීඨය වෙත අනුයුක්ත කොට ඇත.

ඩබ්.ආර්.වයි.එස්. සමරසේකර මහතා සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ පරිගණක මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන අතර අදාළ පීඨාධිපතිවරයා ගේ ඉල්ලීම පරිදි එම පීඨයේ තොරතුරු තාක්ෂණයට අදාල පාඨමාලා සඳහා දේශන පවත්වයි.

ජ්‍යෙෂ්ඨ උපදේශක පේමවර්ධන මහතා තොරතුරු තාක්ෂණ පාඨමාලාවේ සම්බන්ධීකාරක වශයෙන් කෘෂි විද්‍යා පීඨයේ සේවය කරයි.

බී.එච්. මදාරා මිය ද සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ තොරතුරු තාක්ෂණයට අදාල පාඨමාලා සඳහා දේශන පවත්වයි.

අධ්‍යයන පීඨවලට අනුයුක්ත කර ඇති සම්බන්ධීකාරකවරුන් ඒ ඒ පීඨවල පීඨ මණ්ඩල රැස්වීම්වලට ද සහභාගි වන අතර, මානව සම්පත් හා තොරතුරු තාක්ෂණයට අදාළ සේවාවන් සැපයීම සඳහා පරිඝනක මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කරති. කාලීන අවශ්‍යතාවයන් මත ඉදිරියේදී ස්ථිර කාර්ය මණ්ඩලයේ ඇබෑර්තු තුනක් පිරවිය යුතුව ඇත.

සහකාර ජාල කළමනාකරුවන් වන ඊ.එස්.ජී. ගුණසිංහ සහ කේ.සී.එස්. රණසිංහ යන මහත්වරු පරිඝනක අධ්‍යක්ෂකවරයාගේ අධීක්ෂණය යටතේ, විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය ජාලයේ (LAN) නඩත්තු කටයුතු හා එහි ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමේ කටයුතුවලත්, නව ජාල සේවා අවශ්‍ය වන අවස්ථාවලදී එම සේවා ලබා දීමේ කටයුතුවලත් නියැලෙති.

### 3.2.5 පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය වෙත අනුයුක්ත කර ඇති අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | අනුයුක්ත කර ඇති ස්ථානය | සේවය ලබාදෙනු ලබන ස්ථානය හා සේවයේ ස්වභාවය |
|---|---|---|---|---|
| 1 | පී සංජීව ප්‍රේමලාල් මහතා | පරිඝනක යෙදුම් සහකාර | පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය | ශ්‍රී.ලං.ස.වි.වි./මෘදුකාංග නඩත්තුව |
| 2 | එච් ජානක සී සෙනරත් මහතා | කාර්මික නිලධාරි | පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය | ශ්‍රී.ලං.ස.වි.වි./දෘඩාංග නඩත්තුව |
| 3 | ඩී ඒ චතුරංග මහතා | කම්කරු | පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය | පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය |

සමස්ත විශ්වවිද්‍යාලයේ ම සියළුම මධ්‍යස්ථාන, අංශ සහ කාර්යාලවලට අමතරව සියළුම පීඨයන් හි පරිඝනක මධ්‍යස්ථානවල මෘදුකාංග හා දෘඩාංග සම්බන්ධයෙන් ඇති වන ගැටළු සොයා බලා විසඳීමත් එම ගැටළු සම්බන්ධයෙන් අදාල වගකිවයුතු පාර්ශවයන් දැනුවත් කිරීමත් පරිඝනක යෙදුම් සහකාරවරයාගේ සහ කාර්මික නිලධාරිවරයාගේ වගකීම වේ. ඒ අනුව, සංජීව ප්‍රේමලාල් මහතා සහ එච් ජේ සී සෙනරත් මහතා එම කටයුතුවල නියැලී සිටින අතර පරිගණක යන්ත්‍ර/උපකරණවල දෝෂ සොයා බලා ඒවා අලුත්වැඩියා කිරීම පිළිබඳව අදාළ බලධාරීන් වෙත වාර්තා කිරීමට ද කටයුතු කරති.

**වර්තමාන තත්ත්වය**

වර්තමානයේදී පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ප්‍රධාන වශයෙන් ම ඒ ඒ පීඨවල ඉල්ලීම පරිදි, සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ සමාජීය විද්‍යා අධ්‍යයනාංශයේ තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලා හා සුළු පරිඝනක වැඩසටහන්, කළමනාකරණ අධ්‍යයන පීඨයේ විවිධ අධ්‍යයන අංශවල තොරතුරු තාක්ෂණයට අදාළ විෂයයන් හා ප්‍රායෝගික පුහුණු කටයුතු සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ආගණන හා තොරතුරු පද්ධති උපාධි වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ. අන්තර්ජාල හා වෙබ් සේවා වැනි වෙනත් තොරතුරු තාක්ෂණ සේවාවන් මුළු විශ්වවිද්‍යාලයීය ප්‍රජාවටම සපයනු ලැබේ. ඊට අමතරව පුස්තකාල පද්ධතිය, IP දුරකථන පද්ධතිය, IP කැමරා පද්ධතිය, රැහැන් රහිත ජාලය (Wireless network) ආදී වෙනත් පාර්ශ්වයන්ට අයත් ජාලයන් ක්‍රියාත්මක කිරීම/ නඩත්තු කිරීම සඳහා ද පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය සිය සහාය ලබා දෙයි.

මේ වන විට පීඨ බොහොමයක් පරිඝනක තාක්ෂණයට අදාළ ස්වකීය අධ්‍යයන වැඩසටහන් පවත්වාගෙන යාම සඳහා තම ගොඩනැගිලි සංකීර්ණ තුළම පරිඝනක මධ්‍යස්ථාන පිහිටුවා ඇත. එබැවින් දැනට තිබෙන පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඒ ඒ පීඨවල අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම සඳහා තවදුරටත් අවශ්‍ය නොවන අතර, ඒ වෙනුවට අනධ්‍යයන හා පරිපාලන සේවකයින් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණයට අදාළ අවශ්‍යතා ඉටුකිරීම ආදී වශයෙන් මධ්‍යස්ථානයෙන් ලබා දෙන සේවය පුළුල් කිරීම සඳහා මෙම ගොඩනැගිලි භාවිතා කළ හැක. කෙසේ වුවද, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් ද මෙවැනි පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

පීඨවලට අයත් පරිඝනක මධ්‍යස්ථාන පහේම පරිගණක තාක්ෂණයට අදාළ අධ්‍යයන කටයුතු අධීක්ෂණය කිරීමට අමතරව වෙබ් අඩවි, විද්‍යුත් ඉගෙනුම් කටයුතු, DNS, විද්‍යුත් තැපැල්, පුස්තකාල පද්ධතිය, ශිෂ්‍ය තොරතුරු සේවා ආදී ජාල සේවා සැපයීමට අවශ්‍ය සර්වර (servers) මෙන්ම ජාලවල දෝෂ නිවැරදි කිරීමට අදාළ සේවා ඇතුළු ව විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පුළුල් පරිගණක ජාලය ද (campus-wide network) නඩත්තු කරනු ලබන්නේ පරිඝනක මධ්‍යස්ථානය විසිනි.

2013 වර්ෂයේ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය වෙත වෙන් කරන ලද ඒකාබද්ධ අරමුදල්වලින් තොරතුරු තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් හා අධ්‍යාපනික වැඩ සටහන් සම්බන්ධයෙන් ප්‍රගතියක් ළඟා කර ගත හැකි විය. මෙම අරමුදල් මගින් Internet bandwidth හි අගය 20 Mpbs සිට 100 Mbps දක්වා වැඩිකර ගැනීමටත් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත පරිඝනක පහසුකම් ලබා දීමටත් හැකි විය.

විශ්වවිද්‍යාලය තුළ අන්තර්ජාල සේවා සඳහා ඇති අධික ඉල්ලුම හේතු කොට ගෙන කලාප පළල (bandwidth) අගය 225 Mpbs දක්වා වැඩිකිරීමට අන්තර්ජාල සැපයුම්කරුවන් ඉල්ලීම් කර ඇති අතර, ඒ අනුව ප්‍රකාශ තන්තුවල (fiber backbone) අභ්‍යන්තර කලාප පළල (bandwidth) ඉහළ නැංවීමට පරිගණක මධ්‍යස්ථානය යෝජනා කර ඇත.

ශිෂ්‍යයන් සඳහා වඩාත් හොඳ ඉගෙනුම් පරිසරයක් ලබා දීමේ පරමාර්ථයෙන්, නොමිලේ Wi-Fi පහසුකම් ලබා දීම පිණිස සියළුම පීඨවල නිදහස් Wi-Fi කලාප පිහිටුවා තිබේ.

එසේම වාර්ෂික සැලසුමට අනුකූලව විශ්වවිද්‍යාලය විසින් නව පරිඝනක 200 කට වඩා මිලදී ගෙන ඇති අතර ඒවා විශ්වවිද්‍යාලයීය පරිගණක ජාලයට සම්බන්ධ කිරීමට පරිගණක අධ්‍යයන මධ්‍යස්ථානය විසින් සහාය ලබා දෙනු ලැබේ.

### 3.2.6 විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පුළුල් පරිගණක ජාලය (Campus-Wide Network)

විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පරිගණක ජාලය පරිඝනක අධ්‍යයන මධ්‍යස්ථානය මගින් මෙහෙයවනු ලැබේ. මෙම මෙහෙයම් කුටියේ පරිපාලනය භාරව ඇත්තේ පරිඝනක මධ්‍යස්ථානයේ සහකාර ජාල කළමනාකරුවන් වෙතය. මෙම මෙහෙයුම් කුටිය Cisco routers, Proxy Server, DNS Server, Cisco for subnet switch, web

servers, e-mail server, e-learning server, virus guard server (centralized server) ආදියෙන් සමන්විත වේ. 2014 වර්ෂයේදී Proxy, DNS සහ e-learning යන මෙහෙයුම් පද්ධති තුනෙහි තත්ත්වය උසස් කිරීම තුළින් ජාලකරණ කටයුතු සහ විද්‍යුත් ඉගැන්වීම් ක්‍රමවේදය වැඩිදියුණු කිරීමට හැකි විය. මෙහෙයුම් කුටිය පරිඝනක මධ්‍යස්ථානයේ වෙනම කුටියක සිට පවත්වාගෙන යාම නිසා එහි සුරක්ෂිත බව වඩාත් තහවුරු වී ඇති අතර නඩත්තුව ද පහසු වී ඇත. එසේම 20 KVA ජෙනරේටරයක් මගින් අතිරේක බලශක්තියක් නිපදවීම තුළින් හා 20 KVA UPS පද්ධතියක් භාවිතා කිරීම මගින් පරිගණක ජාල පද්ධතියේ ක්‍රියාකාරිත්වය සතියේ දින 7 හි ම පැය 24 පුරාම බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි වී ඇත.

විශ්වවිද්‍යාලයේ සියළුම පීඨ දැන් විශේෂ සංඥා පද්ධතියකින් (fiber optic backbone) එකිනෙක හා අභ්‍යන්තරිකව සම්බන්ධ වී ඇති අතර මෙය ඊළඟ වසරේදී වඩාත් තත්ත්වයෙන් උසස් කිරීමට නියමිත ය. මේ වන විට අපගේ අන්තර්ජාල සේවාවේ අන්තර්ජාල ශක්‍යතාව 225Mbps වන අතර භෞතික සම්බන්ධතා ජාලය සංඥා 100Mbps ක් හැසිරවීමට සමත් අන්තර්ජාල ශක්‍යතාවයකින් යුක්තය.

### 3.2.7 2017 වර්ෂය සඳහා අරමුණු

I. ප්‍රකාශ තන්තු වැඩිදියුණු කිරීමට (fiber upgrade) සමගාමීව, විශ්වවිද්‍යාලයීය ජාලය තුළ layer 3 වර්ගයේ ස්විච ස්ථාපිත කරමින් ජාල ආකෘතියේ වෙනස්කම් සිදු කිරීමට පරිගණක මධ්‍යස්ථානය විසින් යෝජනා කරන ලදී. ජාලය තුල පවතින තදබදය හා මන්දගාමී බව අඩු කිරීම සඳහා ජාලය තුළ පවතින විවිධ දත්ත වර්ග (විශේෂයෙන්ම අභ්‍යන්තර සන්නිවේදනය සඳහා භාවිතා කරන දුරකථන මගින් නිපදවන දත්ත හා වෙනත් රැහැන් රහිත උපකරණ මගින් නිපදවන දත්ත) වෙන් වෙන් ව ගමන් කරවීමට ජාල කළමනාකරුවන්ට මෙමගින් හැකියාව ලැබෙනු ඇත. මෙම ක්‍රියාවලිය සඳහා දැනට පවතින ධාරිතාවයට වැඩි ධාරිතාවයකින් යුත් ස්විච සවි කළ යුතු ව ඇති අතර, එම සම්පූර්ණ කර්තව්‍යය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වන හෙයින්, එය කොටස් වශයෙන් නිම කිරීමට පරිගණක මධ්‍යස්ථානය තීරණය කර තිබේ.

II. විශ්වවිද්‍යාලය සඳහා යාවත්කාලීන තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම

III. පද්ධතිය භාවිතා කරන්නන් හඳුනාගැනීම හා තහවුරු කිරීම සඳහා සර්වරයක් ස්ථාපිත කිරීම

IV. IPV6 තාක්ෂණය සර්වර සඳහා ස්ථාපිත කිරීම

V. තාක්ෂණික ඇගයීම් කමිටු පැවැත්වීම

VI. වෙනත් රාජ්‍ය ආයතනවලට උපදේශන සේවා ලබා දීම

VII. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම

VIII. පීඨ, මධ්‍යස්ථාන හා කාර්යාල සම්බන්ධතා ජාලය ස්ථාපනය/පුළුල් කිරීම

IX. පවතින පුළුල් සම්බන්ධතා ජාලය නඩත්තු කිරීම සඳහා තාක්ෂණික නිලධාරීන් බඳවා ගැනීම

X. CCTV කැමරා පද්ධතිය ප්‍රධාන ජාලයෙන් වෙන් කර වෙනම ජාලගත කිරීම

XI. පීඨවල හා කාර්යාලවල ඉල්ලීම පරිදි IP දුරකථන පද්ධතිය පුළුල් කිරීම

XII. IP දුරකථන පද්ධතිය බාහිර ජාලවලට සම්බන්ධ කිරීම

XIII. යෝජිත පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සඳහා ජාල නිර්මාණය

XIV. විශ්වවිද්‍යාලය සඳහා වැඩි පහසුකම් සහිත නව වෙබ් අඩවියක් නිර්මාණය කර එළි දැක්වීම

XV. නිවැරදි තීරණ ගැනීමට පහසුවන පරිදි ජාල අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම

| අරමුණ | ප්‍රගතිය |
|---|---|
| I. | සිදු කෙරෙමින් පවතී – තව ස්ව්ච මිලදී ගත යුතු ය. |
| II. | වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී. |
| III. | සම්පූර්ණ කරන ලදී. |
| IV. | සම්පූර්ණ කරන ලදී. |
| V. | වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී. |
| VI. | වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී. |
| VII. | වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී. |
| VIII. | වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී. |
| IX. | මෙතෙක් සම්පූර්ණ කර නැත- මේ සඳහා සුදුසු අයෙකු බඳවාගත යුතුය. |
| X. | සම්පූර්ණ කරන ලදී. |
| XI. | සම්පූර්ණ කරන ලදී. |
| XII. | මෙතෙක් සම්පූර්ණ කර නැත - යෝජනාවට අනුමැතිය ලැබී ඇත. විශ්වවිද්‍යාලයේ දැනට පවතින ජාලය වැඩිදියුණු කිරීමේ කටයුතු සම්පූර්ණ වන තුරු සිටී. |
| XIII. | සම්පූර්ණ කරන ලදී. |
| XIV. | සම්පූර්ණ කරන ලදී- අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සඳහා යොමු වී ඇත. |
| XV. | සම්පූර්ණ කරන ලදී. |

## 3.3 ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය

### 3.3.1 කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ | - ඩබ්ලිව්.ඒ.ලලිත් රෝහණ මයා |
| උපදේශකවරු | - බී.කේ.සමන්තා ප්‍රින්සි ලාලනි මිය |
| | - ජී.එස්.කේ.බෝපිටිය මයා |
| | - පී.ඩී.ඩී.අයි.ගුණතිලක මයා |
| ලිපිකරු | - ආර්.ඒ.භාග්‍යා නිරංජලී ප්‍රසංගිකා මිය |
| පිට්ටනිකරු | - ඊ.බී.එච්.පී.හේවගේ මයා |
| | - එන්.ඒ.ජේ.එස්.සමරතුංග මයා |
| පිහිනුම් තටාක සහායක | - ඩබ්. ආරියදාස මයා |
| කම්කරු | - පී.ආර්. නන්දසේන මයා |

### 3.3.2 වාර්ෂික වැඩසටහන්

ශාරීරික අධ්‍යාපන අධ්‍යයනාංශය 2017 වර්ෂය තුළ පහත ක්‍රියාකාරකම්වල නිරත විය:

- අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා උළෙල - 2017 මැයි 06 සිට 2017 සැප්තැම්බර් 24 දක්වා
- 2017 අගෝස්තු 12 හා 13 දිනයන්හි දී අන්තර් විශ්වවිද්‍යාලයීය දැල් පන්දු තරඟාවලිය සංවිධානය කිරීම
- සුහද ක්‍රීඩා තරග සංවිධානය කිරීම හා හොකී, රග්බි, බේස්බෝල්, පැසි පන්දු, පාපන්දු සහ අත්පන්දු, එල්ලේ, කැරම් හා ක්‍රිකට් තරඟ ආදී ආරාධිත තරඟාවලීන්ට සහභාගී වීම.

### 3.3.3 ජයග්‍රහණ

***<u>අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගවලින් ලද ජයග්‍රහණ</u>***

- පාපන්දු (කාන්තා) - ප්‍රථම ස්ථානය
- මලල ක්‍රීඩා (සමස්ත) - ප්‍රථම ස්ථානය
- ටයිකොන්ඩෝ (කාන්තා) - ප්‍රථම ස්ථානය
- කරාතේ (පිරිමි) - ප්‍රථම ස්ථානය
- මාර්ග ධාවන තරඟය - තුන්වන ස්ථානය
- මේස පන්දු (කාන්තා) - සිව් වන ස්ථානය
- බර එසවීම - හය වන ස්ථානය

***<u>ජාතික මට්ටමින් ලද ජයග්‍රහණ</u>***

| | | |
|---|---|---|
| 29 වන ජාතික යෞවන ක්‍රීඩා උළෙල | -ඩී.ඩී.වී.සෙනෙවිරත්න (මීටර 400) | - තුන්වන ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (පැසිපන්දු) | -ඊ.ක්‍රිෂාන්ත් | - තුන්වන ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (වුෂු) | -ඩබ්ලිව්.එම්.වී.ඩී.චතුරංග | - ප්‍රථම ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (ටයිකොන්ඩෝ) | -වී.එච්.කේ.ඩී.ඩග්ලස් | - ශූරතාවය |
| කණිෂ්ඨ ජාතික ශූරතාවලිය ( මීටර 10000) | -ටී.ආර්.එස්. ප්‍රියදර්ශනී | - තුන්වන ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (බැඩ්මින්ටන්) | -ඕෂධී කුරුප්පු | - ප්‍රථම ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (ටයිකොන්ඩෝ) | - ආර්.එම්.ඩී.තාරක | - දෙවන ස්ථානය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (ටයිකොන්ඩෝ) | - එල්.එල්.ඩී.කේ.මීගොඩ | - ශූරතාවය |
| XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (ටයිකොන්ඩෝ) | - ඒ.එම්.එල්.බී.හේරත් | - ශූරතාවය |

- XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (අත් පන්දු) - ඩී.එච්.වී.කෞෂල්‍යා - දෙවන ස්ථානය
- XLIII ජාතික මහා ක්‍රීඩා උළෙල (අත් පන්දු) - එච්.ආර්.එස්.ප්‍රනාන්දු - ප්‍රථම ස්ථානය
- Kukkiwon කුසලාන ජාතික ටයිකොන්ඩෝ ශූරතාවය -ඩබ්ලිව්.පී.එන්.ටී.ලක්මාල් - දෙවන ස්ථානය

***ජාත්‍යන්තර මට්ටමින් ලද ජයග්‍රහණ***

2017 අගෝස්තු 19 සිට 30 දක්වා තායිපේ නගරයේ පැවති 29 වන ලෝක විශ්වවිද්‍යාල ගිම්හාන තරඟ සඳහා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් පහත සිසුන් සහභාගි විය.

**මලල ක්‍රීඩා (පිරිමි)**

| | |
|---|---|
| 01. කේ.ඒ. කොට්ටහච්චි | - 14/AS/SM/012 |
| 02. ඩබ්ලිව්.එම්.එස්.එස්.විජේසුන්දර | - 12/AS/SM/029 |
| 03. ජී.එච්.සී.කුෂාන්ත | - 14/AS/SM/013 |
| 04. එන්.එම්.සී.සී.නවසිංහ | - 13/AS/PE/015 |
| 05. ජී.ආර්.සී.කුලරත්න | - 12/AS/SM/013 |
| 06. ජී.වී.උදයංග | - 13/AS/SM/022 |

**මලල ක්‍රීඩා (කාන්තා)**

| | |
|---|---|
| 01. කේ.එම්.අයි.ජයලත් | - 13/AS/SM/033 |
| 02. ආර්.එම්.එස්.කේ.රත්නායක | - 13/AS/SM/047 |
| 03. ජී.වී.එච්.වත්සලා කුමාරි | - 14/As/SM/032 |
| 04. ජේ.ඒ.ඩී.ජයරත්න | - 14/AS/PE/023 |

**බැඩ්මින්ටන් (කාන්තා)**

| | |
|---|---|
| 01. ඕෂධී කුරුප්පු | -13/AS/SM/037 |

**ටයිකොන්ඩෝ (පිරිමි)**

| | |
|---|---|
| 01. ඩබ්ලිව්.පී.එන්.ටී.ලක්මාල් | - 12/AS/PE/008 |

**ටෙනිස් (කාන්තා)**

| | |
|---|---|
| 01. එම්.එල්.පී.සුරවීර | - 12/MS/244 |

- දකුණු ආසියානු ක්‍රීඩා උළෙල (පාපන්දු) - එස්.ජී.එස්.එස්.සුබසිංහ - සහභාගිත්වය
- 02 වන ආසියානු අත්පන්දු ශූරතාවය (23න් පහළ) - ඩී.එච්.වී.කෞෂල්‍යා - සහභාගිත්වය
- 02 වන ආසියානු අත්පන්දු ශූරතාවය (23න් පහළ) - එච්.ආර්.එස්. ප්‍රනාන්දු - සහභාගිත්වය

### 3.3.4 ශාරීරික හා අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් පවත්වන ලද වෙනත් විශේෂ වැඩ සටහන්

### වර්ණ රාත්‍රිය - 2017

2017 දෙසැම්බර් මස 15 වන දින විශ්වවිද්‍යාලයේ හය වන වර්ණ රාත්‍රිය ඉතා වර්ණවත් අයුරින් සමාජීය විද්‍යා හා භාෂා පීඨ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.සුනිල් ශාන්ත මහතාගේ විශේෂ අනුග්‍රාහකත්වය යටතේ ශාරීරික හා අධ්‍යාපන අධ්‍යයනාංශයත්, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා උපදේශන කමිටුවත් එක්ව මෙම කටයුත්ත සංවිධානය කරනු ලැබිණ.
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න මෙම වර්ණ රාත්‍රියේ ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අතර පොදු රාජ්‍ය මණ්ඩලයීය ක්‍රීඩා තරගාවලියේ මල්ලවපොර රිදී පදක්කම්ලාභී මංජු වන්නිආරච්චි මහතා ආරාධිත ක්‍රීඩකයා වශයෙන් සහභාගි විය.

මෙම උත්සවයේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 126 දෙනෙකු වෙත විශ්වවිද්‍යාල වර්ණ ප්‍රදානය කෙරුණු අතර, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් දැක්වූ දස්කම් පදනම් කරගෙන පහත නම් සඳහන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හොඳම මලල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ලෙස පිදුම් ලැබූහ.

2016 වර්ෂය - ඩී.එම්.එස්.ඩී. කරුණාරත්න මයා
ඕෂධී කුරුප්පු මෙනවිය

2017 වර්ෂය - ජේ.ඒ.ඩී.ජයරත්න මෙනවිය



ඩබ්ලිව්.පී.එන්.ටී. ලක්මාල් මයා



# 04. අධ්‍යයන මධ්‍යස්ථාන

## 4.1 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

**2017 වසරේදී වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්**

- **සාර්ථක විශ්වවිද්‍යාල ජීවිතයක් සඳහා පෞද්ගලික දැක්මක හා මෙහෙවරක අවශ්‍යතාවය**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශන මධ්‍යස්ථානය හා එක්ව 2017 පෙබරවාරි 22 දින "සාර්ථක විශ්වවිද්‍යාල ජීවිතයක් සඳහා පෞද්ගලික දැක්මක හා මෙහෙවරක අවශ්‍යතාවය" පිළිබඳව දේශනයක් පවත්වන ලදී. සමාජීය විද්‍යා හා භාෂා පීඨ ශ්‍රවණාගාරයේ පැවති මෙම වැඩමුළුව පවත්වන ලද්දේ විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක දීපාල් විජේසේකර මහතා විසිනි.

- **මානසික සැහැල්ලුව පිළිබඳ වැඩමුළුව**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශන මධ්‍යස්ථානය හා එක්ව 2017 මාර්තු 03 දින "මානසික සැහැල්ලුව" පිළිබඳව දේශනයක් හා ප්‍රායෝගික සැසියක් පවත්වන ලදී. සමාජීය විද්‍යා හා භාෂා පීඨ ශ්‍රවණාගාරයේ පැවති මෙම වැඩමුළුව පවත්වන ලද්දේ විශ්වවිද්‍යාලයේ වෘත්තීය උපදේශක දීපාල් විජේසේකර මහතා විසිනි.

- **පෞරුෂ සංවර්ධන වැඩසටහන**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය හා Image Consultants ආයතනය එක්ව 2017 ජූලි 05 දින පෙ.ව. 8.30 සිට ප.ව. 5.30 දක්වා කොළඹ රේණුකා හෝටලයේ දී පෞරුෂ සංවර්ධන වැඩසටහනක් පවත්වන ලදී. CEAT කැලණි ටයර් සමාගම විසින් මෙම වැඩමුළුවට අනුග්‍රාහකත්වය දක්වන ලද අතර Image Consultants ආයතනය විසින් මේ සඳහා පහසුකම් සලසන ලදී.

මෙම වැඩසටහනේදී පෞද්ගලික ප්‍රතිභාව වර්ධනය කර ගන්නා ආකාරය, මනා සනීපාරක්ෂක පිළිවෙත්, සුදුසු ඇඳුම් පැළඳුම්, සමාජ හා ව්‍යාපාරික පිළිවෙත්, ආහාර ගැනීමේදී අනුගමනය කළ යුතු පිළිවෙත් හා සම්මුඛ පරීක්ෂණයකට සාර්ථකව මුහුණ දෙන ආකාරය පිළිබඳව අවධානය යොමු කරන ලදී. කළමනාකරණ අධ්‍යයන පීඨය, කෘෂි විද්‍යා පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය හා සමාජීය විද්‍යා හා භාෂා පීඨය නියෝජනය කරමින් උපාධි අපේක්ෂකයන් 37 දෙනෙක් මෙම වැඩසටහනට සහභාගී වූහ. Image Consultants ආයතනයේ අධ්‍යක්ෂ නයනා කරුණාරත්න මහත්මිය හා එම ආයතනයේ සාමාන්‍යාධිකාරී ඉරුෂි අලුවිහාරේ මෙනෙවිය මෙහිදී සැසි පැවැත්වූහ.

- **ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය විසින් ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරිය සමඟ එක් ව පවත්වන ලද ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි තෙවන අදියර 2017 සැප්තැම්බර් 18 දින කළමනාකරණ අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණ. ජාතික ව්‍යාපාර සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ලක්ෂ්මන් විජයවර්ධන මහතා විසින් වැඩසටහන ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් අතර ව්‍යවසායකත්ව සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. උපාධිධාරී ව්‍යවසායක උදානය ලෙස නම් කරන ලද මෙම වැඩසටහනට ඉන්දියාවේ තිරුපති හි ශ්‍රී පද්මාවතී මහිලා විශ්වවිද්‍යාලයේ, කාන්තා අධ්‍යයන මධ්‍යස්ථානයේ ආචාර්ය උමා දේවී මහත්මිය ද සම්පත් දායිකාවක් ලෙස සහභාගි වූවාය.

- **"ඔබ අසිරිමත්" පෞරුෂ සංවර්ධන වැඩසටහන**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සමඟ එක්ව, "ඔබ අසිරිමත්" යන තේමාව යටතේ පෞරුෂ සංවර්ධන වැඩසටහනක් සංවිධානය කරන ලදී. උපාධි අපේක්ෂකයන්ගේ වෘත්තීය සංවර්ධනය අරමුණු කර ගත් මෙම වැඩසටහන 2017 දෙසැම්බර් 07 හා 08 යන දෙදින ව්‍යවහාරික විද්‍යා පීඨයේදී පැවැත්විණ.

- **බාහිර පුහුණු වැඩසටහන (OBT)**

විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය විසින් 2017 දෙසැම්බර් 18 හා 19 යන දෙදින මාතලේ, නාඋල පිහිටි ජාතික යොවුන් සේනාංකයේදී බාහිර පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. විශ්වවිද්‍යාලයීය වෘත්තීය මාර්ගෝපදේශක ඒකකය විසින් දියත් කරනු ලබන "වෘත්තීය සංවර්ධනය සඳහා ජීවන කුසලතා සංවර්ධනය" යන වැඩසටහන් මාලාව යටතේ පවත්වන ලද මෙම බාහිර පුහුණු වැඩසටහන සඳහා කළමනාකරණ අධ්‍යයන පීඨය, ව්‍යවහාරික විද්‍යා පීඨය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය හා භූ විඥාපන පීඨය නියෝජනය කරමින් තෝරා ගනු ලැබූ උපාධි අපේක්ෂකයන් හැට දෙනෙක් සහභාගී වූහ.

## 4.2 විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

### 4.2.1 ඉතිහාසය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ බාහිර ඒකකයේ ඉතිහාසය, විශ්වවිද්‍යාලය ආරම්භ වීමට ද පෙර, එනම් 1992 වර්ෂය තෙක් දිව යන්නකි.

මුල් කාලීනව මෙම ඒකකය ප්‍රදේශයේ තරුණ පිරිසට රැකියාභිමුඛ සහතිකපත් පාඨමාලා සැපයීම අරමුණු කරගත් ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක විය.

1996 වර්ෂයේ දී ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසුව, ප්‍රදේශයේ ජනතාවට පුළුල් ක්ෂේත්‍රයක සහාය හා මාර්ගෝපදේශනය සැපයීමේ අපේක්ෂාවෙන් විශ්වවිද්‍යාලය යටතට ගත් මෙම මධ්‍යස්ථානය 2000 වර්ෂයේ දී EDPESU ලෙස නම් කරන ලදී.

### 4.2.2 කළමනාකරණ කමිටු සාමාජිකයන්

| | | |
|---|---|---|
| මහාචාර්ය එම්.සුනිල් ශාන්ත | - | උපකුලපති (කමිටු සභාපති)<br>(2017.05.19 සිට) |
| මහාචාර්ය චන්දන පී උඩවත්ත | - | උපකුලපති (කමිටු සභාපති)<br>(2017.05.18 දක්වා) |
| මහාචාර්ය අතුල ඥානපාල | - | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය<br>(2017.09.12 සිට) |
| මහාචාර්ය ආර්.එම්.ඩබ්ලිව්.රත්නායක | - | පීඨාධිපති, කළමනාකරණ අධ්‍යයන පීඨය<br>(2017.09.11 දක්වා) |
| ආචාර්ය මනෝජ් ආරියරත්න | - | පීඨාධිපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨය |
| ආචාර්ය එච්.එස්.ආර්.රොසයිරෝ | - | පීඨාධිපති, කෘෂි විද්‍යා පීඨය |
| එම්.එෆ්.හිබතුල් කරීම් මයා | - | ලේඛකාධිකාරි<br>(2017.11.14 දක්වා) |
| කමල් ගුණවර්ධන මයා | - | වැ.බ. ලේඛකාධිකාරි<br>(2017.11.15 සිට) |
| කේ.ඒ.ආර්.එස්.ජයකොඩි මයා | - | මූල්‍යාධිකාරී |
| ඩී.ජාසිංහ මයා | - | අධ්‍යක්ෂ, විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය<br>(කමිටු ලේකම්) |
| ජී. බුද්ධානන්ද ස්වාමීන් වහන්සේ | - | පත් කළ සාමාජික |
| ආචාර්ය රවීන්ද්‍ර ජයසේකර | - | පාලක සභා සාමාජික |
| එන්.එස්.එම්.පී.රංජිත් මයා | - | පාලක සභා සාමාජික |
| ආචාර්ය ජී.ඩී.කේ.කුමාර | - | සභාපති, කෘෂි විද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලය |
| ආචාර්ය ජයලත් බී ඒකනායක | - | සභාපති, ව්‍යවහාරික විද්‍යා පීඨ අධ්‍යයන මණ්ඩලය |
| ආචාර්ය අරුණ ශාන්ත | - | සභාපති, සමාජීය විද්‍යා හා භාෂා පීඨ අධ්‍යයන මණ්ඩලය |
| ආචාර්ය එම්.එස්.එම්.අස්ලාම් | - | සභාපති, කළමනාකරණ අධ්‍යයන පීඨ අධ්‍යයන මණ්ඩලය |
| එන් සුබෝධිනී මෙනවිය | - | සහකාර ලේඛකාධිකාරී, විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (2017.10.26 දක්වා) |
| ජී.ඒ.ඩී.එම්.තේන්නකෝන් මයා | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය (2017.10.27 සිට) |
| අයෝමි ද සිල්වා මිය | - | සහකාර මූල්‍යාධිකාරී, විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය |

### 4.2.3 ස්ථිර කාර්ය මණ්ඩලය

පරිගණක යෙදුම් සහකාර - 02
ලිපිකරු - 01
පෙර පාසල් සහකාර - 01
යන්ත්‍ර ක්‍රියාකරු - 01
කම්කරු - 02

### 4.2.4 උපාධි පාඨමාලා, උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා හා සහතිකපත්‍ර පාඨමාලා

1. කෘෂි ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී (බාහිර) උපාධි පාඨමාලාව- 2017 වසර තුළ නව බඳවා ගැනීම් සිදු නොවීය.
2. ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව
3. ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව
4. ඉංග්‍රීසි ඩිප්ලෝමාව
5. පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව
6. ව්‍යාපාර කළමනාකරණ ඩිප්ලෝමාව
7. සමාජ සංවර්ධන හා සුභ සාධන ඩිප්ලෝමාව
8. මෘදුකාංග ඉංජිනේරු ඩිප්ලෝමාව
9. සංචාරක හා ආගන්තුක සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමාව
10. මූල්‍ය කළමනාකරණ ඩිප්ලෝමාව
11. ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව
12. පරිගණක හා තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව
13. වෙබ් අඩවි සැකසීම හා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
14. AutoCAD සහතික පත්‍ර පාඨමාලාව
15. පරිගණක ජාල ස්ථාපනය හා නඩත්තු කිරීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

## 4.3 ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය

**හැඳින්වීම:**

ආදිවාසී ජන අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි කටයුතු හැදෑරීමට උනන්දුවක් දක්වන අය සඳහා පහසුකම් සැලසීමේ අරමුණෙන්, සබරගමුව විශ්වවිද්‍යාලයේ ආදිවාසී ජන අධ්‍යයන කේන්ද්‍රය 2006 දෙසැම්බර් 18 වන දින පිහිටුවන ලදී. ඒ අනුව, පශ්චාත් උපාධි ඩිප්ලෝමා, දර්ශනපති හා ආචාර්ය උපාධි යන පාඨමාලා තුන මෙම අධ්‍යයන කේන්ද්‍රය මගින් හඳුන්වා දෙන ලදී. ඕනෑම ක්ෂේත්‍රයක අපේක්ෂකයින්ට ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ඕනෑම රටක ජන අධ්‍යයනයට අදාළව ඉහත පාඨමාලා හැදෑරීමට මෙම කේන්ද්‍රය මගින් දිරි ගන්වනු ලැබේ. ශිෂ්‍ය සංඛ්‍යාව අවුරුදු පතා ඉහළ නංවා ගැනීමත්, නියමිත කාලය තුළ ම ප්‍රමාදයකින් තොරව අදාල පර්යේෂණ උපාධි සම්පූර්ණ කරගැනීම පිණිස අපේක්ෂකයින් අභිප්‍රේරණය කිරීමත් කේන්ද්‍රයේ අභිමතාර්ථය යි.

**2017 වර්ෂයේ ජයග්‍රහණ**

- නිබන්ධන සඳහා මාර්ගෝපදේශ සංශෝධනය කිරීම
- එක් දර්ශනපති නිබන්ධනයක් හා ආචාර්ය උපාධි නිබන්ධන දෙකක් ඇගයීම
- උපාධි අපේක්ෂකයෙකු ආචාර්ය උපාධිය සඳහා උසස් කිරීම පිණිස ප්‍රගති සමාලෝචනයක් පැවැත්වීම
- එක් දර්ශනපති නිබන්ධනයක් හා ආචාර්ය උපාධි නිබන්ධන දෙකක් ඇගයීම
- එක් පශ්චාත් උපාධි ඩිප්ලෝමා නිබන්ධනයක් ඇගයීම
- දර්ශනපති පාඨමාලාවේ පළමු වසර විභාගය පැවැත්වීම
- දර්ශනපති උපාධි අපේක්ෂකයෙකු සඳහා සම්මුඛ පරීක්ෂණයක් (Viva Voce) පැවැත්වීම
- ආචාර්ය උපාධි අපේක්ෂකයෙකු සඳහා සම්මුඛ පරීක්ෂණයක් (Viva Voce) පැවැත්වීම
- දර්ශනපති හා ආචාර්ය උපාධි අපේක්ෂකයන් සඳහා ප්‍රගති සමාලෝචන පැවැත්වීම
- අන්තර්ජාල සඟරා හා වෙබ් අඩවිය එළි දැක්වීම

## 4.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

### 2017 වර්ෂයේ පවත්වනු ලැබූ වැඩසටහන්

| දිනය | වැඩසටහනේ නම | කථිකාචාර්යවරයා/වරියගේ නම | කවුරුන් සඳහා පැවැත්වීද යන වග |
|---|---|---|---|
| 2017.03.30 | සමාරම්භක උළෙල ප.ව. 1. 00 | උපකුලපති හා සියලුම පීඨාධිපතිවරු ලේඛකාධිකාරී අධ්‍යක්ෂ/ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| | ❖ වැඩසටහන් ඉලක්ක හා අරමුණු<br>❖ ස්වයං-හැඳින්වීම<br>❖ වැඩසටහන් අරමුණු හා සහභාගීවූවන්ගේ අපේක්ෂා සැසඳීම | ආචාර්ය එම්. නිර්මලී වික්‍රමරත්න අධ්‍යක්ෂ/ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | |
| 2017.03.31 | ❖ විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳව හැඳින්වීමක්<br>❖ 21 වන සියවසේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ<br>❖ විශ්වවිද්‍යාල පනත හා ආඥා පනත | එම්.එෆ්.එච්. කරීම් මයා/ ලේඛකාධිකාරී/ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| | ❖ ඉගැන්වීම පිළිබඳ දර්ශනය | ආචාර්ය එන්.පරණවිතාන | |
| 2017.04.01 | ❖ විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුගේ වගකීම්<br>❖ විශ්වවිද්‍යාල හා කර්මාන්ත අතර සංවාද ගොඩනැගීම හා පවත්වාගෙන යාම | ආචාර්ය එම්. නිර්මලී වික්‍රමරත්න අධ්‍යක්ෂ/ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | |
| | ❖ පාඩම් සැලසුම් කිරීම | ඒ.එල්.සී.ජනිත ලියනගේ මයා/ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| 2017.04.06 | ❖ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා සංවිධාන ව්‍යුහය<br>❖ වෘත්තීය ඉලක්ක හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය | මහාචාර්ය චන්දන පී. උඩවත්ත / උපකුලපති /ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| 2017.04.07 | ❖ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ඉගැන්වීම් ක්‍රමවේද<br>❖ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ඇගයීම් ක්‍රමවේද<br>❖ ඉගැන්වීමේදී හා ඉගෙනීමේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙවලම්වල කාර්යභාරය | ආචාර්ය ඊ.එම්.යූ.ඩබ්ලිව්. ජයලත් බී. ඒකනායක / ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| 2017.04.08 | ❖ වාර සඟරා හා වෙනත් ලේඛන පුස්තකාලයෙන් සොයා ගැනීම | ටී.එන්.නෙයිසූරි මිය/ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| | ❖ පුහුණු අවශ්‍යතා හා ඉලක්ක කණ්ඩායම | ඒ.එල්.සී.ජනිත ලියනගේ මයා / ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017.04.21 | ❖ විශ්වවිද්‍යාල පරිපාලන හා මූල්‍ය රෙගුලාසි හා කාර්ය පරිපාටි පිළිබඳ හැඳින්වීමක් | කේ.ඒ.ආර්.එස්.ජයකොඩි මයා/ මූල්‍යාධිකාරී/ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| | ❖ විශ්වවිද්‍යාල සේවකයන්ගේ අයිතිවාසිකම් හා වගකීම්, විනය කටයුතු සහ මානව හිමිකම් | ආචාර්ය ප්‍රතිභා මහානාම | |
| 2017.04.22 | ❖ සමාජ ඇගයීම් හා වෘත්තීය සංවර්ධනය සඳහා පර්යේෂණවල කාර්යභාරය | ආචාර්ය ඉනෝකා කුඩාවිදානගේ | |

| | | | |
|---|---|---|---|
| | ❖ පර්යේෂණවලට අදාළ ආචාරධර්ම පිළිබඳ ගැටළු | | |
| | ❖ ශාස්ත්‍රඥයෙකු ලෙස වෘත්තීය කඩඉම්වලට පිවිසීම | මහාචාර්ය ආර්.එම්.උදය රත්නායක | |
| 2017.04.28-30 | ❖ ඉගෙනුම් මට්ටම් හා ඉගෙනුම් ප්‍රතිඵල<br>❖ ඉගෙනුම් ශෛලීන් හා ඉගෙනුම් න්‍යායන්<br>❖ ඉගෙනුම් ක්‍රමවේද<br>❖ ඇගයීම් හා පිරිඇගයීම් පිළිබඳ හැඳින්වීමක්<br>❖ සමාකලනීය හා විධිමත් ඇගයුම්<br>❖ ඇගයුම් ක්‍රමවේද හා ප්‍රශ්න වර්ග<br>❖ පිළිතුරුපත් ලකුණු කිරීමේ මාර්ගෝපදේශ,<br>❖ ආදර්ශ පිළිතුරු හා ඇගයුම් නිර්ණායක පත්‍ර | ආචාර්ය වාලින්ද බෙනරගම | |
| 2017.05.06 සහ 2017.05.07 | ❖ වෙනස්වීම් සඳහා බලපෑම්, වෙනස්වීමට ඇති ප්‍රතිරෝධයන් හා විෂයමාලා සංවර්ධනය: වෙනස් කිරීම සඳහා බලපෑම්,<br>❖ වෙනස් කිරීමට ඇති ප්‍රතිරෝධයන් හා සාර්ථකත්ව සාධක<br>❖ උපාධිධාරී ගුණාංග හා තොරතුරු<br>❖ ප්‍රතිඵල පදනම් කර ගත් විෂයමාලා සංවර්ධන ආකෘතිය<br>❖ නිර්මාණාත්මක පෙළ ගැස්ම හා සමෝධානික පාඨමාලා/වැඩසටහන් සැලසුම් | මහාචාර්ය දීප්ති බණ්ඩාර | |
| 2017.05.19 | ❖ විද්‍යාත්මක ලේඛන හා අත් පිටපත් සැකසීම | මහාචාර්ය ලාල් විදානආරච්චි | |
| | ❖ ආතති කළමනාකරණය<br>❖ මෘදු කුසලතා, චින්තාපර පරිචය හා චිත්තවේගික බුද්ධිය | ආචාර්ය ජේ. වෙල්ගම / සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩසටහන සඳහා තෝරාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017.05.20 | ❖ අධ්‍යයන හා පෞද්ගලික උපදේශනය | ආචාර්ය ජේ. වෙල්ගම/ සමාජීය විද්‍යා හා භාෂා පීඨය | |
| | ❖ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ඉගැන්වීම් ක්‍රමවේද<br>❖ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් කරගත් ඇගයීම් ක්‍රමවේද<br>❖ ඉගැන්වීමේදී හා ඉගෙනීමේදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙවලම්වල කාර්යභාරය | ආචාර්ය ඊ.එම්.යූ.ඩබ්ලිව්.ජයලත් බී.ඒකනායක/ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| 2017.05.26 | ❖ ස්ත්‍රී පුරුෂ සමානත්වය හා සමානාත්මතාවය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය | ආචාර්ය සමන් හඳරාගම | |
| | ❖ ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩලය වෙත ධනාත්මක ප්‍රතිපෝෂණයක් ලබා දීම | මහාචාර්ය අයි. යාපා/ කෘෂි විද්‍යා පීඨය | |
| 2017.06.01 | ❖ විශ්වවිද්‍යාල විභාග කාර්ය පරිපාටි | එම්.ලලිත් වර්ණසූරිය මයා / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | |
| 2017.06.15 | ❖ තෘප්තිමත් ජීවිතයක් සඳහා ආත්ම ශක්තිය වර්ධනය කිරීම | මහාචාර්ය එම්.එස්.එම්. අස්ලාම් | |
| 2017.06.22 | ❖ කාල කළමනාකරණය හා කණ්ඩායම් වැඩ | එම්.එෆ්.එච්. කරීම් මයා | |
| | ❖ පර්යේෂණ යෝජනා හා සැලසුම්<br>❖ විමර්ශන ශෛලීන් | ආචාර්ය ඉනෝකා කුඩාවිදානගේ | |

| | | | |
|---|---|---|---|
| 2017.06.23 | ❖ විශ්වවිද්‍යාල ආයතනවල උපායමාර්ගික සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ හැඳින්වීමක් (පැය 06) | මහාචාර්ය එච්. අබේගුණවර්ධන | |
| 2017.06.29 | ❖ පාඩමක් ඉගැන්වීම / ඉගැන්වීම් පරිචය (න්‍යාය) | | |
| 2017.06.30 | ❖ පාඩමක් ඉගැන්වීම / ඉගැන්වීම් පරිචය (ප්‍රායෝගික) | | |
| 2017 මාර්තු 28-30 | ❖ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පරිගණක කුසලතා - කණ්ඩායම් 02ක් සඳහා තෙදිනක වැඩමුළුව (සැසි 02) | නෙවිල් රත්නායක මයා, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017 මාර්තු 06 | ❖ උපදේශන වැඩමුළුව | ආචාර්ය සෙව්වන්දි ජයකොඩි, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ ශිෂ්‍ය උපදේශකවරුන් |
| 2017 මාර්තු 20 හා 21 | ❖ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සංඛ්‍යාන විශ්ලේෂණය | මහාචාර්ය එස්. සමිත, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017 අගෝස්තු 02 | ❖ සංක්‍රාන්තිය යුක්තිය පිළිබඳ වැඩමුළුව | සාම මණ්ඩලය | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017 සැප්තැම්බර් 13 හා 14 | ❖ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පෞරුෂය හා වෘත්තීය ප්‍රතිභාව වර්ධනය කර ගැනීම (වැඩමුළු 02 කි.) | ඔරිෆ්ලේම් ස්වීඩනය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| 2017 ඔක්තෝබර් 16 හා 17 | ❖ "විගණන කාර්ය පරිපාටි හා ප්‍රසම්පාදන කාර්ය පරිපාටි" පිළිබඳ වැඩමුළුව | එස්.සී.මායාදුන්නේ මයා එස්.එම්. සුහයිර් මයා | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හා එක් පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් |
| 2017 ඔක්තෝබර් 26 | ❖ ප්‍රසිද්ධ කථාව පිළිබඳ වැඩමුළුව : "ඔබ තුළ ඇති කථිකයා අනාවරණය කර ගන්න" | සයිඩ් නවුෂාඩ් මයා | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හා එක් පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් |
| 2017 නොවැම්බර් 02 | ❖ මනා කාර්යාල ක්‍රම හා ආචාර ධර්ම පිළිබඳ වැඩමුළුව | පියතිස්ස රණසිංහ මයා | අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් |
| දැනට පවත්වාගෙන යනු ලැබේ. | ❖ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන්<br>❖ මාස 02කට වරක් පවත්වනු ලැබේ. | එම්.එෆ්.එච්. කරීම් මයා සහ කණ්ඩායම | පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් |

## 05. ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව -දේශීය සිසුන්

### 5.1 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම්

| පීඨය | අධ්‍යයන වැඩසටහන | බඳවාගත් වර්ෂය | බඳවා ගැනීමට එකඟ වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | පාඨමාලාව හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 85 | 65 | 65 |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 60 | 45 | 45 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්‍ෂණය විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 50 | 29 | 29 |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 50 | 19 | 19 |
| | භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 50 | 30 | 30 |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 100 | 86 | 86 |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 50 | 49 | 49 |
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 50 | 51 | 51 |
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 80 | 75 | 75 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 290 | 291 | 291 |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 2015/2016 | 70 | 67 | 67 |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | 2015/2016 | 225 | 290 | 290 |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | 2015/2016 | 25 | 21 | 21 |

| පීඨය | අධ්‍යයන වැඩසටහන | බඳවාගත් වර්ෂය | බඳවා ගැනීමට එකඟ වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | පාඨමාලාව හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 100 | 106 | 106 |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 60 | 65 | 65 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්‍ෂණය විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 60 | 60 | 60 |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 60 | 52 | 52 |
| | භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 60 | 28 | 28 |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 100 | 102 | 102 |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 50 | 51 | 51 |
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 50 | 49 | 49 |
| භූවිඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 100 | 98 | 98 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 300 | 292 | 292 |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 2016/2017 | 70 | 70 | 70 |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | 2016/2017 | 225 | 212 | 212 |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | 2016/2017 | 25 | 24 | 24 |
| | අතිරේක බඳවා ගැනීම් | 2016/2017 | 95 | තවම ලියාපදිංචි වී නොමැත. | |
| එකතුව | | | **1355** | තවම ලියාපදිංචි වී නොමැත. | **1209** |

## 5.2 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | බඳවාගත් වර්ෂය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් බඳවා ගැනීම (දේශීය සිසුන්) | | | වෙනත් බඳවා ගැනීම * | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පිරිමි | කාන්තා | එකතුව | පිරිමි | කාන්තා | එකතුව |
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 1 වසර | 2015/2016 | 12 | 53 | 65 | | | |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 9 | 36 | 45 | | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්‍ෂණය විද්‍යාවේදී උපාධිය | | | 14 | 15 | 29 | | | |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 6 | 12 | 18 | | | |
| | භෞතිය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 15 | 15 | 30 | | | |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | | | 47 | 39 | 86 | | | |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | | | 23 | 26 | 49 | | | |
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | | | 29 | 22 | 51 | | | |
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | 64 | 11 | 75 | | | |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | | | 104 | 185 | 289 | | | |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | | | 32 | 35 | 67 | | | |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | | | 39 | 245 | 284 | | | |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | | | 1 | 20 | 21 | | | |
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2 වසර | 2014/2015 | 27 | 57 | 84 | | | |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 0 | 0 | 0 | | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්‍ෂණය විද්‍යාවේදී උපාධිය | | | 15 | 13 | 28 | | | |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 9 | 14 | 23 | | | |
| | භෞතිය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 23 | 21 | 44 | | | |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | | | 52 | 27 | 79 | | | |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | | | 24 | 21 | 45 | | | |
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | | | 18 | 18 | 36 | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | 60 | 13 | 73 | | | |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | | | 108 | 180 | 288 | | | |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | | | 31 | 35 | 66 | | | |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | | | 46 | 254 | 300 | | | |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | | | 0 | 24 | 24 | | | |
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 3 වසර | 2013/2014 | 22 | 50 | 72 | | | |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 0 | 0 | 0 | | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්ෂණය විද්‍යාවේදී උපාධිය | | | 8 | 19 | 27 | | | |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 11 | 40 | 51 | | | |
| | භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 23 | 20 | 43 | | | |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | | | 39 | 21 | 60 | | | |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | | | 26 | 25 | 51 | | | |
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | | | 27 | 20 | 47 | | | |
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | 36 | 14 | 50 | | | |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | | | 109 | 167 | 276 | | | |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | | | 29 | 45 | 74 | | | |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | | | 52 | 180 | 232 | | | |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | | | 2 | 20 | 22 | | | |
| කෘෂි විද්‍යා පීඨය | කෘෂි විද්‍යා විද්‍යාවේදී උපාධිය | 4 වසර | 2012/2013 | 17 | 54 | 71 | | | |
| | ආහාර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 0 | 0 | 0 | | | |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | ආහාර විද්‍යා හා තාක්ෂණය විද්‍යාවේදී උපාධිය | | | 5 | 13 | 18 | | | |
| | ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 14 | 30 | 44 | | | |
| | භෞතීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | 21 | 19 | 40 | | | |
| | පරිගණක හා තොරතුරු පද්ධති විද්‍යාවේදී උපාධිය | | | 54 | 36 | 90 | | | |
| | ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණය විද්‍යාවේදී උපාධිය | | | 29 | 23 | 52 | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශාරීරික අධ්‍යාපනය විද්‍යාවේදී උපාධිය | | | 26 | 30 | 56 | | | |
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | 53 | 3 | 56 | | | |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | කළමනාකරණ අධ්‍යයන විද්‍යාවේදී උපාධිය | | | 84 | 175 | 259 | | | |
| | සංචාරක හා සත්කාරක කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | | | 35 | 32 | 67 | | | |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | | | 51 | 179 | 230 | | | |
| | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | | | 0 | 0 | 0 | | | |
| **එකතුව** | | | | **1581** | **2606** | **4187** | | | |

## 06. ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - විදේශීය සිසුන්

### 6.1 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා නව බඳවා ගැනීම් - විදේශීය සිසුන්

| පීඨය | අධ්‍යයන වැඩසටහන | බඳවාගත් වර්ෂය | රට | ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| භූ විඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | 2015/2016 | මාලදිවයින | 1 |

### 6.2 ප්‍රථම උපාධි (අභ්‍යන්තර) සඳහා ලියාපදිංචි මුළු විදේශීය සිසුන් සංඛ්‍යාව

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අධ්‍යයන වර්ෂය | රට | බඳවාගත් වර්ෂය | ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පිරිමි | කාන්තා | එකතුව |
| භූවිඥාපන පීඨය | මැනුම් විද්‍යා විද්‍යාවේදී උපාධිය | 1 වසර | මාලදිවයින | 2015/2016 | 1 | - | 1 |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී උපාධිය | 4 වසර | උගන්ඩාව | 2012/2013 | 1 | - | 1 |
| මුළු එකතුව | | | | | **2** | **-** | **2** |

## 07. පශ්චාද් උපාධි සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව

### 7.1 පශ්චාද් උපාධි සඳහා නව බඳවා ගැනීම් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - දේශීය සිසුන්

| පීඨයේ නම | අධ්‍යයන වැඩසටහන | පූර්ණ කාලීන/අර්ධ කාලීන | නව බඳවා ගැනීම් (2017 ජනවාරි-දෙසැම්බර්) | | | ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (2017 දෙසැම්බර් 31 දිනට) | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | පිරිමි | කාන්තා | එකතුව | පිරිමි | කාන්තා | එකතුව |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | | | | | | | | |
| | **පශ්චාද් උපාධි ඩිප්ලෝමා** | | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | | 1 | _ | 1 | 1 | _ | 1 |
| | **පශ්චාද් උපාධි (විද්‍යාපති, ශාස්ත්‍රපති, ව්‍යාපාර පරිපාලනපති, .......)** | | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනපති උපාධිය | | 19 | 14 | 33 | 19 | 14 | 33 |
| | ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | | 20 | 20 | 40 | 36* | 28* | 64 |
| | මැනුම් විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | | 30 | 3 | 33 | 30 | 3 | 33 |
| | **දර්ශනපති උපාධි** | | | | | | | |
| | කෘෂි විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය | | 2 | _ | 2 | 2 | _ | 2 |
| | ආගණන හා තොරතුරු පද්ධති පිළිබඳ දර්ශනපති උපාධිය | | 5 | 1 | 6 | 5 | 1 | 6 |
| | මානව ශාස්ත්‍ර පිළිබඳ දර්ශනපති උපාධිය | | 1 | 1 | 2 | 1 | 1 | 2 |
| | භෞතිය හා ස්වභාවික විද්‍යා පිළිබඳ දර්ශනපති උපාධිය | | 3 | 6 | 9 | 3 | 6 | 9 |
| | ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය | | 2 | 1 | 3 | 2 | 1 | 3 |
| | **වෛද්‍ය මණ්ඩලයේ සහතිකය සහිත වෛද්‍ය ආචාර්ය උපාධිය** | | | | | | | |
| | නැත | | | | | | | |
| | **වෛද්‍ය මණ්ඩලයේ සහතිකය රහිත වෛද්‍ය ආචාර්ය උපාධිය** | | | | | | | |
| | නැත | | | | | | | |
| | **ආචාර්ය උපාධි** | | | | | | | |
| | මානව ශාස්ත්‍ර පිළිබඳ ආචාර්ය උපාධිය | | 1 | - | 1 | 1 | - | 1 |
| | **මුළු එකතුව** | | **84** | **46** | **130** | **100** | **54** | **154** |

*2015 කණ්ඩායමම ද ඇතුළුව (පිරිමි සිසුන් 16 හා කාන්තා සිසුන් 08)

# 08. විභාග පිළිබඳ විස්තර

## 8.1 ප්‍රථම උපාධි පිළිබඳ විස්තර - අභ්‍යන්තර සිසුන්

**විභාග දත්ත (2017 ජනවාරි - දෙසැම්බර්) (2017 ජනවාරි - දෙසැම්බර් දක්වා පවත්වන ලද සියලුම විභාගවල ප්‍රතිඵල)**

| පීඨය | අධ්‍යයන වැඩසටහන | අවසාන විභාගය පැවැත්වූ දිනය (වර්ෂය හා මාසය) | විභාගය බලපැවැත්වෙන දිනය (වර්ෂය හා මාසය) | පළමු වර පෙනී සිටීමක් ද /නැවත පෙනී සිටීමක් ද යන වග | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් බඳවා ගත් වර්ෂය | අවසාන විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධිය සම්පූර්ණ කළ ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | පළමු පෙළ සාමාර්ථ | | දෙවන පෙළ (ඉහළ) සාමාර්ථ | | දෙවන පෙළ (පහළ) සාමාර්ථ | | සාමාන්‍ය සාමාර්ථ | | එකතුව | |
| | | | | | | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| කෘෂි විද්‍යා හා කළමනාකරණ පීඨය | විද්‍යාවේදී (විශේෂ) | 2017/නොවැම්බර් | 2017/නොවැම්බර් | පළමු වර | 2011/12 | 32 | 59 | - | 01 | 01 | 15 | 14 | 38 | 14 | 01 | 29 | 55 |
| | විද්‍යාවේදී (විශේෂ) | 2017/ජූනි | 2017/ජූනි | නැවත | 2010/11 | - | 01 | - | - | - | - | - | 01 | - | - | - | 01 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 2017/නොවැම්බර් | 2017/මාර්තු | 2017/මාර්තු | පළමු වර | 2011/12 | 62 | 83 | 01 | 02 | 09 | 15 | 22 | 43 | 30 | 22 | 62 | 82 |
| | විද්‍යාවේදී (විශේෂ) | 2017/සැප්තැම්බර් | 2017/සැප්තැම්බර් | නැවත | 2010/11 | 09 | - | - | - | 01 | - | 01 | - | 07 | - | 09 | - |
| | සාමාන්‍ය | 2017/ජූනි | 2017/ජූනි | නැවත | 2012/13 | - | 01 | - | - | - | - | - | 01 | - | - | - | 01 |
| | සාමාන්‍ය | 2017/දෙසැම්බර් | 2017/දෙසැම්බර් | නැවත | 2005/06 | 01 | - | - | - | - | - | - | - | 01 | - | 01 | - |
| භූ විඥාපන පීඨය | විද්‍යාවේදී (විශේෂ) | 2017/සැප්තැම්බර්-ඔක්තෝබර් | 2017/සැප්තැම්බර් | පළමු වර | 2011/12 | 58 | 20 | - | 03 | 04 | 05 | 22 | 10 | 29 | 02 | 55 | 20 |
| කළමනාකරණ අධ්‍යයන පීඨය | විද්‍යාවේදී (විශේෂ) | 2017/නොවැම්බර් | 2017/නොවැම්බර් | පළමු වර | 2011/12 | 106 | 184 | 01 | 04 | 05 | 17 | 26 | 96 | 73 | 65 | 105 | 182 |
| | විද්‍යාවේදී (විශේෂ) | 2017/මැයි | 2017/මැයි | නැවත | 2010/11 | 15 | - | - | - | - | - | 01 | - | 14 | - | 15 | - |
| සමාජීය විද්‍යා හා භාෂා පීඨය | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 2017/මැයි | 2017/මැයි | පළමු වර | 2012/13 | 08 | 19 | - | - | - | - | - | 06 | 01 | 06 | 01 | 12 |
| | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) | 2017/මැයි | 2017/මැයි | නැවත | 2011/12 | 02 | 05 | - | - | - | 01 | - | 01 | 02 | 03 | 02 | 05 |
| පුස්තකාල පොත් හා වාර සඟරා | | 10,808,044 | - | - | 16,520,238 |
| මෝටර් වාහන | | 28,602,965 | - | - | 27,409,248 |
| සන්නිවේදන උපකරණ | | 9,117,519 | - | - | 7,358,325 |
| උපාධි ලෝගු | | 681,180 | - | - | 361,700 |
| වෙනත් උපකරණ | | 20,116,895 | - | - | 19,594,278 |
| | | **2,102,692,581** | **-** | **-** | **2,729,313,289** |

| | සටහන් | 2017 | නැවත සංශෝධනය කළ 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **අස්පෘශ්‍ය වත්කම්** | **11** | | |
| **පරිගණක මෘදුකාංග** | | | |
| **පිරිවැය:** | | | |
| ආරම්භක ශේෂය | | 13,327,143 | - |
| එකතු කිරීම් | | - | 13,327,143 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 13,327,143 | 13,327,143 |
| **සමුච්චිත ක්‍රමක්ෂය:** | | | |
| ආරම්භක ශේෂය | | 2,665,429 | - |
| ප්‍රවර්ථන වර්ෂයේ ක්‍රමක්ෂය | | 2,665,429 | 2,665,429 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | 5,330,858 | 2,665,429 |
| **ශුද්ධ පොත් අගය** | | **7,996,285** | **10,661,714** |

**12**

**කෙරීගෙන යන වැඩ- ප්‍රාග්ධන කාර්යයන්**

| | | | |
|---|---|---|---|
| කෙරීගෙන යන වැඩ- පුනරුත්ථාපන | | 4,364,254 | 2,866,266 |
| කෙරීගෙන යන වැඩ- පරිපාලන | | 1,517,543 | 1,517,543 |
| කෙරීගෙන යන වැඩ- වෙනත් | | 6,636,029 | 10,574,405 |
| කෙරීගෙන යන වැඩ- තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල | | 1,819,966 | 1,819,966 |
| කෙරීගෙන යන වැඩ- වලව II අදියර | | - | 1,170,661 |
| කෙරීගෙන යන වැඩ- සිංහරාජ | | - | 5,080,499 |
| කෙරීගෙන යන වැඩ- කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස සංකීර්ණය | | 2,712,000 | 2,225,451 |
| කෙරීගෙන යන වැඩ- භූ විඥාපන පීඨය II අදියර | | - | 25,621,510 |
| කෙරීගෙන යන වැඩ- ස්ථාවර වත්කම් ලේඛනය | | 1,888,300 | 687,500 |
| කෙරීගෙන යන වැඩ- ඉඩම් අත්පත් කර ගැනීම් | | 3,212,500 | 3,212,500 |
| කෙරීගෙන යන වැඩ- විදුලි ජනන යන්ත්‍රය | | - | 2,298,101 |
| වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ පිරිවැය | | 500,000 | - |
| කෙරීගෙන යන වැඩ- පුස්තකාල ගොඩනැගිල්ල | | 484,957 | - |
| | | **23,135,549** | **57,074,402** |
| | | | |
| **උපචිත වියදම්** | **14** | | |
| උපචිත වියදම් -පුනරාවර්තන | | 70,548,313 | 56,744,201 |
| උපචිත වියදම් -ප්‍රාග්ධන | | 80,385,581 | 19,740,559 |
| | | **150,933,894** | **76,484,760** |
| | | | |
| **ගෙවිය යුතු දෑ** | **15** | | |
| විවිධ ණයහිමියෝ | | 70,478,571 | 70,478,571 |
| නොගෙවූ වැටුප් | | 64,367 | 58,367 |
| නොගෙවූ වවුචරපත් | | 142,434 | 160,637 |
| ගෙවිය යුතු ශිෂ්‍යාධාර | | - | 2,602,700 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු- පුනරාවර්තන | | 1,350 | 1,875 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු- ප්‍රාග්ධන | | 725 | 3,325 |
| උපයන විට ගෙවීමේ බද්ද -ගෙවිය යුතු | | 111,475 | - |
| | | **70,798,922** | **73,305,475** |

| | සටහන් | 2017 | නැවත සංශෝධනය කළ 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| <u>**නිදහස් කළ යුතු තැන්පතු හා අරමුදල්**</u> | **16** | | |
| කාර්ය මණ්ඩල ආරක්ෂණ තැන්පතු | | 207,175 | 207,175 |
| ගිවිසුම්වල 10% රඳවා ගැනීම් | | 69,724,801 | 36,413,239 |
| නේවාසිකාගාර කුලී රඳවා ගැනීම් | | 59,400 | 59,400 |
| ටෙන්ඩර්වලට අදාළ තැන්පතු | | 190,328 | 240,128 |
| උපාධි ලෝගු සඳහා තැන්පතු | | 59,400 | - |
| ගෙවිය යුතු විවිධ තැන්පතු | | 1,402,315 | 1,077,027 |
| ලංසු ඇපකර | | 1,583,338 | 2,691,645 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | | 36,591,056 | 28,207,756 |
| කාර්යසාධන බැඳුම්කර | | 800,168 | 892,560 |
| විදේශීය ශිෂ්‍යයන්ගේ ශිෂ්‍යත්ව | | 772,115 | - |
| නිදහස් කළ යුතු පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු | | 5,270,150 | 2,583,450 |
| විලම්භිත ආදායම් - විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | | 7,283,170 | 8,545,200 |
| විලම්භිත ආදායම් - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | | 5,283,950 | - |
| | | **129,227,366** | **80,917,580** |

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| <u>**විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම්**</u> | **17** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | 133,535,281 | 109,563,273 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | | 44,458,934 | 26,275,041 |
| | | 177,994,215 | 135,838,314 |
| වර්ෂය තුළ ගෙවීම් | | (3,564,990) | (2,303,033) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | **174,429,225** | **133,535,281** |

<u>**ලංකා බැංකුවේ කල්බදු වගකීම**</u> **18**

| | වසරක් තුළ | වසරකට වැඩි | එකතුව | 2016 |
|---|---|---|---|---|
| ලංකා බැංකුව-කල්බදු දීමනාකරු | 7,724,958 | 5,128,950 | 12,853,908 | 21,423,180 |
| (-) අවිනිශ්චිත පොලිය | (844,314) | (122,711) | (967,025) | (2,546,287) |
| | **6,880,644** | **5,006,239** | **11,886,883** | **18,876,893** |

**19**

**<u>ප්‍රාග්ධන ප්‍රදාන</u>**

| | | |
|---|---|---|
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | 1,804,770,758 | 1,723,360,153 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රදාන- කාන්තා ශිෂ්‍ය නේවාසිකාගාර දෙකක් සඳහා | 792,055,706 | 374,000,304 |
| JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ) ප්‍රදාන - භාෂා විද්‍යාගාරය -සමාජීය විද්‍යා හා භාෂා පීඨය | 5,000,000 | 10,000,000 |
| QEF ප්‍රදාන - IRQUE ව්‍යාපෘතිය | 6,362,989 | 7,098,825 |
| IBG ප්‍රදාන - IRQUE ව්‍යාපෘතිය | 3,534,270 | 4,016,615 |
| වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 21,817,405 | 13,624,865 |
| ඉඩම් සඳහා ප්‍රාග්ධනය | 7,500,000 | 7,500,000 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | 3,626,292 | 5,095,101 |
| පර්යේෂණ ප්‍රදාන-ස්පෘෂ්‍ය වත්කම් | 548,789 | 795,614 |
| HETC ප්‍රදාන | 31,146,715 | 47,846,427 |
| සබරගමුව පළාත් සභාවෙන් ලද ප්‍රදාන- අභ්‍යන්තර මාර්ග | 3,055,174 | 3,055,174 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | 20,674,251 | - |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ශිෂ්‍යයන් සඳහා ලද ප්‍රදාන | 77,208 | - |
| | **2,700,169,557** | **2,196,393,078** |

| | සටහන් | 2017 | නැවත සංශෝධනය කළ 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **<u>අනෙකුත් සංචිත</u>** | **20** | | |
| වත්කම් ප්‍රත්‍යාගණන ගිණුම | | 58,761,861 | 58,761,861 |
| පශු සම්පත් ප්‍රත්‍යාගණන ගිණුම | | - | - |
| | | **58,761,861** | **58,761,861** |
| **<u>සමුච්චිත අතිරික්තය/ඌණතාවය</u>** | **21** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | | (242,118,054) | (285,866,170) |
| පෙර වර්ෂ ගැලපීම් | | (1,962,477) | 16,846,100 |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ඌණතාවය | | (90,808,260) | 26,902,016 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | | **(334,888,790)** | **(242,118,054)** |
| **<u>සීමා කළ අරමුදල්</u>** | **22** | | |
| උපකුලපති අරමුදල | | 7,644,617 | 6,258,052 |
| රන් පදක්කම් අරමුදල | | 1,039,500 | 979,500 |
| බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම් | | 29,935,352 | 24,463,138 |
| පශ්චාද් උපාධි පාඨමාලා (ආදිවාසී ජන අධ්‍යයන) | | 274,875 | 345,625 |

| | | |
|---|---|---|
| විශ්වවිද්‍යාල කර්මාන්ත ප්‍රජාව | 735,980 | 735,980 |
| ක්‍රීඩා සංවර්ධන අරමුදල | 192,500 | 192,500 |
| ව්‍යවසායකත්වය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 692,905 | 692,905 |
| සහයෝගිතා ව්‍යාපෘතිය | 1,676,971 | 2,361,088 |
| ජලයේ ගුණත්වය පිළිබඳ නියැදි පරීක්ෂා ව්‍යාපෘතිය | - | 52,668 |
| වාර්ෂික මැනුම් කඳවුර ව්‍යාපෘතිය | 162,242 | - |
| කෘෂිකර්ම සංවර්ධනය සඳහා උපදේශන සේවා | - | 26,802 |
| නුවරඑළිය EIA ව්‍යාපෘතිය | 267,113 | - |
| ලංකා කුරුඳු අගයදාමය | 4,205,524 | - |
| කලාත්මක සරඹ ඩිප්ලෝමා පාඨමාලාව | 188,500 | 188,500 |
| ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ අරමුදල | 1,612,380 | 462,725 |
| ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව | - | 20,000 |
| බෝපත් ඇල්ල ව්‍යාපෘතිය | 359,000 | - |
| විදුලි කම්බි පිළිබඳ කෙටි පාඨමාලාව | - | 225,000 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 2,400,000 | - |
| | **51,387,458** | **37,004,483** |

| | සටහන් | 2017<br>රු. | නැවත සංශෝධනය කළ<br>2016<br>රු. |
|---|---|---|---|
| **ශිෂ්‍යාධාර හා මහපොළ** | **23** | | |
| ශිෂ්‍යාධාර | | 49,933,300 | 51,589,800 |
| මහපොළ | | 75,993,650 | 57,906,800 |
| | | **125,926,950** | **109,496,600** |
| | | | |
| **ස්වයං ජනන ආදායම් පාඨමාලාවල ආදායම** | **24** | | |
| විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ වැඩසටහන්වල ආදායම | | 39,686,092 | 33,257,120 |
| ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව | | 664,000 | 614,151 |
| ආදිවාසී ජන අධ්‍යයන වැඩසටහන | | 1,078,250 | 420,274 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ආදායම | | 10,663,710 | - |
| | | **52,092,052** | **34,291,545** |

| | | | |
|---|---|---|---|
| **වෙනත් ආදායම්** | **25** | | |
| ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි අපේක්ෂකයන්) | | 1,197,940 | 1,133,220 |
| ලියාපදිංචි ගාස්තු (පශ්චාද් උපාධි අපේක්ෂකයන්) | | - | 61,000 |
| විභාග ගාස්තු (ප්‍රථම උපාධි අපේක්ෂකයන්) | | 82,706 | 89,606 |
| ණය සහ අත්තිකාරම් පොලී | | 3,011,209 | 2,582,014 |
| ආයෝජන පොලී | | 4,410,279 | 2,296,390 |
| පැරණි තොග විකිණීම | | 30,150 | 482,820 |
| නිෂ්පාදන විකිණීම | | 2,182,217 | 2,215,080 |
| දේපල කුලී ආදායම් | | 1,671,632 | 1,491,719 |
| වෛද්‍ය ගාස්තු | | 977,675 | 838,223 |
| පුස්තකාල දඩ මුදල් | | 125,618 | 146,062 |
| ප්‍රතිපූරණයන් | | - | 2,653 |
| සහායක ක්‍රියාකාරකම් | | 1,714,910 | 1,119,900 |
| විවිධ ලැබීම් | | 10,322,357 | 16,395,214 |
| | | **25,726,691** | **28,853,900** |

| | | | |
|---|---|---|---|
| **විලම්භිත ආදායම්** | **26** | | |
| විලම්භිත ආදායම් - ප්‍රාග්ධන ප්‍රදාන | | 255,706,855 | 195,182,035 |
| විලම්භිත ආදායම් - IRQUE QEF ප්‍රදාන | | 735,836 | 735,836 |
| විලම්භිත ආදායම් - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රදාන | | 1,468,809 | 1,552,361 |
| විලම්භිත ආදායම් - මෝටර් වාහනය | | - | 1,600,000 |
| විලම්භිත ආදායම් - මෝටර් වාහනය | | - | 467,901 |
| විලම්භිත ආදායම් - IRQUE IBG | | 482,345 | 482,345 |
| විලම්භිත ආදායම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | 45,160,811 | 22,000,000 |
| විලම්භිත ආදායම් -JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය) | | 5,000,000 | 5,000,000 |
| විලම්භිත ආදායම් - පරිත්‍යාග | | 2,954,623 | 2,827,937 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද විලම්භිත ආදායම් ප්‍රදාන | | - | 609,872 |
| විලම්භිත ආදායම් - පර්යේෂණ ප්‍රදාන -ස්පෘෂ්‍ය වත්කම් | | 562,378 | 265,205 |
| විලම්භිත ආදායම් HETC | | 16,699,712 | 18,792,388 |
| විලම්භිත ආදායම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් පුස්තකාල පොත් සඳහා ලද ප්‍රදාන | | 19,302 | - |
| විලම්භිත ආදායම් - නේවාසිකාගාර ලීබඩු උපකරණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | | 5,168,563 | |
| | | **333,959,234** | **249,515,880** |

| මූළ වියදම | සටහන් | 2017 | නැවත සංශෝධනය කළ 2016 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **පුද්ගලික වේතන** | | | |
| අධ්‍යයන | 27 - A | | |
| වේතන හා වැටුප් | | 165,798,405 | 120,931,482 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | | 31,623,090 | 25,500,446 |
| විශ්‍රාම වැටුප් | | 19,454,490 | 15,100,913 |
| සේවක භාරකාර අරමුදල | | 10,228,298 | 8,105,446 |
| අන්තර් දීමනාව | | 1,573,168 | 3,511,419 |
| මාසික හිලව් දීමනාව | | 445,734 | 280,388 |
| අධ්‍යයන දීමනාව | | 140,209,980 | 127,078,575 |
| සමානුපාත දීමනාව | | 11,296 | 20,520 |
| වෙනත් දීමනා | | 15,423,069 | 29,433,009 |
| බාහිර දේශකවරුන්ගේ ගාස්තු | | 22,439,891 | 19,438,149 |
| පාරිතෝෂික | | 25,071,873 | 14,840,341 |
| පර්යේෂණ දීමනාව | | 32,551,145 | 32,939,606 |
| ජීවන වියදම් දීමනාව | | 18,810,498 | 23,489,092 |
| දේපල ණය පොලී | | 4,663,228 | 4,579,648 |
| අන්තර් දීමනාව (2015-1000) | | - | 25,087,069 |
| අතිරේක දීමනා 20% | | 19,824,218 | 18,260,597 |
| | | **508,128,382** | **468,596,699** |
| | | | |
| අනධ්‍යයන | | | |
| වේතන හා වැටුප් | | 136,866,111 | 101,716,549 |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | | 16,977,340 | 11,938,385 |
| විශ්‍රාම වැටුප් | | 11,247,063 | 7,516,500 |
| සේවක භාරකාර අරමුදල | | 5,712,648 | 3,949,627 |
| රාජකාරි ආවරණය සඳහා ගෙවීම් | | 7,551 | 23,923 |
| අන්තර් දීමනාව (10%) | | 400,878 | 741,519 |
| මාසික හිලව් දීමනාව | | 30,869,333 | 17,680,556 |
| අතිකාල | | 24,005,624 | 16,728,543 |
| නිවාඩු දින වැඩ කිරීම සඳහා ගෙවීම් | | 292,990 | 83,456 |
| වෙනත් දීමනා | | 30,928,803 | 27,620,582 |
| භාෂා දීමනාව | | - | 1,800 |
| පාරිතෝෂික | | 19,534,805 | 11,734,924 |
| පර්යේෂණ දීමනාව | | 2,303,804 | 1,786,631 |
| ජීවන වියදම් දීමනාව | | 34,890,772 | 34,956,845 |
| දේපල ණය පොලී | | 2,873,065 | 3,420,723 |
| සේවක අර්ථසාධක අරමුදල 12% | | - | 246,452 |

| | | | |
|---|---|---|---|
| අන්තර් දීමනාව (2015-1000) | | - | 37,316,874 |
| අතිරේක දීමනා 20% | | 17,955,416 | 16,437,188 |
| කාර්ය මණ්ඩල වන්දි | | - | 710,775 |
| | | **334,866,201** | **294,611,851** |
| **එකතුව** | | **842,994,583** | **763,208,550** |
| **ගමන් වියදම් සහ සංයුක්ත දීමනා** | **27-B** | | |
| දේශීය | | 1,552,515 | 1,318,438 |
| විදේශීය | | 1,646,907 | 4,157,312 |
| | | **3,199,422** | **5,475,750** |
| **සැපයුම්** | **27-C** | | |
| ලිපිද්‍රව්‍ය | | 11,103,432 | 8,904,372 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | | 21,528,611 | 17,099,386 |
| නිල ඇඳුම් | | 1,652,356 | 2,492,461 |
| යාන්ත්‍රික හා විදුලි | | 4,107,090 | 3,137,494 |
| රසායනික හා වීදුරු | | 11,752,764 | 10,217,880 |
| වෛද්‍ය සැපයුම් | | 1,476,780 | 1,641,915 |
| වෙනත් සැපයුම් | | 10,446,630 | 8,386,143 |
| | | **62,067,664** | **51,879,652** |
| **නඩත්තු වියදම්** | **27-D** | | |
| වාහන | | 11,452,544 | 9,027,506 |
| පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ | | 3,950,809 | 3,408,388 |
| ගොඩනැගිල්ල හා ව්‍යුහය | | 6,279,580 | 3,007,919 |
| ලී බඩු | | 958,135 | 340,395 |
| වෙනත් | | 4,870,829 | 2,243,112 |
| | | **27,511,897** | **18,027,320** |
| **ගිවිසුම්ගත සේවා** | **27-E** | | |
| ප්‍රවාහන කටයුතු | | 826,319 | 448,101 |
| විදුලි සංදේශ කටයුතු | | 20,235,178 | 16,781,110 |
| තැපැල් ගාස්තු | | 1,594,469 | 1,413,452 |
| විදුලි බලය | | 24,689,842 | 24,861,344 |
| ආරක්ෂක සේවය | | 58,084,741 | 38,503,033 |
| ජලය | | 20,590 | - |
| පවිත්‍රතා සේවය | | 38,825,585 | 25,662,988 |
| කුලී ගාස්තු | | 13,817,215 | 14,893,324 |
| දේශීය අධිකාරීන් වෙත කරන ගෙවීම් හා බදු | | 1,016,180 | 955,797 |

| | | | |
|---|---|---|---|
| මුද්‍රණ හා ප්‍රචාරණ කටයුතු | | 6,863,936 | 8,357,719 |
| වෙනත් | | 777,985 | 645,036 |
| | | **166,752,039** | **132,521,905** |

| | | | |
|---|---|---|---|
| **<u>අනෙකුත් පුනරාවර්තන වියදම්</u>** | **27-F** | | |
| විශ්වවිද්‍යාල ආචාර්යවරු සඳහා ගමන් ගාස්තු ප්‍රදාන | | 727,857 | 51,500 |
| විශේෂ සේවා-පාලක සභාව හා කමිටු | | 1,416,118 | 878,806 |
| විශේෂ සේවා-වෘත්තිකයන් | | 5,200,186 | 4,943,893 |
| වැඩමුළු සහ සැසි | | 2,177,572 | 1,450,995 |
| අධ්‍යයන පර්යේෂණ | | 3,545,240 | 3,626,454 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | | 40,000 | 13,500 |
| නිවාඩු ගමන් බලපත්‍ර හා වාර ප්‍රවේශ පත්‍ර | | 24,200 | 60,620 |
| සංග්‍රහ වියදම් | | 5,070,954 | 3,744,725 |
| බැංකු ගාස්තු | | 179,767 | 6,780 |
| දීමනා හා හානිපූරණ | | - | 2,500 |
| දායකත්ව හා සාමාජිකත්ව ගාස්තු | | 454,109 | 1,675,652 |
| උපාධි ප්‍රදානෝත්සවය | | 1,326,306 | 4,240,581 |
| විභාග ගාස්තු | | 23,540,641 | 22,709,263 |
| වෙනත් -පුවත්පත්, සඟරා ආදිය | | 4,926,993 | 2,788,213 |
| කර්මාන්ත/ප්‍රායෝගික පුහුණු කටයුතු | | 60,000 | - |
| ශිෂ්‍ය සංවර්ධන ක්‍රියාකාරකම් | | 1,155,672 | 1,217,645 |
| විශ්වවිද්‍යාල සංවර්ධන ක්‍රියාකාරකම් | | 1,679,910 | 1,294,147 |
| ශිෂ්‍ය සුභසාධනය, කාර්ය මණ්ඩල සුභසාධනය | | 60,000 | 60,821 |
| | | **51,585,525** | **48,766,095** |

| | | | |
|---|---|---|---|
| **<u>ස්වයං ජනන ආදායම් පාඨමාලාවලට අදාළ වියදම්</u>** | **27-G** | | |
| විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ වියදම් | | 30,939,037 | 21,653,956 |
| ආයුර්වේද රෝහල් කළමනාකරණ පශ්චාද් උපාධි පාඨමාලාව | | 275,775 | 744,100 |
| ආදිවාසී ජන අධ්‍යයන පාඨමාලාව | | 290,949 | 263,050 |
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | | 7,648,618 | |
| | | **39,154,379** | **22,661,106** |

| | | | |
|---|---|---|---|
| **<u>සිසුන් සඳහා මූල්‍යමය සහාය</u>** | **27-H** | | |
| මහපොළ ශිෂ්‍යත්වය | | 75,993,650 | 57,906,800 |
| ශිෂ්‍යාධාර | | 49,761,500 | 51,589,800 |
| | | **125,755,150** | **109,496,600** |

| <u>**ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්**</u> | **27-I** | | |
|---|---|---|---|
| ගොඩනැගිලි ක්ෂය | | 156,152,909 | 122,131,539 |
| කාර්යාල හා ඉගැන්වීම් උපකරණ සඳහා ක්ෂය | | 93,633,849 | 60,664,848 |
| සන්නිවේදන උපකරණ සඳහා ක්ෂය | | 3,859,061 | 3,439,088 |
| ජල පිරිපහදු ඒකකය සඳහා ක්ෂය | | 524,546 | 524,546 |
| පුස්තකාල පොත් සඳහා ක්ෂය | | 6,778,354 | 6,090,818 |
| මෝටර් වාහනය සඳහා ක්ෂය | | 12,443,653 | 11,916,324 |
| වෙනත් උපකරණ සඳහා ක්ෂය | | 12,823,797 | 11,856,681 |
| පරිගණක උපාංග සඳහා ක්ෂය | | 38,287,221 | 31,223,220 |
| උපාධි ලෝගු සඳහා ක්ෂය | | 319,480 | 319,480 |
| මෘදුකාංග සඳහා ක්‍රමක්ෂය | | 2,665,429 | 2,665,429 |
| දැනුම වර්ධනය සඳහා ක්‍රමක්ෂය | | 4,354,601 | 4,943,043 |
| විෂයමාලා සංශෝධන පිරිවැය සඳහා ක්‍රමක්ෂය | | 413,606 | 413,606 |
| අන්තර්ජාතික සම්මන්ත්‍රණ පිරිවැය සඳහා ක්‍රමක්ෂය | | 2,601,370 | 1,910,569 |
| තත්ත්ව ආරක්ෂණ ඒකකය සඳහා ක්‍රමක්ෂය | | 2,160,833 | 556,272 |
| විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන සඳහා ක්‍රමක්ෂය | | 7,910,819 | 6,113,470 |
| | | **344,929,527** | **264,768,932** |

## ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
## 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

| ගිණුම් අංකය | | හර | බැර |
|---|---|---|---|
| 111001 | වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | | 1,804,770,757.94 |
| 111002 | QEF ප්‍රදාන - IRQUE ව්‍යාපෘතිය | | 6,362,989.45 |
| 111003 | IBG ප්‍රදාන - IRQUE ව්‍යාපෘතිය | | 3,534,269.70 |
| 111004 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | 792,055,705.94 |
| 111005 | JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය) | | 5,000,000.00 |
| 111006 | සබරගමුව පළාත් සභාවෙන් ලද ප්‍රදාන | | 3,055,174.00 |
| 111007 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | 20,674,251.40 |
| 112001 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | | 21,817,404.72 |
| 112002 | ඉඩම් සඳහා ප්‍රාග්ධනය | | 7,500,000.00 |
| 112004 | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | | 3,626,291.68 |
| 112005 | පර්යේෂණ ප්‍රදාන-ස්පෘෂ්‍ය වත්කම් | | 548,788.80 |
| 112006 | HETC ප්‍රදාන | | 31,146,715.46 |
| 112007 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ශිෂ්‍යයන් සඳහා ලද ප්‍රදාන | | 77,208.00 |
| 113006 | ලංකා බැංකුව-කල්බදු වගකීම | | 12,853,908.00 |
| 113007 | අවිනිශ්චිත පොලිය | 967,025.23 | |
| 122001 | පොදු සංචිත | 244,080,530.77 | |
| 122002 | වත්කම ප්‍රත්‍යාගණන ගිණුම | | 58,761,860.95 |
| 132006 | උපකුලපති අරමුදල | | 7,644,616.53 |
| 132007 | රන් පදක්කම් අරමුදල | | 1,039,500.10 |
| 132011 | බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම් | | 29,935,351.58 |
| 132013 | පශ්චාද් උපාධි පාඨමාලා (ආදිවාසී ජන අධ්‍යයන) | | 274,875.00 |
| 132017 | විශ්වවිද්‍යාල කර්මාන්ත ප්‍රජා සංවර්ධනය | | 735,980.00 |
| 132018 | ක්‍රීඩා සංවර්ධන අරමුදල | | 192,500.00 |
| 132020 | ව්‍යවසායකත්වය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | | 692,905.00 |
| 132022 | සහයෝගිතා ව්‍යාපෘතිය | | 1,676,970.50 |
| 132030 | වාර්ෂික මැනුම් කඳවුර ව්‍යාපෘතිය | | 162,242.00 |
| 132032 | කලාත්මක සරඹ ඩිප්ලෝමා පාඨමාලාව | | 188,500.00 |
| 133003 | ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ අරමුදල | | 1,612,380.00 |
| 133031 | ලංකා කුරුඳු අගය දාමය | | 4,205,524.35 |
| 133034 | නුවරඑළිය EIA ව්‍යාපෘතිය | | 267,112.50 |
| 133040 | බෝපත් ඇල්ල ව්‍යාපෘතිය | | 359,000.00 |
| 133041 | ශාරීරික අධ්‍යාපන ඒකකය (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන) | | 2,400,000.00 |
| 134001 | පරිත්‍යාග | | 16,382,849.73 |
| 135006 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් EDPESU වෙත කළ යුතු ගෙවීම් | | 27,916,036.95 |
| 135008 | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයෙන් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත කළ යුතු ගෙවීම් | | 749,363.07 |
| 14001 | ක්ෂය සඳහා වෙන් කිරීම් | | 843,273,176.97 |
| 14002 | කාර්යාල හා ඉගැන්වීම් උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම් | | 498,398,816.99 |
| 14004 | සන්නිවේදන උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම් | | 27,056,683.36 |
| 14005 | පරිගණක හා උපාංග සඳහා ක්ෂය වෙන් කිරීම් | | 235,879,886.14 |
| 14006 | පුස්තකාල පොත් හා වාර සඟරා සඳහා ක්ෂය වෙන් කිරීම් | | 127,181,053.28 |
| 14007 | මෝටර් වාහන සඳහා ක්ෂය වෙන් කිරීම් | | 103,017,977.35 |
| 14008 | ජල පිරිපහදු ඒකකය සඳහා ක්ෂය වෙන් කිරීම් | | 4,861,249.21 |
| 14009 | වෙනත් උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම් | | 136,345,635.57 |
| 14010 | මෘදුකාංග සඳහා ක්‍රමක්ෂය | | 5,330,857.16 |
| 14012 | උපාධි ලෝගු සඳහා ක්ෂය වෙන් කිරීම් | | 2,787,811.50 |
| 14013 | දැනුම වර්ධනය සඳහා වෙන් කිරීම් | | 10,946,973.56 |
| 14014 | විෂයමාලා සංශෝධන පිරිවැය සඳහා ක්‍රමක්ෂය වෙන් කිරීම් | | 1,065,740.77 |
| 14020 | පාරිතෝෂික වෙන් කිරීම් | | 174,429,224.89 |
| 161001 | කාර්ය මණ්ඩල ආරක්ෂණ තැන්පතු | | 207,174.62 |
| 161002A | 10% රඳවා ගැනීම් | | 69,724,801.17 |
| 161003A | ටෙන්ඩර් තැන්පතු | | 190,328.00 |

| | | | |
|---|---|---|---|
| 161004 | ලෝගු සඳහා තැන්පතු | | 59,400.00 |
| 161006 | විවිධ තැන්පතු-ගෙවිය යුතු | | 1,402,314.91 |
| 161009A | ලංසු ඇපකර | | 1,583,338.00 |
| 161013A | කාර්යසාධන බැඳුම්කර | | 800,167.59 |
| 161018 | නිදහස් කළ යුතු පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු | | 5,270,150.00 |
| 161019 | ගෙවිය යුතු මුද්දර ගාස්තු (පුනරාවර්තන) | | 1,350.00 |
| 161020 | ගෙවිය යුතු මුද්දර ගාස්තු (ප්‍රාග්ධන) | | 725.00 |
| 161021 | නේවාසිකාගාර කුලී රඳවා ගැනීම් | | 59,400.00 |
| 161022 | උපයන විට ගෙවීමේ බදු -ගෙවිය යුතු | | 111,475.36 |
| 162001 | විවිධ ණයහිමියෝ | | 70,478,570.77 |
| 162002 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | | 36,591,056.04 |
| 162003 | නොගෙවූ වැටුප් | | 64,366.89 |
| 162004 | නොගෙවූ වවුචරපත් | | 142,434.33 |
| 163001A | උපචිත ගෙවීම් - පුනරාවර්තන | | 70,548,312.83 |
| 163002A | උපචිත ගෙවීම් - ප්‍රාග්ධන | | 80,385,581.29 |
| 163005 | විලම්භිත ආදායම් (පාඨමාලා ගාස්තු) | | 7,283,169.99 |
| 163006 | විලම්භිත ආදායම් (පාඨමාලා ගාස්තු) | | 5,283,950.00 |
| 210101 | ඉඩම් | 57,295,890.41 | |
| 210102 | ගොඩනැගිලි | 3,118,583,084.75 | |
| 210103 | ජල පිරිපහදු ඒකකය | 9,113,148.26 | |
| 210201 | කාර්යාල හා ඉගැන්වීම් උපකරණ | 751,681,341.75 | |
| 210301 | පරිගණක හා උපාංග | 303,809,164.64 | |
| 210401 | පුස්තකාල පොත් හා වාර සඟරා | 143,701,291.16 | |
| 210501 | මෝටර් වාහන | 130,427,225.65 | |
| 210601 | සන්නිවේදන උපකරණ | 34,415,007.94 | |
| 210701 | උපාධි ලෝගු | 3,149,511.50 | |
| 210801 | පශු සම්පත් | 1,394,945.00 | |
| 210802 | දැනුම වර්ධනය | 15,865,106.12 | |
| 210803 | විෂයමාලා සංශෝධනය | 2,068,028.13 | |
| 210805 | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ විෂයමාලා සංශෝධන කටයුතු | 75,000.00 | |
| 210901 | වෙනත් උපකරණ | 155,939,913.60 | |
| 210902 | මෘදුකාංග | 13,327,143.00 | |
| 210903 | වෛද්‍ය පීඨය ස්ථාපනය කිරීමේ පිරිවැය | 500,000.00 | |
| 211011 | කෙරීගෙන යන වැඩ- පුනරුත්ථාපන | 4,364,254.43 | |
| 211022 | කෙරීගෙන යන වැඩ- පරිපාලන | 1,517,543.30 | |
| 211023 | කෙරීගෙන යන වැඩ- වෙනත් | 6,636,028.77 | |
| 211032 | කෙරීගෙන යන වැඩ- තොරතුරු තාක්ෂණ ගොඩනැගිල්ල | 1,819,965.56 | |
| 211036 | ස්ථාවර වත්කම් ලේඛනය (WIP) | 1,888,300.00 | |
| 211040 | කෙරීගෙන යන වැඩ-  නිල නිවාස සංකීර්ණය | 2,712,000.05 | |
| 211041 | කෙරීගෙන යන වැඩ- ඉඩම් අත්පත් කර ගැනීම් | 3,212,500.00 | |
| 211043 | කෙරීගෙන යන වැඩ- පුස්තකාල ගොඩනැගිල්ල | 484,956.52 | |
| 230102 | තොග අත්තිකාරම් ගිණුම- පුනරාවර්තන | 14,743,477.09 | |
| 230103 | තොග ගැලපුම් ගිණුම | 1,720.98 | |
| 230106 | තොග - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | 216,294.87 | |
| 230107 | තොග - මුද්‍රණ ඒකකය | 449,664.49 | |
| 230108 | තොග - කෘෂි ගොවිපොළ | 208,000.50 | |
| 230109 | තොග- වෛද්‍ය මධ්‍යස්ථානය | 1,050,375.86 | |
| 230201 | විවිධ ණය ගැතියෝ | 105,524.97 | |
| 230301 | ආපදා ණය | 64,471,878.40 | |
| 230302 | කාර්ය මණ්ඩල ණය | 766,660.00 | |
| 230303 | පරිගණක ණය | 2,940,000.00 | |
| 230304 | වාහන ණය | 7,698,456.70 | |
| 230306 | උත්සව අත්තිකාරම් | 65,200.00 | |
| 230307 | විශේෂ අත්තිකාරම් | 1,000.00 | |
| 230308 | ගංවතුර ණය | 1,972,410.00 | |
| 230310 | ණය ගැලපුම් ගිණුම | 77,899.95 | |
| 230401 | ඉන්ධන සඳහා තැන්පතු | 700,000.00 | |
| 230402 | ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව- කාර්ය මණ්ඩලය | 158,293.39 | |
| 230403 | ස්ථාවර තැන්පතු- බැඳුම්කර කඩකිරීම් | 44,813,994.34 | |
| 230404 | ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව- රන් පදක්කම් අරමුදල | 1,546,764.28 | |

| | | | |
|---|---|---|---|
| 230405 | ස්ථාවර තැන්පතු- ක්‍රීඩා සංවර්ධනය | 110,261.18 | |
| 230406 | ස්ථාවර තැන්පතු- Durham විශ්වවිද්‍යාලය | 601,194.84 | |
| 230407 | තැන්පතු- ලංකා විදුලිබල මණ්ඩලය | 1,035,500.00 | |
| 230408 | විවිධ තැන්පතු -ලැබිය යුතු | 3,786.85 | |
| 230409 | ස්ථාවර තැන්පතු- මහජන බැංකුව | 73,982.42 | |
| 230412 | ස්ථාවර තැන්පතු- මහජන බැංකුව | 12,481,114.33 | |
| 230416 | ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | 4,000,000.00 | |
| 230417 | නෛතික තැන්පතු | 660,000.00 | |
| 230502A | ප්‍රාග්ධන අත්තිකාරම් | 8,620.00 | |
| 230503A | විවිධ අත්තිකාරම් | 291,869.81 | |
| 230504A | ව්‍යාපෘති අත්තිකාරම් | 1,074,362.50 | |
| 230505 | වැඩ ඇරඹුම් අත්තිකාරම්-ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 42,283,857.19 | |
| 230507A | පර්යේෂණ අත්තිකාරම්- ප්‍රාග්ධන | 6,895,879.00 | |
| 231001 | ලංකා බැංකුව-බලංගොඩ -පුනරාවර්තන | 1,025,739.34 | |
| 231002 | ලංකා බැංකුව-බලංගොඩ -ප්‍රාග්ධන | 21,817,404.72 | |
| 231003 | ලංකා බැංකුව-බලංගොඩ -බාහිර | 5,696,602.01 | |
| 231005 | මහජන බැංකුව -බලංගොඩ | 32,739.30 | |
| 231008 | ලංකා බැංකුව-බලංගොඩ- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය 79701001 | 6,948,482.89 | |
| 231201 | පෙර ගෙවීම් | 2,233,031.80 | |
| 231303 | මුද්දර අග්‍රිමය | 37,255.00 | |
| 231403 | බාහිර ඒකකයෙන් ලැබිය යුතු දෑ | 27,916,037.94 | |
| 231404 | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයෙන් ලැබිය යුතු දෑ | 749,363.07 | |
| 231406 | මුදල් වංචාව -රහංගල (පුනරාවර්තන) | 189,302.61 | |
| 231407 | දේපලවලින් ලැබිය යුතු කුලී | 4,540.50 | |
| 231409 | කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු ලැබීම් | 382,545.16 | |
| 231413 | විදේශීයශිෂ්‍යයන්ගේ ශිෂ්‍යත්ව | | 772,115.44 |
| 231415 | ලැබිය යුතු/ගෙවිය යුතු මහපොල | 8,422,250.00 | |
| 231416 | ලැබිය යුතු/ගෙවිය යුතු ශිෂ්‍යාධාර | 2,955,800.00 | |
| 30101 | ආණ්ඩුවේ ප්‍රදාන (පුනරාවර්තන) | | 1,035,437,000.00 |
| 30103 | ශිෂ්‍යාධාර ආදායම | | 49,933,300.00 |
| 30104 | මහපොල ආදායම | | 75,993,650.00 |
| 30301 | ලියාපදිංචි ගාස්තු (ප්‍රථම උපාධි අපේක්ෂකයන්) | | 1,197,940.00 |
| 30305 | විභාග ගාස්තු (ප්‍රථම උපාධි අපේක්ෂකයන්) | | 82,705.81 |
| 30308 | ණය සහ අත්තිකාරම් පොළී | | 3,011,209.14 |
| 30309 | ආයෝජන පොළී | | 4,410,278.55 |
| 30311 | පැරණි තොග විකිණීම | | 30,150.00 |
| 30312 | නිෂ්පාදන විකිණීම | | 2,182,216.50 |
| 30313 | දේපල කුලී ආදායම් | | 1,671,631.80 |
| 30314 | වෛද්‍ය ගාස්තු | | 977,674.64 |
| 30315 | පුස්තකාල දඩ මුදල් | | 125,617.50 |
| 30317 | සහායක ක්‍රියාකාරකම් | | 1,714,910.00 |
| 30318 | විවිධ ලැබීම් | | 10,322,356.77 |
| 30319 | විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ වැඩසටහන්වල ආදායම | | 39,686,092.07 |
| 30320 | ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි පාඨමාලාව | | 664,000.00 |
| 30321 | ආදිවාසී ජන අධ්‍යයන වැඩසටහන | | 1,078,250.00 |
| 30324 | විලම්භිත ආදායම් - IRQUE QEF ප්‍රදාන | | 735,836.00 |
| 30325 | විලම්භිත ආදායම් - IRQUE IBG ප්‍රදාන | | 482,345.00 |
| 30326 | විලම්භිත ආදායම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | | 45,160,810.65 |
| 30327 | විලම්භිත ආදායම් -JICA (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය) | | 5,000,000.00 |
| 30329 | විලම්භිත ආදායම් - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | | 1,468,809.44 |
| 30330 | විලම්භිත ආදායම් - පරිත්‍යාග | | 2,954,623.00 |
| 30331 | විලම්භිත ආදායම් - වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන | | 255,706,855.00 |
| 30332 | විලම්භිත ආදායම් - නේවාසිකාගාර ලිබඩු උපකරණ | | 5,168,562.80 |
| 30335 | විලම්භිත ආදායම් - පර්යේෂණ ප්‍රදාන | | 562,377.91 |
| 30336 | විලම්භිත ආදායම් HETC ප්‍රදාන | | 16,699,712.00 |
| 30338 | විලම්භිත ආදායම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රදාන | | 19,302.00 |
| 30340 | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ආදායම් | | 10,663,710.00 |

| | | |
|---|---|---|
| 4101041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 3,671,836.05 |
| 4101042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 56,879,483.73 |
| 410105 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 451,690.50 |
| 410106 | සැපයුම් | 5,107,933.73 |
| 410107 | නඩත්තු වියදම් | 1,510,603.03 |
| 410108 | ගිවිසුම්ගත සේවා | 27,970,674.81 |
| 410109 | වෙනත් පුනරාවර්තන වියදම් | 349,158,592.44 |
| 4102042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 19,508,830.04 |
| 410205 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 14,180.00 |
| 410206 | සැපයුම් | 1,319,603.83 |
| 410207 | නඩත්තු වියදම් | 100,844.75 |
| 410208 | ගිවිසුම්ගත සේවා | 324,576.30 |
| 410209 | වෙනත් පුනරාවර්තන වියදම් | 645,084.95 |
| 4103042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 9,052,730.27 |
| 410305 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 15,690.00 |
| 410306 | සැපයුම් | 477,609.41 |
| 410307 | නඩත්තු වියදම් | 64,967.75 |
| 410308 | ගිවිසුම්ගත සේවා | 65,343.40 |
| 410309 | වෙනත් පුනරාවර්තන වියදම් | 243,392.00 |
| 4104042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 26,267,742.14 |
| 410405 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 902,188.00 |
| 410406 | සැපයුම් | 16,117,692.27 |
| 410407 | නඩත්තු වියදම් | 12,230,946.64 |
| 410408 | ගිවිසුම්ගත සේවා | 871,938.72 |
| 410409 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,106,484.00 |
| 410506 | සැපයුම් | 48,006.95 |
| 410507 | නඩත්තු වියදම් | 876,290.00 |
| 410508 | ගිවිසුම්ගත සේවා | 58,123,422.40 |
| 4201041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 90,606,207.46 |
| 4201042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 46,032,099.72 |
| 420105 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 412,792.31 |
| 420106 | සැපයුම් | 14,266,001.51 |
| 420107 | නඩත්තු වියදම් | 2,770,728.72 |
| 420108 | ගිවිසුම්ගත සේවා | 3,610,471.52 |
| 420109 | වෙනත් පුනරාවර්තන වියදම් | 9,800,624.78 |
| 4202041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 118,203,545.82 |
| 4202042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 23,528,314.11 |
| 420205 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 626,682.50 |
| 420206 | සැපයුම් | 7,248,566.56 |
| 420207 | නඩත්තු වියදම් | 672,110.85 |
| 420208 | ගිවිසුම්ගත සේවා | 404,801.57 |
| 420209 | වෙනත් පුනරාවර්තන වියදම් | 9,555,571.70 |
| 4203041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 2,218,386.74 |
| 4203042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 1,600,914.35 |
| 420309 | වෙනත් පුනරාවර්තන වියදම් | 7,648,618.41 |
| 4214041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 90,379,677.57 |
| 4214042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 15,125,126.48 |
| 421405 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 231,715.00 |
| 421406 | සැපයුම් | 2,335,225.93 |
| 421407 | නඩත්තු වියදම් | 436,090.32 |
| 421408 | ගිවිසුම්ගත සේවා | 250,790.66 |
| 421409 | වෙනත් පුනරාවර්තන වියදම් | 7,177,387.57 |
| 4218041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 129,391,751.87 |
| 4218042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 20,704,510.41 |
| 421805 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 148,192.00 |
| 421806 | සැපයුම් | 2,226,368.62 |
| 421807 | නඩත්තු වියදම් | 210,145.70 |
| 421808 | ගිවිසුම්ගත සේවා | 381,664.90 |
| 421809 | වෙනත් පුනරාවර්තන වියදම් | 7,540,983.80 |
| 4223042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 10,612,436.03 |

| | | |
|---|---|---|
| 422305 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 6,860.00 |
| 422306 | සැපයුම් | 2,426,111.19 |
| 422307 | නඩත්තු වියදම් | 103,968.12 |
| 422308 | ගිවිසුම්ගත සේවා | 32,361.17 |
| 422309 | වෙනත් පුනරාවර්තන වියදම් | 332,630.00 |
| 4227041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 52,556,755.55 |
| 4227042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 10,527,907.67 |
| 422705 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 89,014.00 |
| 422706 | සැපයුම් | 2,266,803.77 |
| 422707 | නඩත්තු වියදම් | 761,873.33 |
| 422708 | ගිවිසුම්ගත සේවා | 85,379.00 |
| 422709 | වෙනත් පුනරාවර්තන වියදම් | 3,630,630.45 |
| 4301041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 7,073,703.37 |
| 4301042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 15,840,916.37 |
| 430105 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 83,504.00 |
| 430106 | සැපයුම් | 973,134.47 |
| 430107 | නඩත්තු වියදම් | 17,484.35 |
| 430108 | ගිවිසුම්ගත සේවා | 48,999.08 |
| 430109 | වෙනත් පුනරාවර්තන වියදම් | 3,480,163.22 |
| 4302041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 12,120,007.00 |
| 4302042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 9,336,953.24 |
| 430205 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 800.00 |
| 430206 | සැපයුම් | 62,044.78 |
| 430207 | නඩත්තු වියදම් | 279,468.07 |
| 430208 | ගිවිසුම්ගත සේවා | 41,685.57 |
| 4401042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 3,130,571.49 |
| 440105 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 9,240.00 |
| 440106 | සැපයුම් | 1,378,699.02 |
| 440107 | නඩත්තු වියදම් | 1,871.25 |
| 440108 | ගිවිසුම්ගත සේවා | 31,294.01 |
| 440109 | වෙනත් පුනරාවර්තන වියදම් | 203,500.00 |
| 4402041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 1,812,301.20 |
| 4402042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 6,056,253.91 |
| 440205 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 79,999.00 |
| 440206 | සැපයුම් | 699,401.35 |
| 440207 | නඩත්තු වියදම් | 1,642,182.01 |
| 440208 | ගිවිසුම්ගත සේවා | 344,937.48 |
| 440209 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,816,462.50 |
| 4403041 | පුද්ගලික වේතන -අධ්‍යයන | 94,209.00 |
| 4403042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 20,517,696.87 |
| 440305 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 7,725.00 |
| 440306 | සැපයුම් | 948,824.50 |
| 440307 | නඩත්තු වියදම් | 14,982.10 |
| 440308 | ගිවිසුම්ගත සේවා | 6,237,056.61 |
| 440309 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,511,485.75 |
| 440310 | සිසුන් සඳහා මූල්‍යමය සහාය | 125,755,150.00 |
| 4501042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 23,920,591.00 |
| 450105 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 118,899.57 |
| 450106 | සැපයුම් | 1,952,968.40 |
| 450107 | නඩත්තු වියදම් | 3,296,537.19 |
| 450108 | ගිවිසුම්ගත සේවා | 35,684,293.83 |
| 4502042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 1,928,654.23 |
| 450206 | සැපයුම් | 432,808.98 |
| 450207 | නඩත්තු වියදම් | 157,100.03 |
| 450208 | ගිවිසුම්ගත සේවා | 23,737,121.04 |
| 4503042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 983,310.53 |
| 450307 | නඩත්තු වියදම් | 715,630.35 |
| 450308 | ගිවිසුම්ගත සේවා | 629,630.64 |
| 450309 | වෙනත් පුනරාවර්තන වියදම් | 26,818.90 |
| 4504042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 706,683.01 |

| | | | |
|---|---|---|---|
| 450405 | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 250.00 | |
| 450406 | සැපයුම් | 29,071.99 | |
| 450407 | නඩත්තු වියදම් | 1,372,282.00 | |
| 450408 | ගිවිසුම්ගත සේවා | 35,825.29 | |
| 4701042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 8,887,114.10 | |
| 470109 | වෙනත් පුනරාවර්තන වියදම් | 31,505,760.58 | |
| 470207 | නඩත්තු වියදම් | 125,062.50 | |
| 4703042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 1,774,546.85 | |
| 470307 | නඩත්තු වියදම් | 2,645.00 | |
| 470308 | ගිවිසුම්ගත සේවා | 37,677.10 | |
| 470408 | ගිවිසුම්ගත සේවා | 115,000.00 | |
| 470409 | වෙනත් පුනරාවර්තන වියදම් | 6,460.00 | |
| 4705042 | පුද්ගලික වේතන- අනධ්‍යයන | 1,942,814.94 | |
| 470506 | සැපයුම් | 7,721.48 | |
| 470508 | ගිවිසුම්ගත සේවා | 3,465.00 | |
| 470509 | වෙනත් පුනරාවර්තන වියදම් | 224,900.00 | |
| 470606 | සැපයුම් | 9,927.00 | |
| 470608 | ගිවිසුම්ගත සේවා | 49,275.98 | |
| 470609 | වෙනත් පුනරාවර්තන වියදම් | 6,728.00 | |
| 480106 | සැපයුම් | 1,733,137.85 | |
| 480107 | නඩත්තු වියදම් | 148,083.15 | |
| 480108 | ගිවිසුම්ගත සේවා | 7,620,303.61 | |
| 480109 | වෙනත් පුනරාවර්තන වියදම් | 47,150.00 | |
| 480208 | ගිවිසුම්ගත සේවා | 14,049.55 | |
| | | **6,962,898,228.91** | **6,962,898,228.91** |

**14. විගණකාධිපති වාර්තාව - 2017**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එස්ජීපී/ආර්පී/ඩී/එස්යූඑස්එල්/01/17/17
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2018 ඔක්තෝබර් 17 දින.

උපකුලපති,

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් සේවකයන්ට ණය ගෙවීම සඳහා ලැබුණු සහ ගෙවන ලද ණය රු.57,777,625 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ කල්බදු වාරික වලට අදාළ පොළී ගෙවීම් රු. 1,579,262 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.14,673,898 ක්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.18,660,750 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුදල් ගලායාම් රු. 3,986,852 කින් වැඩියෙන් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ආපසු ලබාගෙන තිබුණු එකතුව රු. 11,970,474 ක් වූ ස්ථාවර තැන්පතු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු. 11,062,216 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.908,258 ක් අඩුවෙන් දැක්වුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාලපරිච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම ගණනය කිරීමේදී පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ රු. 262,500 ක් වූ ආරම්භක මුදල් ශේෂය ගලපා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උපචිත පදනම අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණද කෘෂි විද්‍යා පීඨ ගොවිපලේ ඉකුත් වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.126,054 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ලැබී තිබූ රු. 167,700 ක ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබීමෙන්ගොවිපලේ ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලයේ ආරක්ෂක සේවා සඳහා ගෙවිය යුතු රු. 5,545,307 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී මහපොළ ශිෂ්‍යත්ව සඳහා ලැබී තිබුණු රු. 2,513,700 ක් සමාලෝචිත වර්ෂයේ මහපොළ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට මහපොළ භාරකාර අරමුදලින් ලැබිය යුතු මහපොළ ශිෂ්‍යත්ව ආදායම රු.1,830,150 වුවත් ගිණුම්ගත කර තිබුණේ රු.1,168,250 ක් වූයෙන් ලැබිය යුතු මහපොළ ශිෂ්‍යත්ව ආදායම රු.661,900 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2018 වර්ෂයට අදාලව එම වර්ෂයේදී ශිෂ්‍යාධාර සඳහා ලැබී තිබුණු රු. 3,042,800 ක් සමාලෝචිත වර්ෂයේ ශිෂ්‍යාධාර ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සහ පෙබරවාරි මාසවල විශ්වවිද්‍යාලය විසින් පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් වියදම් සඳහා දරන ලද එකතුව

රු.389,218 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට පෙර වර්ෂ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාල ශිෂ්‍යාධාර ආදායම රු. 49,933,300 ක් දක්වා තිබුණද ශිෂ්‍යාධාර වියදම රු. 49,761,500 ක් ලෙස රු.171,800 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 නොසැසඳු පාලන ගිණුම්

විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයට ගෙවිය යුතු ලෙස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල රු.27,916,036 ක් දක්වා තිබුණද විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ මූල්‍ය ප්‍රකාශනවල, සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයෙන් ලැබිය යුතු ලෙස රු. 25,311,637 ක් දක්වා තිබීමෙන් එම ශේෂයන් අතර රු. 2,604,399 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් | 57,295,890 | හිමිකම් සහතික / පැවරුම් නියෝග |
| ගොඩනැගිලි | 3,118,583,084 | (i) ස්ථාවර වත්කම් ලේඛන<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| ජල පිරිපහදු ඒකකය | 9,113,148 | |
| කාර්යාල සහ ඉගෙනුම් උපකරණ | 751,681,342 | |
| පරිගණක සහ උපාංග | 303,809,165 | |
| පුස්තකාල පොත් හා වාර සඟරා | 143,701,291 | |
| මෝටර් වාහන | 130,427,226 | |
| සන්නිවේදන උපකරණ | 34,415,008 | |
| උපාධි ලෝගු | 3,149,512 | |
| වෙනත් උපකරණ | 155,939,913 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂි විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුවකු වෙත වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු. 1,179,621 ක් ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු විසින් එම කාර්යය අත්හැර දමා ඇති බැවින් ගෙවන ලද අත්තිකාරම 2018 ජූනි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 01 සිට වර්ෂ 18 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන සේවකයින් 12 දෙනෙකුගේ ණය ශේෂ 21 කට අදාළව ලැබිය යුතු රු. 656,662 ක් 2018 මැයි වනවිටත් අයකර ගෙන නොතිබුණු අතර වර්ෂ 06 කට වැඩි කාලයක සිට පැවත එන රු. 105,525 ක් වූ විවිධ ණයගැති ශේෂ 04 ක් 2018 ජූනි වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ඇ) අධ්‍යයන වර්ෂ 04 ක් වෙනුවෙන් මහපොළ භාරකාර අරමුදලෙන්, මහපොළ ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්ලබා දී තිබූ ශිෂ්‍යාධාර රු. 27,009,550 ක් මහපොළ භාරකාර අරමුදලෙන් පසුව විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණද, එම ශිෂ්‍යාධාර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිරවුල් කිරීමට 2018 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්වලට අදාළ අවසාන බිල්පත්වල කටයුතු අවසන් නොකිරීම මත කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු එකතුව රු. 69,617,688 ක ශේෂ 8 ක් නිරවුල් කිරීමකින් තොරව 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 112 (1) වගන්තිය | 2015/2016 අධ්‍යයන වර්ෂය සඳහා සමාජවිද්‍යා හා භාෂා අධ්‍යයන පීඨයේ ශිෂ්‍ය සභාවට ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර සඳහා ආචාර්යවරයෙකු පත්නොවීම හේතුවෙන් 2018 මැයි වනවිටත් සභාව ක්‍රියාකාරී තත්ත්වයට පත්වී නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | |
| (i) III වන පරිච්ඡේදයේ 18.12.1(I) වගන්තිය | සේවයෙන් පහ කරනු ලැබූ හෝ පරිවාස කාලයේදී විනයානුකූල හේතු මත සේවය අවසන් කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනවලට පත් නොකිරීම සහතික කර ගැනීමට හැකිවන පරිදි එවැනි තැනැත්තන්ගේ නාම සූචියක් පවත්වා ගෙන යා යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 14 දෙනෙකු ආපසු සේවයට වාර්තා නොකිරීම නිසා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකර ගත යුතු රු. 68,943,858 ක් 2018 මැයි වන විටත් අය කරගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | V වන පරිච්ඡේදයේ 7.8 වගන්තිය | සේවයෙන් පහ කරනු ලැබූ කථිකාචාර්යවරයෙකු නැවත රාජ්‍ය සංස්ථාවල හෝ සංස්ථාපිත මණ්ඩලවල රැකියා ලබා ගැනීම වැලැක්වීම සඳහා එවැනි කථිකාචාර්යවරයෙකු සේවය හැරගිය බව ප්‍රකාශ කෙරෙන දැන්වීමක් විශ්වවිද්‍යාලය විසින් නිකුත් කර ඒ බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂ වෙත දැන්වීමට කටයුතු කළ යුතුය. එලෙස කටයුතු නොකිරීම නිසා 2007 වර්ෂයේ සේවයෙන් පහකරනු ලැබූ කථිකාචාර්යවරයෙකු නැවත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස පත්වී තිබුණි. |
| (iv) | XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සනාථ කර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්යමණ්ඩලයේ 259 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු. 468,595,919 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | 2005 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා පැවත එන එකතුව රු.19,791,816 ක් වූ ටෙන්ඩර් තැන්පතු, රැඳවුම් මුදල්, ලංසු සුරක්ෂණ සහ විවිධ තැන්පතු යන කල් ඉකුත් වූ තැන්පතු 129 ක් නියාදනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.1 හා 7.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි මෙහෙයුම් අත්පොත් පිළියෙල කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 90,808,260 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 26,902,016 ක් වීමෙන් 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 117,710,276 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ගිවිසුම්ගත සේවා පිළිවෙලින් රු.79,786,033 කින් හා රු. 34,230,134 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු.47,093,974 ක් වූ ඌනතාවය උච්ඡාවචනයන් සහිතව 2015 වර්ෂය වන විට රු.22,927,315 දක්වා අඩු වී තිබුණි. නමුත් 2016 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිඵලය රු. 39,224,605 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී 2017 වර්ෂයේ දී එය රු. 90,808,260 ක ඌනතාවයක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේ රු. 565,589,804 ක් වූ දායකත්වය 2017 වර්ෂය වන විට රු. 1,097,115,850 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.38 හා 0.67 ක් විය. සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වලින් සියයට 26 ක් මුදල් හා මුදල් සමාන දෑ වලින් නියෝජනය වූ අතර ආයතනයේ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් තුළ රඳවා තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර භෞතික ප්‍රගතිය මැන බැලීම සඳහා කාර්යසාධන වාර්තාද පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශය සඳහා පමණක් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය අධ්‍යයන වර්ෂ 04 තුළදී ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 4,910 ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 4,489 ක් පමණක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව ශිෂ්‍යයන් 421 ක් හෙවත් ලියාපදිංචි කිරීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 8.57 ක් ලියාපදිංචි වී නොතිබුණි.

(ආ) 2009/10, 2010/11, 2011/12 අධ්‍යයන වර්ෂ 03 තුළ සිසුන් 2,888 ක් ලියාපදිංචි කර තිබූ අතර ඔවුන්ගෙන් සිසුන් 2,427 ක් උපාධිය සම්පූර්ණ කර තිබුණද, ලියාපදිංචි වූ සිසුන්ගෙන් සියයට 16 ක් උපාධිය සම්පූර්ණ කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට 2015/2016 අධ්‍යයන වර්ෂය දක්වා වූ අධ්‍යයන වර්ෂ 05 ක් තුළ විශ්වවිද්‍යාලයේ පීඨ 5 ට පළමු වසර සඳහා ශිෂ්‍යයින් 5,255 ක් ලියාපදිංචි කර තිබූ අතර ඔවුන්ගෙන් ශිෂ්‍යයන් 104 දෙනෙකු හෙවත් සියයට 02 ක් පළමු වසර තුළම උපාධි පාඨමාලා හැරගොස් තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා අවසන් වරට 2011 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සිසුන් 185 කට පළමු වසරේ විභාගය 2013 ජූලි මස ද, දෙවන වසරේ විභාගය 2015 මැයි මස ද, තෙවන වසර විභාගය 2017 ජූලි සහ අගෝස්තු මාස

වලද පවත්වා තිබුණි. සිසුන් බඳවා ගෙන වසර 06 ක් ඉකුත් වී තිබුණ ද, අවුරුදු තුනක උපාධි පාඨමාලාව 2018 මැයි වනවිටත් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද අවසන් වසර විභාගය සඳහා පෙනීසිටින ලද සිසුන් සංඛ්‍යාව 101 ක් පමණක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයන් 3,945 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 1,258,777,399 ක් වූ අතර, ඒක ශිෂ්‍ය පිරිවැය රු. 319,082 ක් විය. ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 3,758 දෙනෙකුගේ අධ්‍යයන පිරිවැය රු. 1,117,968,314 ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු. 297,490 ක් විය. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු. 21,592 කින් වැඩි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් ඇණවුම් කරන ලද වටිනාකම රු.15,964,000 ක් වූ Desk top වර්ගයේ පරිගණක 130 ක් නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු විසින් සපයා තිබූ අතර ඒ පිළිබඳ පරීක්ෂා කිරීමෙන් තොරව විශ්වවිද්‍යාලය විසින් එම පරිගණක භාරගෙන තිබුණි. ඒ අනුව නියමිත පිරිවිතරවලට උපකරණ සපයා නොතිබීම මත සැපයුම්කරු ගිවිසුමේ කොන්දේසියක් කඩකර තිබුණද සිදු වූ පාඩුව අවම කර ගැනීම සඳහා රු.1,631,288 ක් වූ කාර්යසාධන සුරක්ෂණය මුදල් කරවා ගැනීමට සහ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ගිවිසුම්ගත වටිනාකමෙන් සියයට 5 ක වට්ටමකට යටත්ව ගෙවීම් කිරීමට එකඟ වී රු. 13,569,400 ක් සැපයුම්කරු වෙත ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාව පරිදි නීත්‍යානුකූලව කටයුතු සිදුකිරීමට තීරණය කර ඇති බව උපකුලපති විසින් විගණනය වෙත පිළිතුරු ලෙස දන්වා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ අපද්‍රව්‍ය දිරන හා නොදිරන අපද්‍රව්‍ය ලෙස වෙන් කිරීමකින් තොරව බැහැර කරන අතර එසේ දිනකට බැහැර කරන ටොන් 2 ක් පමණ වූ අපද්‍රව්‍ය 2015 වර්ෂයේ ජනවාරි සිට තන්පේරියල් නැමති රජයේ ඉඩමට මුදා හැර තිබුණි. එම අපද්‍රව්‍ය වනයේ බොහෝ ස්ථානවලට පැතිරී ගොස් තිබුණු බැවින් පරිසරය දූෂණය වීමට මෙන්ම වන සතුන්ට අහිතකර තත්ත්වයක් ඇතිවීමට ද හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) 2008 වර්ෂයට පෙර සිට ලැබියයුතු ලෙස ඉදිරියට ගෙන එන ලද රු. 189,303 ක් වූ කෘෂි විද්‍යාපීඨයේ මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ බව අනාවරණය වුවද ඒ පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

විශ්වවිද්‍යාලයට අයත් අරමුදල් 04 කට අදාළව රු. 1,809,885 ක් වූ ශේෂය අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොකර වර්ෂ 03 සිට වර්ෂ 07 ක් දක්වා කාලපරාසයක් නිෂ්කාර්යව පැවතුණි.

### 4.4 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයට අදාලව පිටත පුහුණු ඒකකය (Out Bound Training Centre) පිහිටුවීම සඳහා 21 වන සියවස සඳහා වූ උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මඟින් 2016 වර්ෂයේදී රු. 2,725,000 ක් වූ භාණ්ඩ හා උපකරණ විශ්වවිද්‍යාලයට ලබා දී තිබුණද, ඒ වෙනුවෙන් යටිතල පහසුකම් සහ සැලසුම් සකස් කර නොතිබීම හේතුවෙන් 2018 මැයි වනවිටත් එම උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

තවද එම ව්‍යාපෘතිය මඟින් 2013, 2014, 2015 සහ 2016 වර්ෂවලදී විශ්වවිද්‍යාලය වෙත ලබා දී තිබූ රු. 1,262,584 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ, කාර්යාල උපකරණ සහ පුස්තකාල පොත් 2018 මැයි වනවිටත් ප්‍රයෝජනයට නොගෙන දැනට වසා දමා ඇති මෙහෙයුම් තාක්ෂණ සේවා මධ්‍යස්ථානය ( OTS ) තුළ ගබඩා කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලයේ ඇති ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍රයේ කොටස් ගෙවීයාම හේතුවෙන් 2015 දෙසැම්බර් සිට එම යන්ත්‍රය අක්‍රීය වී තිබුණු අතර එය අළුත්වැඩියා කිරීමට කටයුතු නොකර මුද්‍රණාලයම වසා දැමීමට කටයුතු කර සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මුද්‍රණ කටයුතු පුද්ගලික අංශයෙන් රු. 5,509,287 ක් වැයකර ඉටුකරවාගෙන තිබුණි. මුද්‍රණ කටයුතු සඳහා පුහුණුවීම් ලබාදී තිබුණු මුද්‍රණාලයේ සේවකයින් තිදෙනෙකු වෙනත් ඒකකයන්ට අනුයුක්ත කර තිබූ අතර 2018 මැයි වනවිටත් එම මුද්‍රණාලය සහ එහි තිබූ රු. 449,955 ක් වූ පාරිභෝජන ද්‍රව්‍ය තොගය නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැඟිල්ලට අනුබද්ධිතව වැසිකිළි ඉදිකර දෙන ලෙස එහි කාර්ය මණ්ඩලය විසින් ඉල්ලීම් කර තිබුණද රු. 530,872 ක් වැයකර වැසිකිළිය ඉදිකර තිබුණේ වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට පිටතින් වීම නිසා එය භාවිතයකින් තොරව 2017 මැයි සිට නිෂ්කාර්යව පැවතුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත ස්ථිර මහාචාර්ය තනතුරු හා කථිකාචාර්ය තනතුරු 287 කින් තනතුරු 76 ක් ද, අනුමත තාවකාලික කථිකාචාර්ය තනතුරු 51 කින් තනතුරු 30 ක් ද අනෙකුත් තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 83 කින් තනතුරු 35 ක් ද වශයෙන් තනතුරු 141 ක පුරප්පාඩු පැවතුණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මෙම පුරප්පාඩු හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල බාහිර කථිකාචාර්ය ගාස්තු ලෙස රු. 22,439,891 ක් ගෙවා තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පරිපාලන තනතුරු 19 ක්, අධ්‍යයන සහාය කාර්යය මණ්ඩල තනතුරු 8 ක් සහ අනධ්‍යයන තනතුරු 144 ක් වශයෙන් පුරප්පාඩු 171ක් පැවතුණි. එම පුරප්පාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා වශයෙන් රු. 24,298,614 ක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 2016 වර්ෂයේ රු. 2,308,358 ක් වූ ඒක සේවක පිරිවැය, සමාලෝචිත වර්ෂයේ රු. 2,352,446 ක් වීමෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 44,088 ක වැඩිවීමක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 2016 වර්ෂයේ රු. 785,632 ක් වූ ඒක සේවක පිරිවැය, සමාලෝචිත වර්ෂයේ රු. 902,604 ක් වීමෙන් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඒක සේවක පිරිවැය රු. 116,972 ක වැඩි වීමක් නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වූවත් 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 17 දිනදීය. එසේ වූවද ඒ සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට පුරප්පාඩු වී තිබූ අතර විගණක සහායක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීම්ද සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණනය සැලසුම් කර ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා බාධාවක් වී තිබුණි.

## 6.3 විගණන කමිටු

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ කමිටු 02 ක් පමණක් පවත්වා තිබූ අතර 2017 ජූලි සිට 2018 ජුනි දක්වා කමිටුව පවත්වා නොතිබුණි.

## 6.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.4.1 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබීම නිසා පරිගණක, පරිගණක උපාංග සහ ඉගෙනුම් උපකරණ මිලදී ගැනීමේ හා ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයක් සඳහා පිළිවෙලින් මාස 10 සිට මාස 13 දක්වා කාලයක් හා මාස 5 ක කාලයක් ගතකර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1.(ඇ) වගන්තිය ප්‍රකාරව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කර ඇති බවට ස්ථිර බැඳීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ නොකළ යුතු බව දක්වා තිබුණි. එසේ වුවද භූ විද්‍යාපන පීඨය සඳහා රු. 42,550,000 ක් වටිනා මිණුම් උපකරණ මිලදී ගැනීමට අදාලව 2016 වර්ෂයේ දී මුදල් ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා ඒ වෙනුවෙන් 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් රු. 16,200,000 ක් වූ ප්‍රසම්පාදන විෂයයන් 3 ක් අවලංගු කර ඉහත මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනය මාස 08 ක කාලයක් තුළ නිම කිරීමේ පදනම මත රු. 2,960,000 ක වටිනාකමකට 2017 ජූලි පුද්ගලික ආයතනයක් වෙත පවරා රු.1,888,300 ක් ගෙවා තිබුණද, 2018 මැයි වනවිටත් එම කටයුතු නිමකර නොතිබුණි.

### 6.4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගෘහභාණ්ඩ සහ පරිගණක උපාංග සැපයීමේ ප්‍රමාදය මත සැපයුම් ගිවිසුම් ප්‍රකාරව අයකල යුතු රු. 2,606,361 ක ප්‍රමාදයන් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂි විද්‍යා පීඨයේ ගොවිපළ සඳහා ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියට අදාලව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පළාත් සභාවේ අනුමත රේටයන් යොදා නොගැනීම නිසා ඇස්තමේන්තුවේ විෂයයන් 02ක් සඳහා රු. 199,071 ක අධි ඇස්තමේන්තු කිරීම හා ඇස්තමේන්තුවේ එක් විෂයයක් සඳහා රු. 11,990 ක ඌණ ඇස්තමේන්තු කර තිබීම හේතුවෙන් නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.5 අයවැය පාලනය

ස්වයං මූල්‍ය පාඨමාලාවල ආදායම් සහ වියදම් සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අයවැය ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ එම පාඨමාලාවල ආදායම් හා වියදම් පිළිවෙලින් රු. මිලියන 52.09 ක් හා රු. මිලියන 39.15 ක් විය.

### 6.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය ප්‍රකාරව 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

### 6.7 නොවිසඳී ඇති විගණන ඡේද

2017 අගෝස්තු 09 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබෙන නියෝග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

(අ) 2011 වර්ෂයෙන් පසුව ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව නවීකරණය කර නව ශිෂ්‍ය කණ්ඩායම් බඳවා ගැනීමට 2018 මැයි වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී රු. 123,052,693 ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩාපිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු බව නියෝග කර තිබුණද, 2018 මැයි වනවිටත් වටිනාකම රු. 5,156,160 ක් වූ රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර විශ්වවිද්‍යාලයේ උපකුලපති වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ආදායම් , වියදම් සහ වත්කම්, බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම. |
| | | (ii) ලෙජර් ගිණුම් ශේෂ හා ලේඛන නොසැසඳීම. |
| (ආ) | වත්කම් පාලනය | වත්කම් ඌන උපයෝජිතව පැවතීම. |
| (ඇ) | මානව සම්පත් කළමනාකරණය | (i) පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) විනිවිදභාවය ආරක්ෂා වන පරිදි බඳවාගැනීමේ පරිපාටි සකස්කර නොතිබීම |
| (ඈ) | මෙහෙයුම් පාලනය | ආරක්ෂක අංශයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමට නිසි පාලන ක්‍රමවේදයක් හඳුන්වා නොතිබීම |
| (ඉ) | අභ්‍යන්තර විගණනය | අර්ධවාර්ෂික විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

## 15. විගණකාධිපති වාර්තාවට පිළිතුරු - 2017

| විගණන වාර්තාවේ ඡේදය | පිළිතුරු | මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|
| 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම<br>2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිති<br>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 2<br><br>අ) | විශ්වවිද්‍යාල සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදලින් සේවකයින්ට ගෙවීම සඳහා ණය ලබා දෙනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් වන අතර එම මුදල් ලැබූ විගසම එම මුදල සේවකයින්ට ගෙවිය යුතුය. ණය ගෙවිය හැකි සේවකයින්ට පමණක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ණය ලබා දෙනු ලබන අතර ලබා දෙනු සියළුම ණය ඉතිරි නොවී ඒම සතිය තුලම අදාල සේවකයින්හට ලැබේ. එබැවින් ලැබූ මුදල හා ගෙවූ මුදල අතර කිසිම පරස්පරතාවයක් ඇති නොවේ. ගෙවූ මුදල හා ලැබූ මුදල සමාන වන බැවින් හා එකම ශීර්ෂය යටතේ දැක්විය යුතු හෙයින් අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයට කිසිඳු බලපෑමක් ඇති වන ගනුදෙනුවක් නොවේ. | ගැලපීම් අවශ්‍ය නොවූවත් මේ වන විට අදාල ගැලපීම් කර ඇත. |
| ආ)<br><br><br><br><br><br><br><br>ඇ) ඈ) ඉ) | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමග එකඟ වේ. නමුත් මෙම අගයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී විගණක විසින් දක්වා ඇති ශීර්ෂ යටතේ නොව වෙනත් ශීර්ෂ යටතේ ගැලපීම් කර ඇත. එසේ ගැපීම් කරනු ලැබූ නිසා ඉදිරිපත් කල යුතු ශීර්ෂ යටතේ ඉදිරිපත් නොවී වෙනත් ශීර්ෂ යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කොට ඇත. එම නිසා මෙම අගයන් ගැලපීම් කිරීම නිසා වර්ෂ අවසාන සමස්ථ ශේෂයට මුළු බලපෑමක් සිදුවී නොමැත. ඉදිරියේදී නිවැරදි ශීර්ෂ යටතේ ගැලපීම් කරමි.<br><br>විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. | මේ වන විට ගැලපීම් කර ඇත.<br><br><br><br><br><br><br><br>මේ වන විට ගැලපීම් කර ඇත. |
| 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති | කෘෂිවිද්‍යා පීඨය ගොවිපල පවත්වාගෙන යනු ලබන්නේ ආදායම් ඉපයීමේ පරමාර්ථයෙන් නොව අධ්‍යයන කටයුතු වල ප්‍රායෝගික කටයුතු සඳහා වේ. එහිදී සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නිශ්පාදනය කරනු ලද නිශ්පාදන සේවකයින් සඳහා අලෙවි කරනු ලබන අතර එම අලෙවි ආදායම උපලබ්ධි වූ පසු (මුදලින් ලැබූ පසු) පමණක් ගිණුම් වලට ගනු | මේ වන විට ගැලපීම් කර ඇත. |

| | | |
|---|---|---|
| | ලැබේ. එය මෙතෙක් ගෙන ආ සම්ප්‍රදායික ක්‍රමය වේ.<br>ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේදී එම ප්‍රතිපත්තිය මත ගිණුම් පිළියෙල කර ඇත. විගණක විසින් පෙන්වා දෙන ආකාරයට සමස්ථ වෙනස රු. 41646 කි. මෙය ප්‍රමාණාත්මක වෙනසක් නොවේ. කෙසේ වුවද මේ වන විට ගැලපීම් කර ඇත. | |
| 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු | | |
| අ) | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | මේ වන විට ගැලපීම් කර ඇත. |
| ආ) | මහපොල ගෙවීම් සහ මහපොල ගෙවීම් සඳහා ලැබූ මුදල් පහත පරිදි වේ.<br>1 2017 වසරේ සිසුන් සඳහා මහපොල ගෙවීම් : 75,993,650.00<br>2 මහපොල ගෙවීම සඳහා මහපොල භාරකාර අරමුදලින් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබූ මුළු මුදල : 84,157,100.00<br>3 ඉන් අඩු කලා - මහපොල නොගෙවා ආපසු යැවීම් සහ යැවිය යුතු මුදල : 9,331,700.00<br>4 මහපොල ගෙවීම් සඳහා සත්‍ය වශයෙන් ලැබූ මුදල (2-3) 74,825,400.00<br>5 වර්ෂයේ සත්‍ය මහපොල ශිෂ්‍යාධාර සඳහා ලැබිය යුතු හිඟ මුදල (1-4) 1,168,250.00<br>ඒ අනුව මෙම ලැබිය යුතු මුදල ලැබිය යුතු ශිෂ්‍යාධාර ආදායම් ලෙස සහ ලැබිය යුතු මුදල් ලෙස නිවැරදිව ගිණුම්ගත කොට ඇත. | නිවැරදිව ගණනය කර ඇත. |
| ඇ) | ඉහත (ආ) පිළිතුරම අදාල වේ | |
| ඈ) | ... මෙම ශිෂ්‍යාධාර 2018-01-10 වන දින ගෙවනු ලැබුවද එම ශිෂ්‍යාධාර අදාල කාලපරිච්ඡේදය වනුයේ 2017 වර්ෂය වේ. | නිවැරදිව ගිණුම් ගත කර ඇත. |

| | | |
|---|---|---|
| | (මේ බැවි අධ්‍යයන හා ශිෂ්‍ය සේවා අංශය මගින් සනාථ කර තිබේ.) එබැවින් 2017 වසරේ වියදම් ලෙස ගිණුම් ගත කර ඇති අතර මීට අනුරූපී ලැබිය යුතු ආදායම එම වසරේ ආදායමක් ලෙස නිවැරදිව ගිණුම් ගත කර ඇත. වවුචරයේ 2018 ජනවාරි යන්න 2017 වර්ෂයට අදාල පරිදි නිවැරදි කරමි. | |
| ඉ) | ... පශ්චාත් උපාධි පීඨයේ ජනවාරි සහ පෙබරවාරි මාස වලට ආදායම එකතුව රු. 407218/- වියදම් කර තිබුණද උපචිත සංකල්පය යටතේ මෙම වියදම 2016 අධ්‍යයන වර්ෂයට අදාල වියදම් වන බැවින් ගිණුම් ගත කිරීමේදී 2016 ආදායමට එරෙහිව නිවැරදිව ගිණුම්ගත කර ඇත. | නිවැරදිව ගිණුම් ගත කර ඇත. |
| ඊ) | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදව සමඟ එකඟ වේ. මේ වන විට නිවැරදිව ගැලපීම් කර ඇත. | මේ වන විට නිවැරදි කර ඇත. |
| 2.2.4 නොසැසඳුන පාලන ගිණුම් | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. නමුත් අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී විවෘත හා දූරස්ථ අධ්‍යයන ඒකකයේ ගිණුම් ඒකාබද්ධ කොට අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී විවෘත සහ දූරස්ථ අධ්‍යයන ඒකකයට ලැබිය යුතු මුදල එකිනෙකට කපා හරින බැවින් මෙම ගනුදෙනුව අවසන් ගිණුම් වලට කිසිදු බලපෑමක් ඇති නොවේ. | මේ වන විට ගිණුම් ශේෂ නිවැරදි කර ඇත. |
| 2.2.5 විගණනයට සාක්ෂි නොවීම | **ඉඩම්**<br>සබරගමුව විශ්වවිද්‍යාලය 1995 නොවැම්බර් මස 07 දින නිකුත් කරන ලද අංක 896 / 2 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද අතර එතෙක් පිහිටි අනුබද්ධ විශ්වවිද්‍යාලය පවත්වාගෙන ආ දේපල ඉඩම් පරිශ්‍රය තුලම මෙම විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යන ලදී. ඉඩම් දේපල එවකට විදුලි බල මණ්ඩලයට අයත්ව තිබී විශ්වවිද්‍යාලයට ලබා දී ඇත. මෙම ඉඩම් පවරා ගැනීමේ කටයුතු අඛණ්ඩව කෙරීගෙන යයි.<br>ඉඩම් ගොඩනැගිලි ඇතුළු සියළුම වත්කම් නැවත භෞතිකව සත්‍යාපනය කර අගය කිරීම් කර පරිගණක ගත කල ස්ථාවර | හිමිකම් පැවරුම් ලබා ගැනීම අඛණ්ඩව කරගෙන යනු ලැබේ.<br>ස්ථාවර වත්කම් ලේඛණය සකස් කරමින් පවතී. |

| | | |
|---|---|---|
| | වත්කම් ලේඛණයක් පිළියෙල කිරීම පිණිස මේ වනවිට නියමිත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් ඒ සම්බන්ධ විශේෂ ආයතන වෙත භාර දී ඇත. ඔවුන් විසින් මේ වන විටත් විශ්වවිද්‍යාලය සඳහා අදාල කාර්යය සඳහා ගිවිසුම්ගත වී ඇත. ඒ සඳහා මාස අටක කාලයක් ඔවුන් විසින් ලබාගෙන ඇති අතර මෙම කාලපරිච්ඡේදය අවසානයේදී අප වෙත නියමිත මුදල් රෙගුලාසි හා චක්‍රලේඛණ ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගැනීමට හැකියාව ලැබේ. | |
| 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | | |
| අ) | කොන්ත්‍රාත්කරු ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් නොකර අතරමග සේවය අතහැර දැමීම නිසා වූ අලාභය පියවා ගැනීම සඳහා නීති ක්‍රියාමාර්ග ගෙන ඇති අතර අදාල කොන්ත්‍රාත්කරු විශ්වවිද්‍යාලය සමඟ එළඹි ගිවිසුම ප්‍රකාරව කාර්යය සංසිද්ධි ඇප බැදුම්කරයන් (Performance Bond) සහ අත්තිකාරම් ගෙවුම් ඇපකරයක් (Advance Payment Security) ඉදිරිපත් කරන ලද MBSL රක්ෂණ සමාගම හට විශ්වවිද්‍යාලය වෙත අය විය යුතු මුදල නෛතික පොළිය සහ නඩු ගාස්තුවද ඇතුලත්ව රු. 3956514.38 ක මුදලක් 2018.11.07 දිනට පෙර ගෙවන ලෙස නඩු තීන්දුවක් ලැබී ඇත. | මේ දක්වා මෙම මුදල විශ්වවිද්‍යාලයට ලැබී නොමැත. නීතිපති විසින් අවශ්‍ය කටයුතු කරමින් පවතී. |
| ආ) | විගණකාධිපති වාර්තාවේ පෙන්වා දෙන සේවක ණය සියල්ලම නිකුත් කර ඇත්තේ ඔවුන් සතු ඔවුන්ගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල ඇප තබා ගෙනය. මෙම සේවකයින් නොදන්වා සේවය හැර යාම, සේවයෙන් පහ කිරීම මත මෙම ණය මුදල් හිඟව පවතී. මෙම ණය මුදල් පොළිය සමග ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම සමග පියවා ගැනීමට හැකිය.<br>විගණන ඡේදයේ පෙන්වා දෙන රු. 656,662.50 වන හිඟ ශේෂ පහත පරිදි වේ.<br>මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව මගින් අවශ්‍ය කටයුතු කරමින් පවතී. | |

| | | |
|---|---|---|
| | 1 එම් ඩී වසන්තලාල් -00210<br>මොහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු. 44296/- කි. මොහු කෘෂිවිද්‍යා පීඨයේ සරප්වරයෙක් වන අතර මුදල් වංචාවක් නිසා ඔහුගේ වැඩතහනම් කර ඔහු වෙත නඩු පවරා ඇත. ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>2 ඩබ් ඩී ජී එම් අයි පී දිසානායක -000458<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 62,604.12 කි. මෙම විශ්වවිද්‍යාලයේ දත්ත සැකසුම් ක්‍රියාකරවන්නියක් වන අතර ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම නිසා ඇයගේ වැඩතහනම් කර ඇය වෙත නඩු පවරා ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>3 ඩබ් එම් ඩී ප්‍රියදර්ශනී -00693<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 12,000.00 කි. මෙම විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරියක් වන අතර ගිවිසුම් කඩකර සේවය හැර ගොස් ඇති නිසා ඇයගේ වැඩකහනම් කර ඇය වෙත නඩු පවරා ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>4 ඒ ඒ රොඩ්රිගෝ -000827<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 65,349.80 කි. මෙම විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරියක් වන අතර ගිවිසුම් කඩකර සේවය හැර ගොස් ඇති නිසා ඇයගේ වැඩකහනම් කර ඇය වෙත නඩු පවරා ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>5 එම් වී ප්‍රනාන්දු -000189<br>මොහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු 98,482.89 කි. මොහු විශ්‍රාම ගැනීමට පෙර හදිසියේ මිය ගිය නිසා ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත. | උසාවියේ නඩු විභාග වෙමින් පවතී.<br><br>උසාවියේ නඩු විභාග වෙමින් පවතී.<br><br>උසාවියේ නඩු විභාග වෙමින් පවතී.<br><br>උසාවියේ නඩු විභාග වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| | 6 එම් එල් කේ එම් දිසානායක -000606<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 3,680.00 කි. මෙම විශ්වවිද්‍යාලයේ දත්ත සැකසුම් ක්‍රියාකරවන්නියක් වන අතර ව්‍යාජ සහතික ඉදිරිපත් කිරීම නිසා ඇයගේ වැඩකහනම් කර ඇය වෙත නඩු පවරා ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>7 ඒ කේ එම් අන්ෆාස් -000898<br>මොහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු 1,500.00 කි. මොහු වැඩඉංජිනේරු වරයෙක් වන  අතර ඔහු සේවය හැර ගොස් ඇත. ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>8 ආර් එම් කේ පී එස් පී බී දොඩන්වෙල -001240<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 1,250.00 කි. මෙම විශ්වවිද්‍යාලයේ පරිගණක යෙදුම් සහකාරවරියක් ලෙස සේවය කල අතර ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත ස්ථාන මාරුවීමක් ලබා ගෙන ඇත.  විශ්වවිද්‍යාලය වෙත දැන්වුවද මේ දක්වා විශ්වවිද්‍යාලය මගින් එම ණය පවරා ගැනීමට කටයුතු කර නොමැති බැවින් ඉදිරියේදී එම මුදල වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කලයුතු බව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්වීමට කටයුතු කිරීම.<br><br>9 එන් ජේ ගමගේ -001415<br>ඇගේ හිඟ ණය ශේෂය වනුයේ රු 5,000.00 කි. මෙම විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරියක් වන අතර ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත. | උසාවියේ නඩුව විභාග වෙමින් පවතී. |

| | | |
|---|---|---|
| | 10 සී සී වික්‍රමනායක -001019<br>මොහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු 66,666.52 කි. මොහු කෘෂිවිද්‍යා පීඨයේ කථිකාචාර්යවරයෙකු වන අතර ඔහු වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබූ නිසා ණය ශේෂයක් පැවතුණි. 2018 වසරේ සිට නැවත සේවයට පැමිණි බැවින් එම ණය පොළිය සමග අය වෙමින් පවතී.<br><br>11 ඒ ගලප්පත්ති -001334<br>ඔහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු 99,999.88 කි. මෙම විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරයෙක් වන අතර ඔහු මෙම විශ්වවිද්‍යාලයේ සේවයෙන් නිදහස් වී පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත සේවයට ගොස් ඇත. ඔහුගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත.<br><br>12 ජේ ලක්ෂ්මන් -001390<br>ඔහුගේ හිඟ ණය ශේෂය වනුයේ රු 195,833.29 කි. මෙම විශ්වවිද්‍යාලයේ ආධුනික කථිකාචාර්යවරයෙක් වන අතර ගිවිසුම් කඩ කර සේවය හැර ගොස් ඇති නිසා ඔහුගේ වැඩ තහනම් කර ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් නිදහස් කර නොමැති හෙයින් පොළිය ද සමග ණය මුදල අය කර ගැනීමට හැකියාව ඇත. | |
| ඇ) | ඉදිරියේදී මෙම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ගෙවීමට හෝ මෙම මුදල පදනම් කර ගෙන සිසුන්ට ගෙවීමට කටයුතු කරනු ලැබේ. | මේ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කොට ඉදිරිපියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| ඇ) | මෙම ශේෂය ඇතුලත් වී ඇති මුළු මුදලින් රු. 117,401/- ක මුදලක් සහ රු. 743,482.37 ක මුදල ගොඩනැගිලි ඉදිකිරීමේ දී අප විසින් පිළිවෙලින් චන්ද්‍රකාන්ති ඉදිකිරීම්කරුවෝ වෙත සහ සුමනසේකර කොන්ත්‍රාත්කරුවෝ වෙත ගෙවිය යුතු මුදල් වන අතර මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් නඩුගොනු කර ඇති අතර අදාල නඩු අවසන් වනතෙක් | අදාල බිල්පත් සහතික කර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | අදාල මුදල් ගෙවිය නොහැක. ඉතිරි මුළු මුදල ඇතුලත් වී ඇත්තේ පිළිවෙලින් 2010 සිට 2016 දක්වා 100% ඉදිකිරීම් නිම කර ඇති දැනට භාවිතා කරන පහත ගොඩනැගිලි සඳහා අවසාන බිල්පත ඉදිරිපත් නොවීම මත ගෙවීමට නොහැකි වීමෙනි. ඉදිරියේදී අවසාන බිල්පත ඉදිරිපත් කිරීමේ දී මෙම මුදල ගෙවා නිම කල හැක.<br>කෘෂිපීඨ ගොඩනැගිලි සංකීර්ණය<br>කළමනාකරණ පීඨ ගොඩනැගිලි සංකීර්ණය<br>භූ විඥාපන පීඨ ගොඩනැගිලි සංකීර්ණය<br>ව්‍යවහාරික විද්‍යාපීඨ ගොඩනැගිලි සංකීර්ණය<br>ක්‍රීඩා පිටිය<br>පිරිමි නේවාසිකාගාරය | |
| 2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම | | |
| අ) | සමාජීය විද්‍යා හා භාෂා පීඨ ශිෂ්‍ය සභාවේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකුගේ එකඟතාවය මත නමක් යෝජනා කිරීම එම ශිෂ්‍ය සංගමයේ නිළධාරීන් විසින් කල යුතුව තිබූ නමුත් අධ්‍යයන වර්ෂය අවසන් වන තෙක් එය සිදුකොට නැත. මේ සඳහා බලපා ඇති කරුණ වන්නේ ශිෂ්‍යයන්ගේ විනය විරෝධී හැසිරීම් නිසා සමාජීය විද්‍යා හා භාෂා අධ්‍යයන පීඨ මණ්ඩලය මගින් ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර සඳහා කථිකාචාර්යවරයෙකු ඉදිරිපත් නොකිරීමට තීරණයක් ගෙන තිබීමයි. කෙසේ වුවත් ශිෂ්‍යයන් විනයානුකූලව හැසිරෙන තත්ත්වයක් තුළ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකයෙකු පත් කිරීමට ඉදිරියේ දී හැකි වනු ඇත. | ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික තනතුර පත් නොවීමට හේතු සොයා ලබා ශිෂ්‍ය සභාව ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |
| ආ)<br>(i) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 18.12.1 (I) වගන්තිය ප්‍රකාරව සේවයෙන් පහ කරනු ලැබූ හෝ පරිවාස කාලයේදී විනයානුකූල හේතු මත සේවය අවසන් කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනවලට පත් නොකිරීම සහතික කර ගැනීමට හැකිවන පරිදි එවැනි තැනැත්තන්ගේ නාම නාම | නීති රීති රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| | සුවියක් පවත්වාගෙන නොමැති අතර ඉදිරියේදී එය නිවැරදිව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සකස් කර ඇත. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2018.10.15 දින පුවත්පත් ැන්වීමක් පලකර ඇත. | |
| (ii) | 2017.12.31 වන විට අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිළධාරීන් 14 දෙනෙකු එම ගිවිසුම් උල්ලංඝනය කර තිබුණි. ඒ අතුරින් 07 දෙනෙකු අදාල මුදල් ගෙවීමට කටයුතු කර නොමැති බැවින් නීති කටයුතු කිරීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර උසාවියේ විභාග වන නඩු ද පවතී. ගිවිසුම් උල්ලංඝණය කර ඇති අනෙකුත් අය අතරින් දෙදෙනෙකු වාරික වශයෙන් ගෙවීම සිදුකර ඇත. ඒ අනුව මේ වනවිට 13,130,038.00 මුදලක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත. ඉතිරි 05 දෙනා සඳහා අදාල මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කිරීම සඳහා අවධානය යොමු කර ඇත. | නීති රීති රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම |
| (iii) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7.8 වගන්තිය ප්‍රකාරව සේවයෙන් පහ කරන ලද පුද්ගලයෙකු බන්ධනගත සම්පූර්ණ මුදල ගෙවා බේරුම් කර නැත්නම් ඔහු සේවය හැරගිය බව ප්‍රකාශ කෙරන දැන්වීම නිකුත් කර ඇති බවත් උසස් අධ්‍යාපන ආයතනයේ සේවයේ නැවත වැඩ භාරගෙන නොමැති බවත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා මහා භාණ්ඩාගාරයේ මහජන ව්‍යාපාර අංශයේ අධ්‍යක්ෂක වෙත දැන්වීම මඟින් රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල රැකියා ලබා ගැනීම වැළැක්වීමට පියවර ගත යුතු බව දක්වා ඇතත් උක්ත අවස්ථාවේ දී එසේ ක්‍රියා කර නොමැත. කෙසේ නමුත් 24.03.2014 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 03/2014 විසින් බන්ධන හා ගිවිසුම් කඩ කළ අධ්‍යයන කාර්ය මණ්ඩල භවතුන්ට නැවත විශ්වවිද්‍යාලීය අධ්‍යයන කාර්ය මණ්ඩල පත්වීම් ලබා ගැනීමට අවස්ථාව සලසාලූ බැවින් එපරිදි ඔහු විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පත්වීමක් ලබා ගැනීමට ඉඩ තිබුණි. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත දැන්වීමක් යැවීමට කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| (iv) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව සේවයේ නියුක්ත සේවකයින් පැමිණෙන වේලාව සහ පිටවීම සටහන් කල යුතු බව සඳහන් වුවද ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ආරම්භයේ සිට මේ දක්වා මේ දක්වා එවැන්නක් සිදුකර නොමැති අතර සෙසු විශ්වවිද්‍යාල වල ද එවැන්නක් පවත්වාගෙන යන බවට වාර්තා නොවේ. විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයට සිය අධ්‍යයන කටයුතු නිදහස් ලෙසත් ඊට සුදුසු වටපිටාවකත් පවත්වාගෙන යාමට අවස්ථාව තිබීම අත්‍යාවශ්‍යය. එමෙන්ම ආචාර්යවරුන් දවසේ ඕනෑම වේලාවක මෙන් ම සති අන්ත හා රජයේ අනුමත නිවාඩු දිනයන්හි දී පවා සේවයට වාර්තා කරනු ලබයි. ඉගැන්වීම් කටයුතු වලට අතිරේක වශයෙන් අධ්‍යයන පර්යේෂණ, ආයතනයෙන් පරිබාහිර සිදුකරන පර්යේෂණ, රාජ්‍ය ප්‍රතිපත්ති හා රටේ සංවර්ධනයට දායක වන සෙසු කටයුතු වල නිරත වීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මන්ත්‍රණ වලට සහභාගි වීම, ජාතික වශයෙන් වැදගත්කමක් ඇති විභාග කටයුතු වල දී ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, උත්තර පත්‍ර ඇගයීම මෙන් ම ප්‍රජාවගේ සංවර්ධනය වෙනුවෙන් දායක වීම වැනි කටයුතු වලද ආචාර්යවරුන් ස්වකීය සේවා ස්ථානයෙන් පරිබාහිරව නිරත වේ. අධ්‍යන කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා අතිකාල දීමනා, නිවාඩු දින දීමනා හෝ ඊට සමගාමී වෙනත් එවැනි ප්‍රතිලාභයන් නොගෙවන අතර ස්වකීය නිදහස් මානසිකත්වය තුළ ආචාර්යවරුන් ජාතික සංවර්ධනයට උරදීම ද ආචාර්යවරුන් සතු වගකීමකි. විශ්වවිද්‍යාලයේ දේශන, ප්‍රායෝගික පරීක්ෂණ, විභාග, අඛණ්ඩ ඇගයීම් වැනි කටයුතු සඳහා දෛනික වාර්තා සටහන් පොත් (Lecture Record Book) සෑම දෙපාර්තමේන්තුවකම තබා ඇති අතර එහි දෛනික සටහන් හා අත්සන් තැබීම සිදුවන බවද වැඩිදුරටත් දන්වමි. | නීති රීති රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම. |
| (ඇ) | මේ සඳහා පැහැදිලි උපලේඛණ පවතින අතර වර්ෂ 05කට වැඩි හිමිකම් නොපෑ මෙම තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව පාලක සභාවේ අනුමැතියට යටත්ව නියාදනය කිරීමට කටයුතු කිරීම. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත නියාදනය කිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | එලදායීතා ලේකම් කාර්යාලය මගින් සම්පත් දායකයෙකු ගෙන්වා උක්ත කාර්යය නිසියාකාරව සිදුකිරීම සම්බන්ධව වැඩමුලුවක් දැනටමත් පවත්වා අවසන් කර ඇති අතර අදාල මෙහෙයුම් අත්පොත් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | නීති රීති රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම. |
| (3) මූල්‍ය සමාලෝචනය | | |
| 3.1 මූල්‍ය ප්‍රතිඵල | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. | විශ්වවිද්‍යාලයේ පරිපාලනයෙන් තොරව රාජ්‍ය ප්‍රතිපත්ති මත සේවක පාරිශ්‍රමික වැඩිවීම් දීමනා වැඩිවීම හා පොදු මිල මට්ටමේ වන උච්ඡාවචන මත වැඩි වන වියදම් හැර අනෙකුත් වියදම් හැර අනෙකුත් වියදම් මනා පාලනයෙන් යුක්තව වියදම් කිරීමට කටයුතු කිරීම. |
| 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. | |
| 4. මෙහෙයුම් සමාලෝචනය | | |
| 4.1 කාර්යසාධනය | | |
| 4.1.1 සැලසුම් කිරීම | 2017 වර්ෂය සඳහා මූල්‍ය අංශය නියෝජනය වන පරිදි පමණක් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. | 2018 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති අතර පළමු මාස 06 සඳහා කාර්යය සාධන වාරර්තාව පිළියෙල |

| | | |
|---|---|---|
| | | කර ඇත. 2019 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරමින් පවතින අතර එය අවසන් අදියරේ පවතී. |
| 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය | | |
| අ) | එක් එක් පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ සහ පුරප්පාඩු පිරවීමේ කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලබන අතර එසේ තෝරාපත් කර එවනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලියාපදිංචි කිරීම සහ ඊට අදාල කටයුතු පමණක් විශ්වවිද්‍යාලය මඟින් සිදු කරනු ලබයි. එම නිසා ලියාපදිංචි වීමට හෝ නොවීමට ගනු ලබන තීරණය අදාල ශිෂ්‍යාවන් බැවින් එය විශ්වවිද්‍යාල පාලනයෙන් බැහැර වන්නකි. | |
| ආ) | විශ්වවිද්‍යාලයට ඇතුලත් වන සියලුම සිසුන් ඒ ආකාරයෙන්ම විශ්වවිද්‍යාලයෙන් පිට නොවීම සඳහා උපාධි හැරයාම, විභාග අසමත් වීම, විදෙස් ගතවීම, රැකියා අවස්ථා ලැබීම ආදී හේතූන් බලපෑ හැකිය. | |
| ඇ) | සිසුන් ලියාපදිංචි වීමෙන් පසු ඔවුන්ගේ යම්යම් පෞද්ගලික හේතූන් මත උපාධි පාඨමාලා හැර යයි. ඒ අතර ළමුන් විදෙස් ගතවීම, වෙනත් රැකියාවන් තෝරා ගැනීම ආදිවූ විශ්වවිද්‍යාල පරිපාලනයෙන් බැහැර හේතූන් තිබේ. | |
| ඈ) | පාඨමාලාව සඳහා 2011 වසරේ බඳවා ගත් සිසුන්හට 2012 පළමු වසර සම්මන්ත්‍රණය පවත්වා පළමු වසර විභාගය 2013ද, 2014 දෙවන වසර සම්මන්ත්‍රණය පවත්වා දෙවන වසර විභාගය 2015ද, 2016 තෙවන වසර සම්මන්ත්‍රණය පවත්වා දෙවන වසර විභාගය 2017ද පවත්වා අවසන් කර ඇත.<br>මෙම පාඨමාලාව සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීමේදී මෙම විශ්වවිද්‍යාලයේ දැනට නොමැති විෂයන් වන ජනසන්නිවේදනය හා දර්ශනය යන විෂයන් සඳහා වෙනත් | 2018 නොවැම්බර් මස 10 වන දින පුනරීක්ෂන ආරම්භ කර ඇති අතර 2018.12.02 එය අවසන් වනු ඇත. එයට අමතරව තව එක් පුනරීක්ෂනයක් කැඳවීමට අපේක්ෂා |

| | | |
|---|---|---|
| | විශ්වවිද්‍යාලවල කථිකාචාර්යවරුන් ගෙන්වා ගැනිමට සිදුවී ඇති අතර අදාල කාලය තුල ඔවුන් විදේශගතවී සිටි බැවින් සම්මන්ත්‍රණ පැවැත්වීමට කල් ගතවී ඇති අතර ඒ අනුව විභාග පැවැත්වීමටද කල් ගතවී ඇත. එහෙත් මේ වනවිට 2017 ජූලි මස පැවැත් වු විභාගවල ප්‍රතිඵල නිකුත් කර ඇත. ඉහත පාඨමාලාවේ 2011 වර්ෂයේ බඳවා ගත් සිසුන් 185ක කණ්ඩායමෙන් සිසුන් 101ක් පමණක් අවසන් වසර විභාගය සඳහා පෙනී සිටීමට හේතුව වී ඇත්තේ පාඨමාලා අතහැර යාමට සිසුන්ගේ පෞද්ගලික අභිමතයන්වීමත්, විදේශගතවීම්, පළමු වසර හා දෙවන වසර විභාග අසමත්වීම්, දුරස්ථභාවය පිළිබඳ ගැටලු ආදී කාරණාද බලපාන බව සඳහන් කරමි. | කරන බවද, ඉන් අනතුරුව මෙම උපාධි පාඨමාලාව අවසන් වනු ඇත. |
| ඉ) | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපාන ලදි<br>1 වසර තුලදී අධ්‍යයන සහ අනධ්‍යයන සේවක වැටුප් විඩිවීම නිසා සේවක පාරිශ්‍රමික වැඩිවීම<br>2 නව දෙපාර්තමේන්තු වැඩිවීම සමග එකී දෙපාර්තමේන්තුවල පුනරාවර්තන වියදම වැඩිවීම<br>3 නව ගොඩනැගිලි ඉදිවීමෙන් හා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම මත ප්‍රාග්ධන භාණ්ඩ වල නඩත්තු වියදම ඉහල යෑම සහ ඒ හා සමානව CIය වියදම ඉහලයාම<br>4 පොදු මිල මට්ටම ඉහලයාම මත මෙම වැඩිවීම | විශ්වවිද්‍යාලයේ පරිපාලනයෙන් තොරව රාජ්‍ය ප්‍රතිපත්ති මත සේවක පාරිශ්‍රමික වැඩිවීම් දීමනා වැඩිවීම හා පොදු මිල මට්ටමේ වන උච්ඡාවචන මත වැඩි වන වියදම් හැර අනෙකුත් වියදම් හැර අනෙකුත් වියදම් මනා පාලනයෙන් යුක්තව වියදම් කිරීමට කටයුතු කිරීම. |
| 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම් | | |
| අ) | මෙම පරිගණක මිලදී ගැනීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පාලක සභා සාමාජිකයින් දෙදෙනෙක් සහ විශේෂ දැනුම ඇති පුද්ගලයෙකුගෙන් යුක්තව විමර්ශන කමිටුවක් මගින් විමර්ශනය ආරම්භ කොට විමර්ශන වාර්තාව ලැබී ඇති අතර එය පාලක සභාව වෙත ඉදිරිපත් කොට පාලක සභාවේ තීරණය මත නීත්‍යානුකූල කටයුතු කිරීමට තීරණය කොට ඇත. | පාලක සභාවේ අනුමැතිය අනුව ඉදිරි ක්‍රියා මාර්ග කරමින් පවතී. |

| | | |
|---|---|---|
| ආ) | විශ්වවිද්‍යාලයේ කසල විධිමත්ව බැහැර කිරීම සම්බන්ධ වාර්තා මධ්‍යම පරිසර අධිකාරියට යොමු කිරීමෙන් පසු මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ කටයුතු කිරීම. ඊට අමතරව විශ්වවිද්‍යාලයේ කසළ කළමනාකරණය සඳහා රුපියල් මිලියන 20ක ප්‍රතිපාදන ලබා දීමට එකඟ වී ඇත. එයට අදාළ සියලුම සක්‍යතා වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දී ඇති අතර ඉදිරි මාස කිහිපය ඇතුළත එහි කටයුතු ආරම්භ කිරීමට නියමිතය. තවද, මල අපද්‍රව්‍ය බලංගොඩ නගර සභාවට යැවීමට කටයුතු කරනු ලැබේ. | මල අපද්‍රව්‍ය බලංගොඩ නගර සභාවට යැවීමට එකඟ වී ඇති බැවින් ඒ අනුව කටයුතු සිදු කරමින් පවතී. |
| ඇ) | මේ සම්බන්ධයෙන් බදුල්ල අධිකරණයේ නඩුවක් ගොනුකර ඇති අතර එම නඩුව අවසන් වන තෙක් අදාල මුදල් අය කර ගැනීමට නොහැක. | අදාල අධිකරණ තීන්දුව කඩිනමින් ලබා ගැනීමට කටයුතු කිරීම. |
| 4.3 අරමුදල් ඌණ උපයෝජනය | මෙම අරමුදල් හතර සම්බන්ධයෙන් පැහැදිලිව ලිපිගොනු නඩත්තු කර ඇති අතර මෙම අරමුදල් ලැබූ නිශ්චිත පරමාර්ථ එහි පැහැදිලිව දක්වා ඇත. මෙම පරමාර්ථ වලින් වලින් පරිබාහිරව මෙම අරමුදල උපයෝජනය කල නොහැකි අතර මෙම අරමුදල් එම කාර්යය සඳහා දැනට උපයෝජනය නොකරන බැවින් විශ්වවිද්‍යාල අරමුදලට බැර කර අවශ්‍ය අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීමට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් නිසි පියවර ගැනීමට කටයුතු කිරීම |
| 4.4 නිශ්ක්‍රිය හෝ ඌණ උපයෝජිත වත්කම් | | |
| අ) | පිටත පුහුණු ඒකකය ආරම්භ කිරීමේ දුෂ්කරතා මත ව්‍යාපෘතිය අවලංගු කර ඇත. මෙහි සඳහන් භාණ්ඩ, උපකරණ හා පොත්පත් ශාරීරික අධ්‍යාපන අංශයට හා පුස්තකාලයට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපකුලපතිතුමන් විසින් මේ වනවිටත් අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු දිසු කරමින් පවතී. |
| ආ) | මෙය **IRQUE** ව්‍යාපෘතිය යටතේ කෘෂි විද්‍යා පීඨය වෙත ලබාදෙන ලද්දකි. එහෙත් එය නඩත්තු කිරීමට මේ වනවිට කෘෂි විද්‍යා පීඨය අසමත් නිසාත් **IRQUE** අවසන් නිසාත් මෙම දේපළ විශ්වවිද්‍යාලය වෙත පවරාගෙන තත්ත්ව වාර්තාවක් ලබාගෙන ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමත් අවශ්‍ය නඩත්තු කටයුතු කිරීමට තීරණය කර තිබේ. | මෙම දේපළ කෘෂි විද්‍යා පීඨය මඟින් විශ්ව විද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම |

| | | |
|---|---|---|
| ඇ) | මෙය කාර්යය මණ්ඩලයට හා ප්‍රතිකාර ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවද ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි පවත්වා ගෙන යාමට තීරණය කරන ලදී. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 4.5 කාර්යමණ්ඩල පරිපාලනය | | |
| අ) | 2017 වර්ෂයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් තනතුරු පුරප්පාඩු සඳහා පිරිස් ප්‍රතිපාදන ලබා දී නොමැත. ඒ අනුව බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වුවද 2018 වර්ෂයේ අදාල බඳවා ගැනීම් මේ වනවිට පහත පරිදි සිදු කරන ලදී.<br>ස්ථිර මහාචාර්ය තනතුරු හා කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් 27ක් පමණද, තාවකාලික කථිකාචාර්ය තනතුරු සඳහා බඳවා ගැනීම් 23ක් පමණද මේ වනවිට සිදුකර ඇත. තවද, අනෙකුත් තාාවකාලික අධ්‍යයන කාර්යය මණ්ඩල තනතුරුවලද බඳවා ගැනීම් මේ වනවිට සිදු කරමින් පැවතුනද වෙනත් රැකියා අවස්ථාවන් සඳහා යොමු වීම, විදේශගත වීම ආදී වු හේතූන් මත තවදුරටත් පුරප්පාඩු ඇති විය හැක.<br>ඒ අනුව 2019.01.25 වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 91 දක්වා අඩු වී ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම |
| ආ) | මෙම පරිපාලන තනතුරු පුරප්පාඩු සඳහා මේ වනවිට නිලධාරීන් 17 දෙනෙකු බඳවා ගෙන ඇති අතර අධ්‍යයන සහාය කාර්යය මණ්ඩල තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ඇත.<br>අනධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු පිරවීමට පුරප්පාඩු පවතින එක් එක් තනතුරු සඳහා නියමිත බඳවා ගැනීමේ පටිපාටියන්ට අනුකූලව අදාලව කටයුතු සිදු කර තිබූ නමුත් පහත සඳහන් කරුණු හේතුවෙන් පුරප්පාඩු පිරවීමට ප්‍රමාද විය.<br>• අවස්ථා තුනකදී අමාත්‍යාංශ හා අමාත්‍යවරුන් වෙනස් වීම මත සිදුවු ප්‍රමාදය<br>• භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබාදීම සඳහා ගතවූ ප්‍රමාදය | පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| | • මූලා‍ය ප්‍රතිපාදන වල හිඟය<br>• මැතිවරණ කොමිෂන් සභාවේ LAE/2018/4B හා 2017.11.28 දිනැති ලිපියට අනුව බඳවා ගැනීම් අත්හිටුවීමට උපදෙස් ලැබීම.<br>කෙසේ වුව ද 2018.01.02 දින මහජන සෞඛ්‍ය පරීක්ෂක (වැඩ පැවරුම් පදනම මත) එක් අයෙක් විදුලි කාර්මිකයෙකු සහ පැස්සුම්කරුවෙකු ද 2018.03.05 වැනි දින වැඩ සහයක තනතුරු 26ක් සහ සනීපාරක්ෂක තනතුරක් සඳහා සේවකයින් බඳවා ගෙන ඇත. එයින් වැඩ සහයකයින් 24 ක් වැඩ බාරගෙන ඇත. ඒ අනුව 2019.01.24 වනවිට අනධ්‍යයන තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 132 දක්වා අඩු වී ඇත.<br>අතිකාල දීමනා වැඩිවීමට 17/2016 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව සිදුවූ වැටුප් වැඩිවීම හේතුවී ඇත. | |
| ඇ) | විගණකාධිපති වාර්තාවේ අදාල ඡේදය සමඟ එකඟ වේ. රාජ්‍ය ප්‍රතිපත්ති මත අධ්‍යයන සහ අනධ්‍යයන සේවකයින්ගේ මූලික වැටුප සහ ඒ හා සමාන දීමනා වැඩිවීම මත මෙම වැඩි වීම සිදු වී ඇත. | |
| 5. තිරසර සංවර්ධනය | | |
| 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම | උක්ත කාර්ය සම්බන්ධව සනාතන සහා සාමාජිකයින් ඇතුළු අදාල අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ඉදිරියේ දී ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | විශ්වවිද්‍යාලයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක වලට ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කිරීම. 2019 පළමුවන කාර්තුවේදී මෙම කටයුතු නිම කිරීමට උපදෙස් ලබාදී ඇත. |

| | | |
|---|---|---|
| 6 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය | | |
| 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම | සබරගමුව විශ්වවිද්‍යාලයේ මුදල් අංශයේ මෙසේ ගිණුම් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීමට පහත හේතු මූලිකව බලපාන ලදී.<br>1 2018 පෙබරවාරි මස අග සිට අප්‍රේල් මැද දක්වා පැවති සේවක වැඩ වර්ජනය<br>2 මුදල් අංශයේ පහත සඳහන් මූල්‍යාධිකාරීන්ගේ පුරප්පාඩු පුරවා නොතිබීම හේතුවෙන් මූල්‍ය නිලධාරී හිඟය.<br>I. නියෝජ්‍ය මූල්‍යාධිකාරී<br>II. සහකාර මූල්‍යාධිකාරීන් දෙදෙනෙකු හිඟව පැවතීම<br>III. මේ අතරින්ද සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරියක් 2018 ජනවාරි මැද සිට සහ සහකාර මූල්‍යාධිකාරීවරියක් 2018 ජනවාරි අග සිට ප්‍රසූති නිවාඩු ලබාගැනීම.<br>මීට අතිරේකව අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගිණුම්වලට සම්බන්ධිත කළමණාකරණ සහායක (කළමණාකරණ සහකාර/පොත් තබන්නා) තනතුරු දෙකක් පිරවීමට නොහැකිවීම. | මෙම දුර්වලතා මඟහැර ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන නියමිත කාලයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත. |
| 6.2 අභ්‍යන්තර විගණනය | විශ්වවිද්‍යාලයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයා උසස් වීමක් ලැබ වෙනත් විශ්වවිද්‍යාලයකට සේවය සඳහා ගොස් ඇත. උක්ත පුරප්පාඩුව පිරවීමට අවස්ථා කිහිපයකදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර ඇත. තාවකාලික පිළියමක් ලෙස රුහුණු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයාගේ සේවය පැවරුම් පදනම මත ලබා ගැනීමට ක්‍රියාකලත් පසුව එම උත්සාහය ව්‍යර්ථවිය. 2018 ජූලි මස සිට කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්ත විගණකවරයා සතියකට දිනක් සේවය සැපයීමේ පදනම මත මෙම විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක කාර්යයන් ඉටු කිරීම ආරම්භ කර ඇත. අවශ්‍ය අවස්ථාවලදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයාගේ සහාය ලබාගෙන කටයුතු කරන ලදී.<br>2018.10.15 දින සිට සහකාර අභ්‍යන්තර විගණකවරියක් එම අංශයේ කටයුතු කරයි.<br>විගණන සහායක තනතුරු 02 පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටියි. | කාර්ය මණ්ඩල කඩිනමින් බඳවා ගෙන අභ්‍යන්තර විගණන අංශය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කිරීම |

| | | |
|---|---|---|
| 6.3 විගණන කමිටු | උක්ත සඳහන් කල කරුණු ඒ සඳහා බලපා ඇත. කෙසේ වුවත් 2018 වර්ෂය සඳහා විගණන හා කලමනාකරණ කමිටු පළමු රැස්වීම 2018.07.20 දිනද, දෙවන රැස්වීම 2018.11.09 වන දිනද, තෙවන රැස්වීම 2018.11.23 දිනද, සිව්වන රැස්වීම 2018.12.21 දිනද පවත්වා ඇත. | ඉදිරියේදී විගණන කමිටු පැවැත්වීමට කටයුතු කිරීම |
| 6.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | | |
| 6.4.1 ප්‍රසම්පාදනය | | |
| අ) | විගණන ඡේදයේ සඳහන් කරන ලද ආකාරයට ප්‍රසම්පාදන ක්‍රියාවලියෙහි සාමාන්‍ය කාල ප්‍රමාදයක් සිදු වී ඇත. ඒ සඳහා පහත හේතු බලපාන ලදී.<br>• සැපයුම් අංශයේ සේවක පුරප්පාඩු (4 ක්) පැවතීම<br>• ඒ අනුව ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබීම<br>• මෙම කාලය තුල පැවති සේවක වැඩ වර්ජනය<br>• තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කිරිමට මාස 03කට ආසන්න කාලයක් ගත වී තිබීම<br>මේ සම්බන්ධයෙන් යථාකාලයේදී ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන නියාමනය කිරීමට අභ්‍යන්තර විධිවිධාන යොදනු ලැබේ. | |
| ආ) | අපේක්ෂා කරන ලද මුදල් ප්‍රමාණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා නොදීම නිසා ප්‍රසම්පාදන සැලැස්මේ සංශෝධනයන් සිදුකර අත්‍යාවශ්‍ය නොවන ප්‍රසම්පාදන කපාහැර මෙම මිලදී ගැනීම් සිදුකර ඇත. | |
| ඇ) | මේ සම්බන්ධයෙන් අදාල සමාගමට රු. 1,888,300ක මුදලක් ගෙවා නොමැත. මෙම සමාගමට ගෙවා ඇත්තේ රු. 680,800.00ක් පමණි. මේ සම්බන්ධයෙන් පීඨවලින් සිදුවී ඇති ප්‍රමාදය පිළිබඳව සොයා බලා අවශ්‍ය විධිවිධාන යෙදීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| 6.4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු | | |
| අ) | ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා ගෘහ භාණ්ඩ සැපයීමේ ප්‍රමාදයක් සිදු වී නොමැති අතර ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිවනතෙක් අදාල ගෘහ භාණ්ඩ අප විසින් සැපයුම් කරුවන්ට සැපයීම නොකරන ලෙස දන්වා තිබුණි. අදාල ගෘහ භාණ්ඩ ශිෂ්‍ය | |

| | | |
|---|---|---|
| | නේවාසිකාගාරය ඉදිකිරීමට පෙර අප විසින් ලබා ගත්තේ නම් එම ගෘහ භාණ්ඩ සවිකිරීම සහ ශිෂ්‍ය නේවාසිකාගාරය වෙත ප්‍රවාහනය කිරීමට අමතරව පිරිවැයක් විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවේ. එබැවින් විශ්වවිද්‍යාලය මගින් භාණ්ඩ ලබාගැනීම ප්‍රමාද කරන ලද ගෘහ භාණ්ඩ සඳහා ප්‍රමාද පොලියක් අය කර ගැනීමට නොහැක. අනෙක් අතට මහා භාණ්ඩාගාරයෙන් අප ඉල්ලුම් කරන ප්‍රතිපාදන නියමිත වෙලාවට නොලැබීම මත භාණ්ඩ සැපයුම් කරුවන්ට ගෙවීම් කරනුයේ නියමිත කාලසීමාව ඉකුත් වූ විට වේ. අප විසින් ප්‍රමාද කුලියක් අය කලහොත් සැපයුම්කරුවන්ද ගෙවීම් ප්‍රමාද වීම මත ප්‍රමාද කුලියක් අයකරනු ඇත. මෙය විශ්වවිද්‍යාලයට අමතර පිරිවැයක් වේ. ...<br><br>පරිගනක උපාංග සැපයීම් සම්බන්ධයෙන් කාල ප්‍රමාදයක් සිදුවී නොමැත. විස්තර පහත පරිදි වේ.<br><br>ප්‍රසම්පාදන සැලැස්මට අදාල උක්ත පරිගණක මිළදී ගැනීම පිණිස පිරිවිතර 2016 ජූනි 30 දින සැපයුම් අංශය වෙත ලැබී ඇති අතර භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2016 ජූලි මස 13 වන දින පුවත්පත් දැන්වීම පල කර ඇත. එහි විවෘත කිරීමේ දිනය 2016 අගෝස්තු 02 වුවද මෙම කාලය තුල පැවති සේවක වැඩ වර්ජනය හේතුවෙන් එහි විවෘත කිරීමේ දිනය අගෝස්තු මස 22 වන දින දක්වා කල් දැමීමට සිදුවිය. එමෙන්ම මෙම ලිපිගොනුවේ අයිතම 46 ක් ඇතුලත් කර තිබූ අතර තාCIණික ඇගයීම් කමිටු වාර්තාව සකස් කිරීමට මාස 03කට ආසන්න කාලයක් ගත වී ඇත. ඔබ විසින් පෙන්වා දෙන ආකාරයට භාණ්ඩ සැපයුම් කිරීමට සති 01 සිට සති 11 දක්වා ප්‍රමාදයක් සිදු වී නැත. අදාල ඇණවුම් අප විසින් නිකුත් කර ඇත්තේ 2017 මැයි මස 18 වන දින වන අතර භාණ්ඩ සැපයුම් කිරීම සඳහා දින 30 ක කාලයක් ලබා දී ඇත. සැපයුම්කරු විසින් අදාල භාණ්ඩ විශ්වවිද්‍යාලය වෙත ගෙනවිත් බාර දී ඇත්තේ 2018 ජූලි මස 13 වන දින දීය. ඒ අනුව ප්‍රමාදය සිදුවී ඇත්තේ දින 25ක් පමණි. ඔබ විසින් විගණන විමසුම සඳහා උපයෝගී කර ගෙන ඇත්තේ භාණ්ඩ නිකුත් කිරීමේ පත්‍රිකාව නිකුත් කල දිනය වේ. අදාල භාණ්ඩ නිකුත් කිරීමේ පත්‍රිකා අප විසින් නිකුත් කරනුයේ අදාල භාණ්ඩ පරික්ෂා කිරීමෙන් පසුව වන අතර මෙම දිනය භාණ්ඩ ලැබුණු දිනය ලෙස සැලකීම යෝග්‍ය නොවේ. ... | |

| | | |
|---|---|---|
| ආ) | විගණක විසින් පෙන්වා දී ඇති කරුනු සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. ඉදිරියේදී අනුමත රේට අනුව ඇස්තමේන්තු සකස් කිරීමට අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කිරීම. | යථාකාලයේදී මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| 6.5 අයවැය පාලනය | සබරගමුව විශ්ව විද්‍යාලයේ ස්වයං ආදායම් උත්පාදිත පාඨමාලා මෙහෙයවනු ලබන්නේ විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය සහ මෑතදී ආරම්භ කල පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟිනි. මෙම ආයතන දෙකම වෙනත් පාලන අධිකාරියක් මඟින් පාලනය කරනු ලබන අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 4/2016 යටතේ ක්‍රියාත්මක වේ. එබැවින් රාජ්‍ය භාණ්ඩාගාර අයවැය ලේඛණය සඳහා උපයෝගී කරගනු නොලැබේ. | |
| 6.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම | 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018.09.06 වන දින සභාගත කර ඇත. | |
| 6.7 නොවිසඳී ඇති විගණන ඡේද | | |
| අ) | මෙයට අදාල සියලුම ප්‍රමිතකරණ කටයුතු සිදු කර බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය. | අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |
| ආ) | උක්ත ක්‍රීඩා පිටිය ඉදිකළ රාජ්‍ය ආයතනය සමග මේ වන විට අදාල කර්තව්‍ය නිවැරදි කර ගැනීම සඳහා සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇති අතර ඔවුන් යම්යම් නිර්දේශද ඉදිරිපත් කර ඇත. ඒ අනුව ප්‍රායෝගික විසඳුමක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. | රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩාපිටිය පිළිසකර කිරීමට කටයුතු කිරීම. |
| 7 පද්ධති හා පාලනයන්<br>අ)<br>ආ)<br>ඇ)<br>ඈ)<br>ඉ) | විගණනය විසින් පෙන්වා දෙන අඩුපාඩු සාකච්ඡා කොට අදාල අංශ වල අවධානය යොමු කර අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. |

මහාචාර්ය එම්. සුනිල් ශාන්ත

උපකුලපති